... PERERA & SON,
BOOK BINDERS.
Vidy... Book Depot.
30, 31 Dam Street,
COLOMBO.

"ක්ෂමායතනං ඵලං පුංසාං"

කල්‍යාණීවංශ ධම්මරතන

රත්කොත්වෙහෙර
පානදුරේ

24
19

| පොත් පවුත | පොත් පවුත |
| --- | --- |
| පානදුරේ වාදය | සුගත විදත්ම විධානය |
| විභජ්ජ වාදය | සාධු ජනප්‍රසාදනී |
| මිසදිටුවන්ට පිළිතුර | සත්‍යානී දීපනිය |
| නමස්කාර වාද විදුරණය | සීමාලංකාර සංග්‍රහය |
| කතදුවේ රාමසඳ වාදය | අභිමාන මණ්ඩලය |
| රාමසඳුදුනී කිසිඹි විදුරණය | අභිමාන විනිශ්චය |
| කඨින වාදය | අභිමාන සංග්‍රහව |
| අබිමංස භේදය | අභිමාන දීපනීය |
| විමති ඡේදනය | කාපෙස පුඩු විනිශ්චය |
| අධිකරණ විවාදය | අධිකරණ විචාර සඞ්ගහෝ |
| දුශ්ශීල දානාදි විනිශ්චය | කතිකාවත |
| එම දෙවන කොටස | පුරාණ කතිකාවත් |
| දුශ්ශීල සංග්‍රහ භේදය | විනයාලංකාරවූයෙම් ආ විහාර විනිශ්චය සංක්ෂේපය |
| සාධුපඤ්ච පූරණී | විපරීතයෝ ඒධි මර්ධනය |
| ශ්‍රී සද්ධර්ම දූතයාට පිළිතුරු සඟ බත භේදම | එක් ප්‍රකාශය |
| සුජන ප්‍රසාදය | රාලහාමි ජාතකය. |
| සමෝහ හානසනී | |
| සාරූපසාගත | |

# පාණදුරේ වාදය

වාගීශ්වර මොහොට්ටිවත්තේ ගුණානන්ද
සාමින්වහන්සේ සහ
දවිත් ද සිල්වා පාදිලිඋන්නාන්සෙ

අ ත ර

බෞද්ධ ක්‍රිස්තියානි යන ආගම්දෙක පිළිබඳවූ
1873 අගෝස්තු මස 26 වෙනි 28 වෙනි දෙදින කරන්ට
යෙදුන විචිත්‍රාලඞ්කාර

# විශාල වාදය.

මො. ගුණානන්ද සාමීන් ආදි උතුමන් සිහිපත්වීම පිළිබඳ
කෘත්‍යසාධක සමිතියේ ලේකම්වරු වන
**පී. ඒ. පීරිස් සහ පී. ජේ. දියෙස්**

—විසින්—

කොළඹ ශ්‍රීලඞ්කෝදය යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවනලදී.

**1903.**

# පාණදුරේ වාදය.

වාගීශ්වර මොහොට්ටිවත්තේ ගුණානන්ද

සාමින්වහන්සේ සහ

දාවිත් ද සිල්වා පාදිලිඋන්නාන්සේ

—අතර—

බෞද්ධ ක්‍රිස්තියානි යන ආගම්දෙක පිළිබඳවූ

1873 අගොස්තු මස 26 වෙනි 28 වෙනි දෙදින කරන්ට

යෙදුන විචිත්‍රාලඞ්කාර

# විශාල වාදය.

මො. ගුණානන්ද සාමීන් ආදී උතුමන් සිහිපත්වීම පිළිබඳ

කෘත්‍යසාධක සමිතියේ ලේකම්වරු වන

පී. ඒ. පීරිස් සහ පී. ජේ. දියෙස්

—විසින්—

කොළඹ ශ්‍රීලඞ්කෝදය යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදී.

1903.

( දෙවෙනි වරට පිටපත් 2000. )

# සංඥාපනය.

බෞද්ධ ක්‍රිස්තියානි යන ආගම්දෙක පිළිබඳවූ වාගීශ්වර මොහොට්ටිවත්තේ ගුණානන්ද සාමීන්වහන්සේසහ දාවිත් ද සිල්වා පාද්‍රිඋන්නාන්සේ අතර 1873 අගෝස්තු මස 26 වෙනි 28 වෙනි දෙදින පානදුරේදී කරන්ට යෙදුනු විචිත්‍රාලඞ්කාර විශාල විවාදයේ සම්පූර්ණ අදහස මෙහි අන්තර්ගත වේ. “සිලෝන් ටයිම්ස්” නම් ප්‍රවෘත්ති පත්‍රයේ කර්තෘභූත ජෝන් කැපර් මහත්මයා විසින් මෙම විවාදයේ සම්පූර්ණ භාවය විවාදයකළ වේලාවන්හිදීම උගත් ඇඩ්වඩ් පෙරේරා මහත්මයා ලවා ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනයකරවාගෙණ පිට පත් දහස්ගණනක් මුද්‍රණයකරවා ප්‍රසිද්ධකරණලදී. “මේ විවාදය ඉංග්‍රීසි භාෂාවට පිටපත්කරණුලැබූ ක්‍රිස්තුලබ්ධික ඇඩ්වඩ් පෙරේරා මහත්මයා සහ එය ප්‍රසිද්ධකරවන්ට යෙදුනු ජෝන් කැපර් මහත්මයාත් අගතිගාමී නොව සාධාරණලෙස සියයුතුකම් ඉෂ්ටකළෝය” යි පළමුවෙනිවර මුද්‍රණයකර තිබෙන සිංහල පිටපත්වල සඳහන්කරණලද “මුඛහෘදයෙන්” යුත් ස්තුතියමකිරීමට අපිදූ මසුරුනොවෙමු.

කැපර් මහත්මයා විසින් ප්‍රසිද්ධකරණලද එම පොතක් අමරිකා දේශිකයෙක්වූ පණ්ඩිතාචාර්ය පීබල් මහත්මයාට ගාල්ලේදී දකින්ට ලැබී එය සියරටට ගෙණගොස් මෙම විවාදයෙන් ක්‍රිස්තුලබ්ධියේ නානාකාර මිථ්‍යාස්වභාව බෞද්ධ පක්ෂය විසින් මොනවට එළිදරව්කරණලද බව හා සම්බුද්ධසමයේ ඒකාන්ත සෘජු සත්‍යතාව පෙන්වා ධාර්මික පරිද්දෙන් ජයශ්‍රීග්‍රහණය කරණලද බවත් ප්‍රකාශකරමින් අගතිරහිත විනිශ්චයක්කොට අමරිකා දේශිකයන් අතර එම පිටපත් දහස්ගණනක් මුද්‍රණයකර විසුරුවාහැර තිබේ. එම විනිශ්චය සහිත පොත් කර්නල් එච්. ඇස්. ඕල්කොට් මැඩම් බ්ලවැස්කි ආදි උත්තම උත්තමියන්ට දකින්ට ලැබී එතුමෝද මෙම විවාදයකළ ප්‍රවර ජයභූමිය දර්ශනයකිරීම විශේෂ කරුණක්කොට සිත්හී තබාගෙණ 1880 වේ අවුරුද්දේදී එහි පැමිණ එම ජයභූමිය සම්බන්ධව ගුණාශිං සහ වාක්‍යගුප්තසහිත උද්ඝෝෂනයකරන්ට යෙදුනාඇත. ඕල්කොට් ආදි උතුමන්ගේ ලබ්ධාන්තරණය හේතුකොටගෙණ සිංහලීක බෞද්ධලබ්ධිකවූ මහජනයාට ස්වසමයාභිවෘද්ධිවර්ධනය උදෙසා කාලානුරූප කටයුතු කිරීම පිණිස කොළඹ ගාල්ල ආදි පළාත්වල පරම විඥනාර්ථී බෞද්ධ සමාගම් පිහිටුවීමටද, ඒ ඒ ගම්නියම්ගම්වල බෞද්ධ පාඨශාලා පිහිටුවීමටද, පෙර නොතුබුනු ධෛර්යයක් ඇතිවිය.

මෙයින් අවුරුදු 30 කින් පෙර කාලයෙහි බුද්ධසමය පිළිබඳවූ නොතිබුනාවූ ශ්‍රද්ධාධ්‍යාශයක් ලක්වැසි බෞද්ධ මහජනයා කෙරෙහි මෙකල ඇතිවීමට හා අමෙරිකාදී දෙශදෙශාන්තරයන්හි සම්බුද්ධ සමය පැතිරයාමටත් පාණදුරේ වාදය අසහාය හෙතුවූ බව කවුරුන් පිළිගන්නා සත්‍යයකි, බුද්ධාගමේ අභිවෘද්ධිය පිණිස ඒසා මහත් වාදයක් කොට අනල්පවූ උපකාරයක් කළ වාගීශ්වර මොහොට්ටිවත්තේ ගුණානන්ද සාමින්වහන්සේ සහ උන්වහන්සේට ඒ පිණිස විශෙෂ ආධාරොපකාරකළ ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන නායකස්ථවිර ස්වාමින්වහන්සේද, සාසනවංසාලඞ්කාර කවිධජ විනයාචරිය වැලිගම ශ්‍රීසුමඞ්ගලාභිධාන නායකස්ථවිර ස්වාමින්වහන්සේද, පාණදුරේ ගුණරතන තිස්සාභිධාන මහාස්ථවිරස්වාමින්වහන්සේද, ප්‍රධාන දායක මූලික මහතුන්වන කොර්නේලිස් ප්‍රෙමා කුරුණාරත්න අප්පුහාමිද, සී ජේම්ස් දියෙස් මහත්මයාද එම අශද්‍රෘශ වාදභූමියද, සිහිපත්වීමට සුදුසු යමක් කිරීම වර්තමාන කාලික බෞද්ධ මහජනයාගේ බලවත් යුතුකමකි. එබව මෙනෙහිකරණලද්දවූ මහතුන් කීපදෙනෙකුන් විසින් පසුගිය පෙබ්‍රවාරි මස 17 වෙනි දින පාණදුරේ උපාධ්‍යාය සමාගමේ පාඨශාලාවට බෞද්ධ මහජනයාගෙන් යුත් මහාසභාවක් පමුණුවාගෙණ එම සභාසම්මතයෙන් යථොක්ත වාදභූමියෙහි ගුණානන්ද සාමින්වහන්සේ උදෙසා ශිලාස්ථම්භයක් සහිත ශිලාප්‍රතිමාවක් පිහිටවීමටද, අතිකුදු නායක මහා ස්ථවිර ස්වාමින්වහන්සේලාගෙන් සහ මූලික දායක මහතුන් දෙදෙනාගෙන් ලත් ආධාරොපකාර සඳහන්කොට ශිලාලෙඛනයක් පිහිටවීමටද නියම්කරගන්නාලදී. තවද මේ සත්කෘත්‍යයන් සඳහා බෞද්ධ මහාජනයාගෙන් ලැබෙන ආධාර මුදල් නොමදවී අතිරෙක මුදලක් ඇතිවීනම් මහජනයාට ප්‍රයොජනවියයුතු පරිදි ප්‍රසිද්ධ ශාලාවක් තැනවීමටද සම්මතකර ගතිමු.

මෙම විවාද පොතෙන් පිටපත් දහස්ගණනක් 1874 රේ අවුරුද්දේ මුද්‍රණයකරවා ලක්වැසි මහජනයා අතර විසුරුවාහරණලද නමුත් වර්තමාන කාලයෙහි ඒ උවමනාවූ බොහෝදෙනෙකුන්ට සොයාගැණීම දුෂ්කරව තිබේ. එම පාඩුව පිරිමැසීමට හා කියනලද සත්කෘත්‍යයන් සඳහා වියදම්කිරීමට මහත් මුදලක් ඕනෑකරණ හෙයින් මෙම පොත් විකිනීමෙන් ලැබෙන ලාභමුදල්ද එකී මුදල් සංඛ්‍යාවට එකතුකිරීමට අදහස්කොට දෙවෙනිවර මින් පිටපත් 2000 ක් අප සමිතිය විසින් මුද්‍රණයකරවන ලද්දේය.

මෙම පොත පළමුවර මුද්‍රණයකිරීමේදී යොදාතිබෙන සංඥාපත්‍රයෙහි වාදකථාව ඇසීම පිණිස බෞද්ධලබ්ධිකයෝ හත්අට දහසක් පමණද (විවාදය අවසානවූදින දසදහසක් පමණද) ක්‍රිස්තුලබ්ධිකයෝ සියගණනක් පමණද පැමිණි බව කියාතිබේ. තවද බෞද්ධපක්ෂයට සිප්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන නායකස්ථවිර ස්වාමීන්වහන්සේද, රත්මලානේ ධම්මාලඞ්කාරාභිධාන නායකස්ථවිර ස්වාමීන්වහන්සේද, බුලත්ගම සිරිසුමනතිස්ස ස්ථවිරස්වාමීන්වහන්සේද, වැලිගම ශ්‍රීසුමඞ්ගලාභිධාන නායකස්ථවිර ස්වාමීන්වහන්සේද, වස්කඩුවේ පවරනිරුත්තිකාචරිය මහාවිභාවි සුභූති නායකස්ථවිර ස්වාමීන්වහන්සේද, පොතුවිල ඉන්දජෝති ස්ථවිරස්වාමීන්වහන්සේද, කොග්ගල සිරිසඞ්ඝතිස්ස ස්ථවිරස්වාමීන්වහන්සේද, තලාහේනේ අමරමොලි ස්ථවිරස්වාමීන්වහන්සේද, මුල්ලෙරියාවේ ගුණරතන ස්ථවිරස්වාමීන්වහන්සේද, මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන්වහන්සේද යනාදි සියක්නමක් පමණ සියම් අමරපුර දෙනිකායික ස්ථවිරස්වාමීන්වහන්සේලා පැමිණහුන් බව ප්‍රකාශකර තිබේ. ක්‍රිස්තියානි පක්ෂයේ ප්‍රධානියෝ වශයෙන් දාවිත් ද සිල්වා, ඇස්. ලන්ඩන්, ආර්. වැබ්, ඇස්. කෝල්ස්, සී. ජයසිංහ, පී. රුද්‍රිගෝ ආදි පාදිලිවරුද, සිරිමාන්න ආදි කතීසේරුවරු කීපදෙනෙක්ද, හුනුපල නිලමේද, සෙවපල් දෙස්තරතැනද, ජයසිංහ පෙරකදෝරුතැනද, සුසෙව් ද සොයිසා මුදලිතුමන් ආදි වැදගත් මහතුන්ද පැමිණසිටියෝයයි කියාතිබේ.

මේ දෙපක්ෂයෙන් බෞද්ධපක්ෂයට මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන්වහන්සේද ක්‍රිස්තියානි පක්ෂයට දාවිත් ද සිල්වා පාදිලිඋන්නාන්සේ සහ සිරිමාන්න කතීසේරුතැනත් කථාකළ බව කියාතිබෙනවා හැර කිසි කලකෝලාහලයක් නැතිව යහපත්ලෙස විවාදය කරන්ට යෙදුන බවද කියාතිබේ. 1873 අගොස්තු මස 26 වෙනි දින පූ. භා. 8—9 දක්වා දාවිත්ද සිල්වා පාදිලිඋන්නාන්සේ විසින් ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයට දෝෂාරෝපනය කිරීම් වශයෙන් හා මනුෂ්‍යයාගේ පරලොවට යන "ආත්මයක් නැතැයි උගන්වාතිබෙන බෞද්ධමතය මිථ්‍යාය"යි ප්‍රකාශකිරීම් වශයෙන්ද කරණලද කථාවට පූ. භා. 9—10 දක්වා මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන්වහන්සේ විසින් පිළිතුරුදී යලි ක්‍රිස්තියානින්ගේ දෙවියෝ (යෙහෝවාවහන්සේ) ජීෂ්ඨාවන්තනවූද, දිව්‍යඥා[illegible]ාවූද, සියලු බලය නැත්තාවූද, හාසුඑවූද, පිළිකුල්කල යුතු ද්‍රව්‍යයන්හි ගිජුවූද කෙනෙක් බව හේතුසහිතව පෙන්වා කථාවක් කරණලදී. අගොස්තු මස 26 වෙනි දිනම

අ. භා. 3—4 දක්වා දුවිත්ද සිල්වා පාදිලිඋන්නාන්සේ ගුණානන්ද ස්වාමින්වහන්සේගේ කථාවේ කරුණු කීපයකට ප්‍රත්‍යුත්තර මය යෙන් කථාවක් කිරීම සහ ප්‍රතීත්‍යසමුද්පන්න ධර්මය සම්බන්ධව තම මුලාවූ අදහස්ම නැවතත් ගෙණහැරපා කථාකිරීමද; 4—5 දක්වා ගුණානන්ද ස්වාමින්වහන්සේ විසින් තම පලමුවෙනි පැයේදී Jelous God යන වචනය සඳහා අසනලද ප්‍රශ්නය ආදි ප්‍රශ්නවලට ක්‍රිස්තියානි පක්ෂයෙන් උත්තර නුදුන් බවද, "තවනාමොපච්චෙථොගොතු" යනු තිබෙන පාලි වාක්‍යගම් කැබැල්ල බයිබලයේ බුරුම පිටපතෙන් උපුටා සිල්වා පාදිලිඋන්නාන්සේගේ "ග්‍රන්ථසෙකරය" ට ඇතුලත් කිරීමේදී තමන් පාලිභාෂාව උගත්තෙක්නම් එහි විද්‍යමානවූ දොෂ ස්ර් නොගස්සා නොගොදන බවද, සිල්වා පාදිලිඋන්නාන්සේ විසින් පාලිභාෂාව නිසිලෙස නොදැනීම හේතුකොටගෙණ ආකූල කරගන්නාලද ප්‍රතීත්‍යසමුද්පන්න ධර්මයෙහි සංක්ෂෙප විස්තරයක් සහිත සත්වයන්ගේ චුතිප්‍රතිසන්ධියවන පරිදිද, ක්‍රිස්තුලබ්ධියෙහි දොස් දක්වා තවත් කරුණුද ප්‍රකාශකරණ ලදී.

අගොස්තු මස 28 වෙනි දින පූ. භා. 8—9 දක්වා ක්‍රිස්තියානි පක්ෂය වෙනුවෙන් සිරිමාන්න කතීසෙරුතැන විසින් ගුණානන්ද ස්වාමින්වහන්සේගේ කථාවට නොගැලපෙන කරුණු උත්තරමය යෙන් ගෙණහැරපා ඉක්බිති ගෞතම බොධිසත්වයන්වහන්සේගේ දානපාරමිතාදියටද, බුද්ධාදි රත්නත්‍රයටද, දොෂාරොපනයකොට කථාවක් කරණලදී. එම කථාවට 9—10 දක්වා ගුණානන්ද ස්වාමින්වහන්සේ සර්වප්‍රකාරයෙන්ම ප්‍රත්‍යුත්තරවත්නාවූ තර්කානුකූල ඉතා පැහැදිලි කථාවක්කර ක්‍රිස්තියානි පක්ෂයේ එඩිතරභාවය මැඩපවත්වමින් ප්‍රශ්න කීපයකට මතු පැමිණෙන පැයේදී පිළිතුරුදෙන බව ප්‍රකාශකර තිබේ. 28 වෙනි දින අ. භා. 3—4 දක්වා නැවතත් දුවිත්ද සිල්වා පාදිලිඋන්නාන්සේ විසින් තමන්ගේ මූලකථාවම ඉදිරිපත්පා අවුල්කරමින් කථාකරණලදුවත්හැර "මහමෙර" නම් පර්වතයක් නැතක්යාද, විනයනිදාන කථාදියට දොස් පැවරීමක්දකොට කථාවක් කරණලදී. 4—5 දක්වා ගුණානන්ද ස්වාමින්වහන්සේ අවසාන කථාව පටන්ගෙණ ක්‍රිස්තියානි පක්ෂය විසින් අසනලදීත් ඉතිරිව තුබූ ප්‍රශ්නවලට උත්තරදී අතිරෙකවශයෙන් කියයුතු කරුණුද ශබ්දාලඞ්කාර ව්‍යක්තවූ වාග්මීශ භාවයෙන් යුක්තව ප්‍රකාශකොට සමාප්ත කළ බැව් දක්වා තිබේ.

*P. A. Peiris.*
*James Dias*

මො. ගුණානන්ද සාමින්වහන්සේ ආදි උතුමන් සිහිපත් වීමපිළිබඳ කාර්‍යසාධක සමිතියේ ලේකම්වරු වමින.

1903 ඔක්තෝම්බර මස 30
වෙනි දින පාණදුරේදීය.

# වාදය කිරීම පිළිබඳව කරගන්නාලද ගිවිසුම.

1 වාදය මුඛවචනයෙන් කෙරියයුතුය

2 දෙපාර්ශ්වයෙන් දෙන්නෙක් විසින් ඒ කථාවල භාවය ලියාගත යුතුය. ඒ ලියනලද කථා කථාකාරයන්ගේ අත්සන් තිබීමෙන් සහතිකකළ යුතුය

3 ඒ ඒ පාර්ශ්වය විසින් ගෙණහැරදක්වන්නාවූ කාරණා අසවල් පොත්පත් වලින්යයි නම්සඳහන්කර කියයුතුය.

4 එක පාර්ශ්වයකට තමන්ගේ කථාව පිණිස එක්වරකට ඉංග්‍රීසි පැයක් ගතහැකිය,

5 පළමුවෙනි පැය ක්‍රිස්තියානි පක්ෂය විසින් "බුද්ධාගමේ අසත්‍යකම" පෙන්වාදීම පිණිස කථාකිරීමය. දෙවෙනි පැය ක්‍රිස්තියානි පක්ෂය විසින් "බුද්ධාගමේ අසත්‍යකම" පෙන්වාදී කළ කථාවට (බුද්ධපක්ෂය විසින්) උත්තරදීම සහ "ක්‍රිස්තියානි ආගමේ අසත්‍යකම" පෙන්වාදීම පිණිස කථාකිරීමය,

6 කථාව ලබන මස (අගොස්තු) 26 වෙනි හා 28 වෙනි දවස් දෙකට නියමකරගෙණ කෙරියයුතුය.

7 කථාකිරීම උදය 8—10 දක්වාද, එදවසේම පස්වරු 3—5 දක්වාද කෙරියයුතුය

8 වාදය කරණ අතර කිසි ගාලාගෝට්ටියක් කිසි කැරලිකෝලාහලයක් නොවෙන හැටියට දෙපාර්ශ්වය විසින් බලාගතයුතුය,

9 වාදය කරණ අතර කථාකරණ තැනැත්තා හැර අන් සියල්ලන් විසින් නිශ්ශබ්දව අසාගෙණ සිටියයුතුය. එසේ කරවීමට මෙහි අත්සන් කරණ තැනැත්තන්ට සම්පූර්ණ බලය ඇතුව තිබියයුතුය,

10 මේ වාදය පාණදුරේ පල්ලියේ තිබෙන දේවගෘහවත්තේදී කෙරෙණ හෙයින් දෙපාර්ශ්වය විසින් එහි බඩගලාවක් සාදවාදෙන ලෙසටද නියමකර ගතිමු.

මෙම පොරොන්දු පත්‍රයේ බුද්ධපක්ෂය වෙනුවෙන් කුරුකුල සූරිය ආරච්චිලින් ප්‍රේරා අප්පුනාමිද, ක්‍රිස්තියානි පක්ෂය වෙනුවෙන් මත්තෙයුස් සුවාරිස් ගුණවර්ධන මහත්මයා අත්සන් කරණලදී

1873 ජූලි මස 24 වෙනි දින
මිට එකඟව දෙපාර්ශ්වයෙහිම
අත්සන්කරන්ට යෙදුනාහුය.

# පාණදුරේ වාදය

(වර්ෂ 1873 ක්වූ අගෝස්තු මස 26 වෙනි දින උදය 8 පටන් 9 දක්වා
දාවිත් ද සිල්වා පාදිලි උන්නාන්සේ
කළ කථාව.)

පසුගිය ජූනි මස 12 වෙනි දින වැස්ලියන් දෙවස්ථානයෙහි මාවිසින් දේශනාවක් කළාය. ඒ දේශනාවේදී සත්වයාගේ ආත්මය ගැන බුද්ධාගමේ පොත්වල දක්වා තිබෙන අන්දම විස්තරවශයෙන් කියාදුන්නාය. මගේ ඒ දේශනාවට විරුද්ධව බුද්ධාගමේ දේශනාකාරයෙක් විසින් එම මස 19 වෙනි දින දේශනාවක් කළාය. මෙකී දේශනාදෙක පිළිබඳවැ මේ වාදකථාව හටගත්තාය. එමනිසා අදත් ඒ දේශනාවේදී මාවිසින් ගෙනහැරදැක්වූ කාරණාම විස්තරව කියාදෙමි. ඊට විරුද්ධව බුද්ධපක්ෂයට යමක් කියන්ටහැකිනම් කියා පෙන්වාදුන්නාවේ. අපි දෙපක්ෂය කියන කාරණාවලින් පිළිගතයුතුව තිබෙන්නේ කොයිපක්ෂයේ කියමන්ද කියා විනිශ්චයකිරීම මේ සමූහයාටම භාරවේය.

බුද්ධාගමේ ප්‍රකාරයට මනුෂ්‍යයාට ආත්මයක් ඇත්තේනැත. කුසලාකුසල කර්ම කරණම තැනැත්තාට එහි විපාක ලැබෙන්නේ නැත. ඒබව බුද්ධාගමේ පොත්වලින්ම පෙන්වාදෙමි. සත්වයා ස්කන්ධවශයෙන් පසකට බෙදා තිබේ. ඒ පසනම් රූපස්කන්ධය වේදනාස්කන්ධය සඤ්ඤාස්කන්ධය සංඛාරස්කන්ධය විඤ්ඤාණස්කන්ධය යන පසය. ඒබව සංයුත්තසඟියෙහි කියාතිබේ.

"පඤ්ච භික්ඛවෙ ඛන්ධෙ දෙසිස්සාමි" යනාදියෙන්ද "යෙකෙචි සංඛාරා අතීතානාගත" යනාදියෙන්ද වේ. තවත උපාදානස්කන්ධය ගැනද එසේමය. "කතමෙච භික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධා" යනාදියෙන්ද පඤ්චස්කන්ධය ගැන කීකීවචනම කියකියා රූපූපාදානස්කන්ධය මේය යනාදි වශයෙන් කියාතිබෙනවාය. තැවතද "යෙහිකෙචි භික්ඛවෙ සමණාවා බ්‍රාහමණාවා" යනාදි සංයුත්සඟියේ පාඨයෙන්ද සත්වයාට ඇති සියල්ලම පඤ්චස්කන්ධයට අයිති බව කියාතිබෙනවාය. මේ බව ත්‍රිපිටකයේ බොහෝතැන්වලද කාව්‍යශේඛරයේ—

"පස්කඳසකොලෙ සේ
දුක්තම්වේයඑමෙ සේ
රූවෙයින් සත්රූ සේ
සකරවින් තැනනමින්මෙප සේ"

යනමේ කවියෙන්ද පෙණවා.

නැවතද මෙමසබ්බයාම ආයතනවශයෙන් දොළොසකින් යුක්තය එනම්—චක්ඛායතනාදි සයත් රූපායතනාදි සයත්ය. ඒබව "කතමඤ්ච භික්ඛවෙ සළායතනං චක්ඛායතනං" යනාදි පාඨයෙන්ද, "සබ්බංවො භික්ඛවෙ දෙසිස්සාමි තංසුණාථ. කිංච භික්ඛවෙ රූපම' යනාදියෙන්ද විභඞ්ගප්‍රකරණයෙන්ද පෙණවාය. නැවතද මෙම සබ්බයාම නාමරූප දෙකට ඇතුළත්කර තිබෙනවාය. ඒබව සංයුත්සඟියෙහි තිබේ "කතමඤ්ච භික්ඛවෙ නාමරූපං වෙදනා සඤ්ඤා" යනාදි පාඨයෙන්ද "චත්තාරො මහාභූතා" යනාදි පාඨවලින්ද නාමය රූපය මෙසේ කියා තිබෙනවාය.

නැවතද "තත්ථ කතමං නාමං වෙදනාක්ඛන්ධො" යනාදි පාඨයෙන්ද වෙදනාස්කන්ධය සඤ්ඤාස්කන්ධය සංඛාරස්කන්ධය යන තුන නාමයට අයිති බවද කියාතිබෙනවාය මෙසේ රූප වෙදනා සඤ්ඤා සංඛාර යන ස්කන්ධ සතර නාමරූප දෙකට ඇතුළත් බවද "යං ඔළාරිකං එතං රූපං" යනාදි මිලින්දප්‍රශ්නයේ පාඨයෙන් යමක් "ඔළාරිකද ඒරූපයය යමක්සුඛුමචිත්ත චෛතසික ධර්මද ඒ නාමය" කියාද දක්වාතිබෙනවාය, මෙසේ රූපස්කන්ධයත් චිත්තචෛතසික ධර්මයොත් නාමරූප දෙකට අයිතිය. මෙයින් නාමරූප දෙකට අයිති ස්කන්ධ සතර පමණක් විඤ්ඤාණස්කන්ධය ඒවා අයිති නැතැයි කීවොත් නාමරූප දෙක නැතුව විඤ්ඤාණයට පවතින්ට නුපුළුවන් බව "යොහි භික්ඛවෙ එවංවදෙය්‍ය අඤ්ඤත්‍ර වෙදනාය" යනාදි සංයුත් සඟියේ පාඨයෙන් රූපාදි ස්කන්ධ සතර හැර විඤ්ඤාණයාගේ චුති උත්පත්තියක් පෙන්වන්ට පුළුවනැයි කීවොත් එසේ නුපුළුවනැයි කියාතිබෙන බව මේ පාඨයෙන් පෙණෙනවාය. ඇරත් පිළිසිඳ ගන්නා ක්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ සම්පූර්ණයෙන් පිළිසිඳගන්නා බව "ගබ්භසෙය්‍යක සත්තානං හි පටිසන්ධික්ඛණෙ" යන පාඨයෙන් පෙණවාය. ඇරත්—

"නම් රූ දෙක හැ    රං
නැත අන් පුහුල් බැහැ    රා"

යන කාව්‍යශෙඛරයේ කවියෙන්ද පෙණවාය. මෙසේ සබ්බයාම පූර්ණයෙන්ම ස්කන්ධායතන නාමරූපවලට ඇතුළත් බව පැහැදිලිව පෙණවාය. ඉතින් "මේ ස්කන්ධායතනාදි කිසිමතැනක ආත්මයක් නැතැ"යි බුදුන් විසින් උගන්වා තිබෙනවාය, ඒ කියාතිබෙන්නේ "රූපං භික්ඛවෙ අනත්තා" යනාදි පාඨවලින්ය. ඇරත් යම්කිසි තුන්කල් පිළිබඳ රූපාදි ස්කන්ධයන් ඒමේ මාගේ නොවන්නේය, මෙතෙමේ මම නොවන්නෙමි කියාතිබෙනවාය. ඒ කියාතිබෙන්නේ

"යංකිංචිරූපං අතීතානාගත පච්චුප්පන්නං" යනාදි සංයුත්සඟියේ පාඨයකින්ය. ඇරත් "රූපංභික්ඛවෙඅනත්තා" යනාදියෙන් "රූපාදිස්කන්ධයෝ අනාත්මය" යි බුදුන් කියනවාය.

තවද ආයතන ගැණත් බුදුන්ගේ කීම "චක්ඛුංභික්ඛවෙඅනත්තා" යනාදියෙන් එසේමය. ඇරත් මරණය ගැණ බුදුන් කියා තිබෙන්නේ—

"කතමං ච භික්ඛවෙ මරණං යං තෙසං තෙසං සත්තානං
තම්හා තම්හා සත්තනිකායා චුතිචවනතා"

යනාදියෙන් මරණය නම් සත්වයාගේ ඒ ඒ සත්වනිකායෙන් චුත වීමය මිදීමය යනාදි ක්‍රමයෙන්ය. මෙයින් පෙණෙන්නේ සත්වයාගේ නොමැරී ඉතිරිවෙන දෙයක් නැතිබවය.

තවද ඡන්දරාගය අත්හැරදැමීම පිණිස බුදුන් විසින් දුන් අවසරයකදී "යො භික්ඛවෙ රූපස්මිං ඡන්දරාගො තං පජහථ රූපං පහීනං භවිස්සති" යනාදි සංයුත්සඟියේ කියමනෙන් පෙණෙන්නේ මේරූපය ප්‍රහීනවෙනවාය මුලින්ම සිඳීයනවාය කියා සිතා ඡන්දරාගය හැර දමන්ට නියමකළේය.

තවද "යංකිංචි සමුදයධම්මං තං නිරොධ ධම්මං" කියා මහාප්‍රධානසූත්‍රයෙහි පේණවාය—එනම්—යම්කිසිවක් උපදිනසවභාවද ඒ නිරුද්ධවෙන සවභාවයයි කියාතිබෙනවාය.

තවද "උප්පාදෙජාති අනතාතෙන භංගාවුත්තාව යොතිච" යන මේ ගාථා දෙපදයේ භඞ්ගවෙනවාය කීවේ හැත්තටම නැතිවෙනවාය කීමයි. මෙසේ බුද්ධාගමේ ප්‍රකාරයට මනුෂ්‍යයාට ආත්මයක් නැත මනුෂ්‍යයාට ඇති සියල්ලම මරණයේදී භඞ්ගවෙනවාය.

මෙසේ නම් මනුෂ්‍යයාද ගෙම්බෙක් ගැරඬියෙක් බල්ලෙක් ඌරෙක් අශ්වයෙක් මෙන් ඉපදී ඒ සතුන්මෙන් මැරීයනවාය ඒ සතුන්ට ඇතුවාට වඩා මනුෂ්‍යයාට කිසිදෙයක් ඇත්තේනැත. සියළු තිරසන්ජාතීන්ට ස්වාමියෙක්ද රජෙක්දකොට මවනලද මේමනුෂ්‍යයා තිරිසනාකුට වඩා උතුම කමක් නැත්තෙක් කොට බුද්ධාගමේ උගන්වනවාය. යන්තම්වත් සිහිකල්පනා ඇත්තෙකුට මේ ඉගැන්වීම පිළිගන්ට පුළුවන්ද? මනුෂ්‍යයා තිරිසනක්නම් තිරිසනක් සේම නොසිඳ ආගමක් ඔනෑකරන්නේ මොකටද? තිරිසන්නුත් බණ අසා දිව්‍යලොකවල උපන්නාය කියා බුද්ධාගමේ කියාතිබෙන නිසා මෙකලවත් තිරිසනුන්ට බණ නොකියන්නේ මන්ද? තිරිසනුන්ට සිල් නොදෙන්නේ මන්ද? තිරිසන්නු තිරිසන්නුවා මිස මනුෂ්‍යයෝ

නොවන බව සියල්ලන්ටම හැඟියනවා ඇත. එනිසා මනුෂ්‍යයාට ආත්මයක් නැත කියන බුද්ධාගමේ ඉගැන්වීම දුරලා සැබෑවූ සුබවූ ක්‍රිස්තියානි ආගමේ මනුෂ්‍යයාට නොමැරෙන්නාවූ ආත්මයක් ඇති බව කල්පනාවට ගන්ට යුතුය.

ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසයෙහි ඇනගසනලද වරදකාරයෙකුට “සැබවක් නුඹට කියමි අදම නුඹ මාසමග පරාදීසයෙහි සිටිනවා ඇතැයි” යන කීමෙන්ද “ස්වාමීන්වහන්ස මාගේ ආත්මය ගත මැනවැයි” සෙප්‍රාන් විසින් කියනලද කීමෙන්ද කොරින්තිවරුන්ට ලියනලද පළමුවෙනිපත්‍රයේ පස්වෙනි පරිච්ඡේදයේ තුන්වෙනිපදයේ “මම ශරීරයෙන් දුරුව සිටින නමුත් ආත්මයෙන් ළන්ව සිට” යනාදි කීමෙන්ද පිලිප්පිවරුන්ට ලියනලද පත්‍රයේ 1 වෙනි පරිච්ඡේදයේ 23 වෙනි පදයේ “ශරීරයෙන් වෙන්වගොස් ක්‍රිස්තුස්වහන්සේ සමග සිටීම වඩා හොඳනිසා” යනාදි කීම්වලින්ද මෙනත් නොයෙක් කීම්වලින්ද මනුෂ්‍යයාට නොමැරෙන්නාවූ ආත්මයක් ඇති බව ඔප්පු වෙනවාය.

කුසලාකුසල කම්කළ තැනැත්තාවම එහි විපාක නොලැබෙන බවත් අන්කෙනෙකුන්ට ලැබෙනබවත් ඔප්පුකිරීම පිණිස කීවේ— “කිංනුඛො භො ගොතම සො කරොති සො පටිසංවෙදියතී ති” යනාදියෙන් කුසලාකුසල කම්කළ තැනැත්තේම එහි විපාක විඳින්නේයයි සිතීම එක් අන්තයෙක කියා බුදුන්විසින් කියාතිබෙනවාය.

ඇරත්, “අත්ථි කොචි සත්තො ඉමම්හා කායා අඤ්ඤං කායං පම් සංකමති” මේ කයින් අන්කයකට යන්නාවූ යම් සත්වයෙක් යම්කිසිවක් ඇද්දැයි මිලිඳුරජ ඇසූ කල්හි “නහි මහාරාජ ඉමිනාපන මහාරාජ නාමරූපෙන කම්මං කරොති සොභනං වා පාපකං වා තෙනකම්මෙන අඤ්ඤං නාමරූපං පටිසංදහතීති” එනම් නැවත මහරජ මේ නාමරූපය විසින් සොභනවූ හෝ පාපිෂ්ඨවූ හෝ කම් කරණවාය ඒ කම්යෙන් අනික් රූපයක් පිළිසිඳගන්නවායයි නාගසෙන විසින් උත්තර දුන්නාක්මෙන් පෙණීයනවාය.

ඇරත් “අතීත භවෙ කම්මපච්චයෙන නිබ්බත්තා” යනාදී පාඨයෙන් අතීත භවයේ කම්ප්‍රත්‍යයෙන් උපන්නාවූ ස්කන්ධයෝ එහිම නිරුද්ධවෙනවාය අතීත භවයෙන් මේභවයට පැමිණියාවූ එකම දෙයක්වත් නැතකියනවාය.

ඇරත් “සන්තාන කත කම්මපච්චයානුභාවෙන අනුපවජ්ජනා කිලෙස” යනාදි පාඨයෙන්ද සත්වයා විසින් කරණලද කම් ප්‍රත්‍යානු

භාවයෙන් නොසන්සිඳී පවතින්නාවූ කෙලශබලයෙන් නිවකරණ ලද්දාවූ අනික් නාමරූපයෙක් පහළවේයි කියාතිබෙන හෙයින්ද

ඇරත් ජාතියේදී එනම් ඉපදීමේදී ස්කන්ධ සම්පූර්ණයෙන්ම පහළවෙන බව "කාමංච භික්ඛවෙ ජාතියාච තෙසං තෙසං සත්තානං" යනාදි සංයුත්සඟියේද මහාසතිපට්ඨානසූත්‍රයේද වෙනත් බොහෝ තැන්වලද පෙණෙන පාඨයන්ගෙන්ද සකන්ධ හා ආයතන "උප්පත්තික්ඛණෙපාතුභවන්ති" යන මේ පාඨ කැබැල්ලෙන්ද පේණවාය.

මෙසේ සත්වයාගෙන් කිසිමස්කන්ධයක්වත් ආයතනයක්වත් අන්තැනකින් එන්නේවත් යන්නේවත් නැත. සත්වයා මැරෙණකල සම්පූර්ණ සත්වයාම මැරෙණවායයි පැහැදිලිව කියාතිබෙනවාය. මේ ඉගැන්වීම සැබෑයකියා යමෙක් විසින් පිළිගත්තොත් මනුෂ්‍යයා විසින් තමාගේ සම්පත් වියහියදම්කරගෙණ කුසල්යයිතා නොයෙක්දේ කරතත් ඒ කරණදෙයින් විපාකයක් තමාට නොලැබෙන බව තේරුම්ගන්ට යුතුය.

ඇරත් මේ ඉගැන්වීම සැබෑයකියා පිළිගන්නවානම් අවකල් ක්‍රියාකාර අසත්පුරුෂයන්ට තමන්ගේ පාපක්‍රියා වැඩිදිවුනු කිරීමපිණිස මීටවඩා උපකාරයක් වෙනනැතිබව පැහැදිලිවේ. ලෝකයේ මිනිමැරීම සොරකම්කිරීම ආදි නපුරු ක්‍රියා කරන්නෝ ඒ ක්‍රියාවන්ගේ විපාක ඇති බව දන්නවාය නමුත් ඒ විපාක තමන්ට නොව අන්‍යයන්ට ලැබෙනවාට ඒ අසත්පුරුෂයෝ අකමැති නැත.

ඇරත් වරදක්කලාවූ කෙනෙකුන්ට මිස වරදනොකළ කෙනෙකුන්ට දඬුවම් කිරීම ලෝකයේ කිසිම නඩුමාගීයකට එකඟනැත. මෙසේ තිබේද්දී මෙසාකාර සත්පුරුෂක්‍රියා වලක්වා අසත්පුරුෂක්‍රියා වැඩිදිවුනුවීමට ආධාරවූ දහම්ලහන්වන ආගමක් සැබෑවෙන්නට යුතුද? බුදුන් විසින් "මධ්‍යම ප්‍රතිපදාවක් දෙශනාකළාය" කියමින් නොයෙක් උපමාවලින් එබව දක්වන්ට බුද්ධාගමිකාරයෝ උත්සාහ කරත්. මේගැණ උපමාවලින් ප්‍රයොජන නැත ඒබව සුදුසුතැනදී පෙන්වන්ට යෙදෙනවා ඇත.

(මෙසේ කියා යහපත්සේ කොලාහල නැතුව අසාගෙණ සිටිය සමූහයාට ස්තුතිකොට කථාව හමාරකළාය.)

(වර්ෂ 1873 අගෝස්තු මස 26 වෙනි දින උදය 9 පටන් 10 දක්වා මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේ කළ කථාව.)

මෙපමණවේලා මේ දාවිත්දසිල්වා පාදිලි උන්නාන්සේ විසින් බුඬාගමට විරුඬව ගෙණහැරදක්වූ කාරණා බොහෝ ආකූලසහිතය, එම නිසා මෙහි රැස්වසිටින සමූහයාට මොහුගේ කථාව තේරෙන්ට ඇතකියා මට සිතන්ට බැරිය. බුඬාගමට විරුඬව බුඬදෙශනාවෙන් ගෙණහැරදක්වූ පාඨ කැබලිවල අර්ථයක්වත් අදහසක්වත් මේ සමූහයාට තේරෙණලෙස මේ සභාවේ ප්‍රකාශකෙළෙත් නැත. නමුත් මොහුගේ කථාවෙන් එකම අභිප්‍රායක් තේරුම්ගියාය. එනම් "සත්වයාගේ මරණයේදී මේ පඤ්චස්කන්ධ මෙතනම නිරුඬවෙනනිසා පරලොව උපදින සත්වයා අන්‍ය සත්වයෙක" යන මේ අභිප්‍රාය පමණක් මේ සිටින සමූහයාගෙන් සවල්පදෙනෙකුන්ට තේරෙන්ට ඇත කියා සිතමි, එමනිසා ඒගැණ උත්තරදීම මගේ යුතුකමය.

සත්වයාගේ මරණයේදී පඤ්චස්කන්ධයෙන් කිසිදෙයක් පරලොව යන්නේ නැත කියා බුඬදෙශනාවේ තිබෙනවා සත්‍යය. මේ පඤ්චස්කන්ධයෙන් කිසිදෙයක් පරලොව යන්නේ නැති නමුත් මේ සත්වයා නිසා පරලොව උපදින සත්වයා අනිකෙක් නොවේය ඒ බව මම ඉතා කඩිනමින් ඔප්පුකරමි.

බුදුන් වදාළ පඤ්චස්කන්ධ ධර්මකොඨාසය ඉතා ගැඹුරුව එය තිබෙනනේ පාලිභාෂාවෙන්ය මේ පාදිලිනැන පාලිභාෂාව මනාකොට දන්නෙක් නොවේය. ඒ නොදන්කම කරණකොටගෙණ බුඬදෙශනාව අන්‍යාකාරයකට පෙරලා හිතාගෙණ මෙපමණවේලා කළාවූ කථා සියල්ලම නිෂ්ඵලය. මොහුගේ පාලිදැනීමේ තරම මේ සමූහයාට තේරුම්කරදීමට මට හොඳ කාරණයක් ලැබිණේවි. එනම් මේ පාදිලිනැනාවිසින් සාදාපු මේ "ග්‍රන්ථසෙකරය" කියන පොතය. ඒ පොත මෙන්න මේ පොතේ පේලි හතරකින්යුත් සුළු පාලිවාසගමක් තිබේ. අළුත් තෙස්තමේන්තුවේ තිබෙන අභිප්‍රායක් පාලියට නගා මිට ඇතුලත්කර තිබෙන බව මේ පොතෙන්ම පෙනේ. පේලි හතරකින්යුත් මේ වාසගමේ මූල ! පේලියේම කීපපලක වැරදි තිබේ. එයින් පළමුවෙනි වැරද්ද "නවනාමොපච්ඡොනොනු" යන පදයෙහි බොහොම ලොකු මහාප්‍රාණයක් යොදාතිබීමය. "පච්ඡොනො" කියා මිස "පච්ඡො" කියා පාලිවචනයක් පාලිභාෂාවේ ඇත්තේනැත. තවද "නවනාමො" යනතැන පූරුෂලිඞ්ගිකව යෙදූවත් වරදය. මෙබඳු සුළු පාලිවාසගමක් මෙපමණ වැරදිසහිතව යෙදූ

නිසා මේ පාදිලිතැනගේ පාලිදැනීමේ තරම මෙයින්ම තේරේය. පාලිව්‍යාකරණාදිය ගැණ මාවිසින් ගෙණහැරදක්වූ කාරණා මේ සමූහයාට තේරුම්ගන්ට නුපුළුවන් නමුත් මෙහි දැනට පැමිණ සිටින පාලිභාෂාවෙහි අභිඥශ සමත්ථ සප්පිරයන්වහන්සේලා දනිති. එනිසා මේගැණ විනිශ්චය උන්වහන්සේලාට භාරදෙමි. මෙපමණ සුළු පාලි වාක්‍යම කැබැල්ලක්වත් හරියට යොදන්ට බැරි මේ පාදිලිතැන ගම්භීරවූ පංචස්කන්ධ ධර්මකොට්ඨාසය තේරුම්කරන්ට ගියඑක පණ්ඩිතයන්ට විහිළුවක්කොට පෙනේ.

පංචස්කන්ධයයි කියන්නේ රූපස්කන්ධය වේදනාස්කන්ධය සඤ්ඤාස්කන්ධය සංස්කාරස්කන්ධය විඤ්ඤාණස්කන්ධය යන පසය. එයින් රූපස්කන්ධය කියන්නේ අපේ ඇසට පේණ මේ රූපයනම් වේ. වේදනාස්කන්ධය කියන්නේ සැපදුක් වැටහීමය. සත්වයාගේ මරණයේදී රූපස්කන්ධය වූ මේ ශරීරය මෙතනම නවතින බවත් ඒක සොහොන්භූමියකට ගෙණගොස් වළලාදමන බවත් මේ සිටින සියල්ලොම දනිති. වේදනාස්කන්ධයයි කියනලද සැප දුක් වැටහීමත් සත්වයාගේ මරණයේදී මෙහිම නිරුද්ධවෙනවාය එයිනුත් පරලොව යන්ට දෙයක් ඇත්තේනැත මෙසේම අනික් ස්කන්ධයොත් මෙහිම නිරුද්ධවෙනවා මිස එයිනුත් කිසිදෙයක් පරලොව යන්නේනැත. මේ පංචස්කන්ධය මෙහිම නිරුද්ධවීම හා සමඟ මේ සත්වයා නිසා පරලොව උපදින සත්වයා අනිකෙක් නොවේය.

මේ සත්වයාගේ ආත්මය මෙයින් පිටත්ව ගොස් පරලොව උපදිනවානම් ස්වර්ගයෙහි සිටින්නෙත් මනුෂ්‍යයයෝම වෙන්ට ඕනෑය. මක්නිසාද මනුෂ්‍යයාට ඇති ආත්මයට මනුෂ්‍යආත්මයයි කියනවාය. එම මනුෂ්‍ය ආත්මයම මෙයින් පිටත්වගොස් ස්වර්ගයෙහි නැවතුණොත් ස්වර්ගයෙහි සිටින්නෙත් මනුෂ්‍යයෝවාට කිසි සැකයක්නැත. මේ පාදිලිඋන්නාන්සේ මෙහෙන් පිටත්ව වැල්ලෙමත්තට ගියාට එහිදී මුන්නැහේ වෙනඇත්තෙක් වෙන්ට බැරිය. මෙහිදී මුන්නැහේට ව්‍යවහාරකරණ නාමයම එහිදීත් ව්‍යවහාරකරණවාසන්නකය එමෙන්ම මේ ආත්මයම මෙයින් පිටත්ව ගමන්කර පරලොව යනවානම් ස්වර්ගයෙහි සිටින්නෙත් මනුෂ්‍යයෝමය.

තවද මේ පංචස්කන්ධයෙන් කිසිවක් පරලොව නොගොස් මේ සත්වයා නිසා පරලොව උපදින සත්වයා අන්‍යසත්වයෙක් නොවේ බව ඔප්පුකරන්ට තව උදාහරණ සාක්ෂියක් තිබේ. එනම් මගේ අතේ තිබෙන මේ [illegible] ආදි අයවල් විසින් ලියූ බයි

බලය නම් පොතය. නමුත් මෝසෙස් ආදි අයවල් විසින් ලියුවේ මේ පොතම නොවේය. ඒ අයවල් විසින් ලියුවාය කියන මුල්පොතෙන් ළුවන පොතක් ලියුවාය ඒ පොතෙන් තව පොතක් ලිවුවාය මේ ක්‍රමයෙන් අතින් අතට ලියාගෙණ එන පොත්වලට මුල්පොත්වල තිබුනු අකුරු වත් කොලවත් ගැලවීයාමේ නැත. එසේ කොහොමුත් ඒ මුල්පොතේ තිබුනු අදහස්ද වගන්තිද මේ බයිබලයේ තිබේ එසේම නම් සත්වයාගේ මරණයේදී මෙයින් යමක් පරලොව නොයයත් මේනිසා උපදින සත්වයා අනිකෙක් නොවේ. ඒබව පිරිසිදුව ඔප්පු කිරීම පිණිස තව වැදගත් සාක්ෂියක් තිබේ. ඒ මනාව ඇසියයුතු.

> " සබ්බෙ පුග්ගලා සන්ධාවන්ති අස්මාලොකා පරංලොකං පරස්මාලොකා ඉමංලොකන්ති ආමන්තා අත්ථිකොචි මනුස්සො හුත්වා දෙවො හොතීති මිච්ඡායෙ නිසන්ධාවන්ති සබ්බෙ පුග්ගලා ඉතො චුතො පරලොකං අනඤ්ඤො නෙවං මරණං නහොතීති පානාතිපාතොපි නුපලබ්භති "

යනමේපාඨය අභිධම්මපිටකයෙහි කථාවත්ථුප්‍රකරණයෙහි තිබේ. මෙයින් හැගෙන්නේ මෙලොවින් පරලොවට පරලොවින් මෙලොවට එම පුද්ගලයාම නොයන බවය. මනුෂ්‍යයෙක් හෙවත් මනුෂ්‍යයෙකුගේ ආත්මය මේ ශරීරයෙන් පිටත්ව දිව්‍යලෝකයකට යනවානම් දිව්‍යලෝකයේ සිටින්නෙත් මනුෂ්‍යයෝම වෙන්ටඕනෑය එසේනම් දිව්‍යලෝකයේ හිටින්නේ දෙවියෝනම් මනුෂ්‍යයෙක් දිව්‍යලෝකයට යනවාය කියා සිතීම අතිශයින් වරදය. මක්නිසාද මනුෂ්‍යයාගේ ආත්මයට මනුෂ්‍යාත්මයයි කියති. එම මනුෂ්‍යාත්මය හෙවත් මනුෂ්‍ය ප්‍රාණය මේ ශරීරයෙන් නික්ම දිව්‍යලෝකයට යනවානම් එහි දිව්‍යාත්ම නැතුවා සත්තකය. තවද මේ ශරීරයෙන් පිටත්ව පරලොව ගමන්කරණ නොනසින ආත්මයක් මනුෂ්‍යයාට ඇතුව තිබෙනවා නම් මනුෂ්‍යඝාතනයක් හෙවත් මිනීමැරීමක් නොහොත් ප්‍රාණඝාතයක් යමෙකුට කරන්ට බැරිය. මක්නිසාද-නොනසින ආත්මයක් හෙවත් ප්‍රාණයක් මනුෂ්‍යයාට තිබෙනවාය කියනනිසාය.

තවද—සත්වයාට ක්ෂණිකමරණය පරලොව යන මරණයයි කියා දෙකක්වේ. ජීවත්වෙන සත්වයින්ගේ සිත් ඉපදීමද නැසීමද ක්ෂණක්ෂණයෙහි වේ. පළමු උපන් සිත නැසුනායින් පසු උපදින සිත මුලින් උපන් සිත නොවේ. මේ අන්දමට සිත්ආදිය ඉපද ක්ෂණක්ෂණයෙහි නැසීයාම ක්ෂණික මරණයවේ. සත්වයාගේ රූපස්කන්ධයත් මෙසේම ක්ෂණක්ෂණයෙහි ඉපද නසින්නේය ශේෂකයේද

සත්වයාගේ ශරීරය කොටස් තිස්දෙකකින් යුක්තය. එයින් ඉසකේ පළමුවෙනි කොටස වේ. ඉසකේවලද නිතරම ඉපදීමක්ද නැසීමක්ද තිබේ, ඒබව තේරුම්යාම පිණිස මදක් කාරණා කියමි ඉසකේ සුමානයකට අඟල් භාගයක් පමණ වැඩෙන්නේය, ඒවා අගින් කැඩිකැඩියාමෙන් නිතර නැතිවන්නේය එසේ නොව වැඩෙන පමණ ඉසකේ කැඩීයාමෙන්වත් කපාදැමීමෙන්වත් නැතිවෙන්නේ නැත්නම් අවුරුද්දක් තුළ වැඩෙන ඉසකේ සියක්රියනක් පමණවෙන්ට බැරිනැත. එසේනොව ඉසකේවඩන ඇත්තන්ගෙන් ඉසකේ කොටව තිබෙන්නේ අගින් සිඳිසිඳී යන නිසාය දැනට අපේ මේ තිබෙන ඉසකේ කුඩාකාලයේ ආ ඒවා නොවේය. ශරීරයෙහි අතිකුඩා කොඨාසයන්ද මෙසේම ඇතිව නැතිවීමෙන් පවතින්නේය. රූපස්කන්ධයට ඇතුළත් කොඨාසයන්ද මෙසේ ක්ෂණිකමරණයට ඇතුළත්වේ. සත්වයා මැරෙන කාලයෙහි ඉන්ද්‍රිය සිඳී පරලොව ඉපදීම ජීවිතේන්ද්‍රිය සිඳෙන මරණය වේ, සත්වයාගේ මැරීමේදී පළමු සිත්නැසී පසුව සිත් උපදින්නේවීනමුත් සිත් පරම්පරාව කඩනොවන නිසා පරලොව උපදින්නේ අනිකෙක් නොවේය.

ක්‍රිස්තියානි ආගමේ ඉගැන්වීම්වල අන්දමට සත්වයාට නොනසින ආත්මයක් තිබෙනවානම් ඒ ආත්මයම පරලොව යනවානම් ඒ ආත්මය කොයිආකාර එකක්ද? ලියක්වාගේද? ගෙඩියක් වාගේද? කිකිළිබිජුවක් වාගේද? කියා ක්‍රිස්තියානි පක්ෂයෙන් අපට තේරුම් කරදෙන්ට ඕනෑය. එසේ තේරුම්කරදෙන්ට බැරිඋනිනම් පරලොව ගමන්කරන්නාවූ ආත්මයක් නැතිබව එයින්ම ඔප්පුවේය.

තවද "නොනසින්නාවූ මේශරීරයෙන්පිටත්ව පරලොවට යන්නාවූ වස්තුවක් හෙවත් ආත්මයක් මනුෂ්‍යයාට තිබෙනවාය" කියා මේ පාදිලිතැන කීවා මේ සමූහයාට ඇසෙන්ට ඇත. මේ පාදිලිතැන කියන අන්දමට ආත්මය හෙවත් ප්‍රාණය හුළඟ සමාන ද්‍රව්‍යවූ වස්තුවක් උනිත් එය පරලොව යන්ටනොදී නවත්වන්ට පුළුවන. හේ කෙසේද—මරණාසන්නවූ සත්වයෙක් ඝණවූ ලෝහමය භාජනයකට ඇතුළ්කොට වසා ඊට පිටින් හුළඟ නොයනලෙස ජයින්තතැබුවේනම් එහිතුළ ඉන්න මනුෂ්‍යයා මැරුණායින් පසු ඔහුගේ ප්‍රාණය ශරීරයෙන් පිටත්ව පරලොවට ගමන්කරණ එකක්නම් යන්ට අවකාශයක් නැතිනිසා එහිම නවතින්ට ඕනෑවා සත්තකය. එසේ නොනැවතී පරලොව යනවාය කියනවානම් ශරීරයෙන් පිටත්ව පරලොවට ගමන්කරන්නාවූ වස්තුවක් නැතිබව මෙයින් පැහැදිලිව ඔප්පුවේය.

පරලොව යන සත්ත්වයා ගැන අපට උගන්වා තිබෙන්නේ "නචසොනචඅඤ්ඤො" කියාය. නචසො කීමෙන් ඒඇත්තා නොවෙයි කියන්නා වාගේම නචඅඤ්ඤො කීමෙන් අනිකෙක් නොවේ. කියා අනික් අතටත් ඔප්පුවේ. මේආදී බොහෝ කාරණාවලින් මෙලොව ජීවත්වූ සත්ත්වයාම වෙනස්නොවී පරලොව යන්නේ නැති බවත් ඒ සත්ත්වයාගේ සිත් පරම්පරාවෙන්ම පරලොව උපදින නිසා අනිකෙක් නොවන බවත් පෙනේ. මේනිසා "කම්කළ ඇත්තාම නොව අනිකෙක් පරලොව දුක්සැප විඳිනවායයි" කී මේ පාදිලිතැනගේ කීම අතිශයින්ම වරදය මේගැන තවත් කියන්ට කාරණා තිබේ. ඒවා මත්තට දක්වමි.

( කියා බුඩාගමට විරුඩව දාවිත්දසිල්වා පාදිලි උන්නාන්සේ කළ කථාවට මෙසේ උත්තරදී ඉක්බිති ක්‍රිස්තියානි ආගමේ අසත්‍යතාව පෙන්වන්ට පටන්ගත්තේය. )

මීට ඉහත පැයේදී බුඩාගමට විරුඩව කථාකළ මේ පාදිලි තැනගේ කථා සියල්ලම මගේ කථාවෙන් බිඳවැටුනා සත්‍යකය. එසේදවුවත් තවත් ඒගැන කියන්ට බොහෝ කාරණා තිබේ. ඒවා ඉදිරියට මට ලැබෙන පැයකදී කියමි. මේ පැයතුළ කථාකරන්ට තවමට කාලය තිබෙන නිසා ඒ කාලය ක්‍රිස්තියානි ආගමේ අසත්‍යතාව පෙන්වාදීමට ඉතිරිකර ගනිමි,

ක්‍රිස්තියානි ආගම සැබෑවූ ආගමක් නොවේය. ඒ ආගම අදහා කිසිවෙකුත්ට පරලොව ගැලවෙන්ට බැරිය. ක්‍රිස්තියානි ආගමේ අසත්‍යතාව පෙන්වීමට කියන්ට තිබෙන කාරණා බොහෝය; එයින් සුළුකාරණයක් පළමුකොට දක්වමි. එය ඇසුව මැනව—නික්මයාම—20. 5 පදේ ක්‍රිස්තියානිකාරයෝ "දෙවියෝය" කියා විශ්වාසකරණ යේහෝවාට "ජ්වලිතවූ දෙවිකෙනෙක" කියා සිංහලට පිටපත් කොට තිබේ. "Jealous God" කියා ඉංග්‍රීසියෙන් තිබෙන වචනය සිංහලට "ජ්වලිතවූ දෙවිකෙනෙක" කියා තේරීම හාත්පසින්ම වැරදිය. "ජ්වලිත" යන වචනයේ 'දිලිසෙන්නාවූ' හෙවත් 'බබලන්නාවූ" යන අර්ථයක් ඇත්තේය. "Jealous" යන ඉංග්‍රීසි වචනයට එබඳු අර්ථයක් කියන්ට බැරිය. එයට "ඊර්ෂ්‍යාවන්තවූ" කියා අර්ථයක් තිබේ. "Jealous" යන වචනයට එම අර්ථය කීවානම් හරිය, "ඊර්ෂ්‍යාවන්තවූ දෙවිකෙනෙක" කීවොත් මිනිසුන් රවටන්ට බැරිනිසා මෙසේ කළායයි සිතමි. මෙසේ වංචාවෙන් මිනිස්සුන් රවටා තමන්ගේ ආගමට හරවාගන්ට උත්සාහ කිරීම ක්‍රිස්තියානි ඉගැන්වුම්කාරයන්ගේ සිරිතක්ය. එබව ඔප්පුකරන්ට මට වැද

ගත් සාක්ෂියක් තිබේ. එනම්--ක්‍රිස්තියානි කාරයෝ විශ්වාසකරණ දෙවියන්ට කල්දිවාවේදී ව්‍යවහාර කරන්නේ "ඊශ්වර" කියාය. ඒබව "ඊශ්වරෛක සුතෙකඃශො" යන ශ්ලෝක පදයෙන් පෙනේ. කල්දිවාවාසී හින්දු මනුෂ්‍යයෝ ඊශ්වරයාට ගෞරව කරන්නෝය එම නිසා ඒ රටේදී "ඊශ්වර" කියා ව්‍යවහාර කළාය. මේ රටේ සිංහල මනුෂ්‍යයෝ දෙවියන්ට බොහෝසේ ගෞරව කරන්නෝය, එම නිසා මේ රටේදී යේහෝවාට "දෙවියෝය" කියා ව්‍යවහාර කරණාය. මේ අන්දමේ වංචාතේරුම් ක්‍රිස්තියානි ඉගැන්නුම්කාරයෝ අතර පවතිනවා සත්තකය. මෙබඳු වංචා තේරුම් කරන්නේ එයින් වත් තමන්ගේ ආගමට වාසියක් ලබාගන්ට පුළුවනයන අභිප්‍රායෙන්ය.

තවද—ක්‍රිස්තියානි ඉගැන්නුම්කාරයෝ තමන්ගේ බයිබලයේ තිබෙන සමහර වචන ඒ ඒ ස්ථානවලින් අරන්දමනවාය, ඒ බව ඔප්පුකරන්ට මට වැදගත් සාක්ෂියක් තිබේ. එනම්—ලෙවීකථාවේ 17, 6. පදේ "මිථ්‍යාචාරයෙන් ක්‍රියාකළ යක්ෂයින්ට ඔවුන් නවත් පූජානොකරන්නෝය" කියා 1840 යේදී මේ පාදිලිතැනගේ සමාගමෙන්ම ප්‍රසිද්ධ කරපු සිංහල බයිබලයෙහි තිබේ. ඉන්පසු එම සමාගම විසින්ම ප්‍රසිද්ධකරපු සිංහල බයිබලයේ ඒ පදේ එතන ඇත්තේනැත. මේක වංචාවක්ය කියා සිතන්ට කාරණා තිබේ. යක්ෂ පූජාවල් කිරීම ක්‍රිස්තියානි කාරයින්ගේ සිරිතක්බව හැඟෙණවාට මේ පදේ මෙතනින් අරන්දම්මා වෙන්ට ඇත. මේ අන්දමින් හිටතන හිටතන වේලාවල්වලදී බයිබලය වෙනස්කිරීම රෙපරමාදු ක්‍රිස්තියානි කාරයින්ගේ සිරිතක්ය. රෝමානු ක්‍රිස්තියානි කාරයින්ට මෙහිදී සතුටක් දෙන්ට වටී මක්නිසාද—ඔවුන් කවරකලකවත් බයිබලය වෙනස්කරන්නේ නැත ඒ නිසා ඔවුන්ට සතුටුකරමි. මෙයින්ද ක්‍රිස්තියානි ආගමේ තිබෙන අසත්‍යතාව පෙණේ.

ක්‍රිස්තියානි ආගමේ අසත්‍යතාව පෙන්වන්නට මට නවත් වැදගත් සාක්ෂියක් තිබේ. එනම්—උත්පත්ති 6, 6. පදේ "මනුෂ්‍යයා මැවූ බැවින් තැවුනුයේය" කියා තිබේ. මේ කණගාටුව යේහෝවාට ඉපදිලා තිබෙන්නේ මනුෂ්‍යයා මැවූ නිසාය, මන්නට කණගාටු උපදින ක්‍රියා කරන්නේ කිසිවක් නොදන්නා මෝඩයෝය. "සියල්ල දක්නා දිව්‍යඥානයක් තිබෙනවාය" කියන මැවුන්කාරයා තමන් වම ලුසුක උපදින කණගාටු උපදින ක්‍රියාකරණ එක මහත් විහිළුවක්ය. මෙයින් යේහෝවාට මත්තට වෙන ක්‍රියා පේණ ඥානයක් නැත්බව පිරසිදුලෙස ඔප්පුවේ. මෙබඳු කෙනෙකුට "සර්වප්‍රාඥමය"

වත් "සියළු බලය"වත් නැත. ඉතින් මේ අන්දමේ කණගාටු උපදින දුක් උපදින ක්‍රියාකළ දුර්වලකෙනෙක් "මැවුම්කාරයා" ය "සියළුබලේ ඇත්තාය" කියා විශ්වාස කිරීම කිසිසේත් යුතුනැති බව මේ සියල්ලෙන්වම හැඟීයන්ට ඇත.

මේ සියළුදෙනාටම ක්‍රිස්තියානි ආගමේ අසත්‍යතාව වැටහීම පිණිස කියාදෙන්ට තවත් වැදගත් කාරණයක් තිබේ. ඒක මීට ප්‍රථමයෙන් ක්‍රිස්තියානි ආගමට විරුඬව ගෙණහැරදක්වූ කාරණා වලට වඩා සියල්ලන්ටම තේරුම්ගැණීමට පහසු එකක්ය. එනම්— නික්මයාම 12, 23, පදේ මෙසේ තිබේ. "යෙහෝවාවහන්සේ මිසර වාසීන්ට පහරදෙන පිණිස ගොස් උළුවස්සෙ උඩ පඩි කදෙහිද කනු දෙකෙහිද ලේ දැක දොර ඉක්මවා යනසේක" යනුයි. මෙයින් හැඟෙන්නේ ඊශ්‍රායලිතවරුන්ගේ ගෙවල් හැඳිනගැණීමට යේහෝවාට ලකුණක් නැතිව බැරිවූ බවය. කණකුට ගමන්කරන්ට කණු වැල ඇල්ලීම පිණිස කෙනෙක් ඕනෑකරන්නාක්මෙන් මෙතනදී යේහෝවාටත් ගෙවල් හැඳිනගැණීමට ලකුණක් ඕනෑ කළබව පෙණේ. මෙබඳු කෙනෙකුන්ට දෙවියකියන්ටවත් සියල්ල දන්නා ඥානයක් ඇත කියන්ටවත් තිබෙන යුතුකම මොකද? මේවාට අපේ මිත්‍රයා "ක්‍රිස්තුස්ගේ මරණයට මේකලකුණක්ය" කියා විහිළු උත්තරයක් දෙනවා ඇත ක්‍රිස්තුස්ගේ මරණයේදී ලේ ගෑමක් සිදු උණේ නැත එම නිසා එබඳු ලාමක උත්තර දීලා මෙයින් බේරෙන්ට මම ඉඩදෙන්නේ නැත

තවද— යේහෝවාට සියල්ල දන්නා දිව්‍යඥානයක් නැතිබව ඔප්පුකරන්ට වැදගත් කාරණයක් ගෙණහැර දක්වමි මෙතනට ඇසියයුතු නික්ම—4, 6 පදේ "පළමුවෙනි හාස්කම විශ්වාස නොකළොත් දෙවෙනි හාස්කම විශ්වාස කරන්නේය" යනාදී කියමනක් තිබේ. මෙයින් හැඟෙන්නේ යේහෝවාට මේ ක්‍රියාවේදී අනුමාන තිබුනුබවය එසේ අනුමානයක් නොතිබුනානම් "පළමුවෙනි හාස්කම විශ්වාසනොකලොත් දෙවෙනි හාස්කම විශ්වාසකරන" කියන්ට කොහෙත්ම යුතුකමක් ඇත්තේනැත. මෙයිනුත් යෙහෝවාගේ සියල්ල දන්නා දිව්‍යඥානයට පළුදුවිය

තවත්— ක්‍රිස්තියානි කාරයෝ විශ්වාස කරණ යෙහෝවාට සියලු බලේ නැතිබව පෙනවීමට වැදගත් කාරණයක් තිබේ එනම්— විනිශ්චය; 1, 18 පදේ මෙසේ තිබේ කෙසේද "යෙහෝවා වහන්සේද යූදාසමග සිටිසේක ඔහුද කන්දේ වැසියන් ඇලෙව්වේය එහෙත් සමතලාවේ වැසියන්ට යකඩරථ තිබුනු නිසා ඔවුන්

අඹවන්ට නොහැකිවිය'' කියා තිබේ. මෙතනදී යේහෝවඃ යුදසමග සිටගෙණත් යකඩ රථ තිබුනුනිසා ඔවුන් පරාජයකරන්ට බැරිවූබව පැහැදිලිව පෙණේ. ඉතින් ක්‍රිස්තියානිකාරයෝ යේහෝවඃට සියලු බලේ තිබෙනවාය කියා විශ්වාසකිරීම කොපමණ ලාමකද? යකඩෙට බයවෙන්නේ කවුද කියා සිංහල මිනිස්සු හොඳකොට දන්නවා ඇත. එක ගෙදරක හිටලා තවත් ගෙදරකට රාත්‍රිතව යම් කෑම වර්ගයක් ගෙණයනවිට ඒකේ යකඩයක් තබාගෙණ යාම සියලු සිංහල මනුෂ්‍යයන්ගේ සිරිතකි. තවද කසායක් උණුකරණකොට කසාය හැලියේ යකඩයක් බැඳීමත් සිංහල මනුෂ්‍යයන්ගේ සිරිතකි මේවා මෙලෙස කරන්නේ යකුන්ගෙන් පැමිණෙන දොස් නැතිකිරීමටය ඉතින් යේහෝවඃ යකඩට හයවූ නිසා ඔහු කව්ද? කියාත් ක්‍රිස්තියානිකාරයන්ගේ ඇදහිල්ල මොකක්ද? කියාත් මම විස්තර නොකරාට මේ සමූහයාටත් තේරුම්ගන්ට බැරිනැත එනිසා මේ ගැණ කරණ කථාව මෙසින් නවත්වමි

තවද—ක්‍රිස්තියානිකාරයින්ගේ දෙවියන්ගේ තරමත් ඒ දෙවියෝ කව්ද කියාත් සිතන්ට තව හොඳ කාරියක් පෙන්වමි, නික්මයාම 4, 24 "පසේ ඔහු යනකල නවාතැන්හිදී යේහෝවඃවහන්සේට ඔහු සම්භවී ඔහු මරන්ට සෙව්වා සිප්පෝරා තියුනු ගලක් රැගෙණ ඇගේ පුත්‍රයා ජීනාන නම් කොට ඒ හම ඔහුගේ පාදමුලට හෙලා සැබවින් තුබ් මට ලේහයෙන් ස්වාමියෙකැයි කීවාය එවිට උන්වහන්සේ ඔහු යන්ට ඇරියේක'' යන මේ කියමනෙන් ඔප්පුවෙන්නේ යේහෝවඃ හොඳ මිනීමහක්කොට තෝරාගත් මෝසෙස් දෙවනු මරන්ට හැදුවම මෝසෙස්ගේ ස්ත්‍රී ඇගේ පුත්‍රයා ජිනානනම් කොට හම යේහෝවඃම පුද දෙමෝසෙස් ගලවාගත් බවය. මෙහි ජින්නා නම් කලාය කීවාම මේ සමූහයාට තේරුම්ගන්ට අමාරුය නමුත් ඒක මීට වඩා සිංහලෙන් මේ සභාවේ මට කියන්ට බැරය "ජින්නානම්" කිරීමය කියන්නේ මහම්මත් ආගම්කාරයන් ආගමට ඇතුලත් කරගැණීමට කරණ ක්‍රියාව හා සමාන ක්‍රියාවක්ය. සිප්පෝරා තමාගේ දරුවාගෙන් කැපූ කෑබෙල්ල යේහෝවඃ ඉදිරියට විසිකලාහින් පසු මෝසෙස් නොමරා ඇරියාවයේම මේ රටෙත් යම් මනුෂ්‍යයෙකුට යකෙකුගෙන් ලෙඩක් පැමිණි විට ඒ ඇත්තා එයින් ගලවා ගැණීම පිණිස බිල්ලක් දෙනවිට කුකුලෙක් බිලිදෙනවානම් ඒ කුකුලාගේ කරමලෙන් ටිකක් කපා දෙනඑක යකැදුරන්ගේ සිරිතක්ය එළුවෙක් බිලිදෙනවානම් එළුවාගේ කණෙන් ටිකක්වත් කපා යකාට පුද ලෙඩා යකාගෙන් [illegible]නවාය. එසේම සිප්පෝරා කළ

ක්‍රියාවත් මීට සමානවෙනබව සිහිඇතිකාටවත් පෙණේ, ඉතින් ක්‍රිස්තියානි කාරයෝ විශ්වාස කරණ යේසුස්වහන්සේ දෙවිකෙනෙකැයිද නැද්ද කියා දැනගැණීමට මේවා වැදගත් සාක්ෂිවේ. දැනට මට ලැබීගිබුනු කාලය අන්තිමවෙන්ට ගියනිසා මගේ කථාව මෙයින් අත්හිටවන බව ඔබ සියල්ලෝම දැනගණින්වා. තවත් මට මේ වාද කථාව කරන්ට අදදවසේම සවස්වරුවේ කාලයක්ද ලබන බෘහස්පතින්දා උදය සවස දෙකේ කාලදෙකක්ද ලැබී තිබේ. ඒ කාලවලදී ක්‍රිස්තියානි ආගමේ අසත්‍යතාව පෙන්වාදීමට තිබෙන වැදගත් කරුණු කියාදෙන්නෙමි බුද්ධාගමේ තිබෙන සත්‍යතාවත් එසේම පෙන්වාදෙන බව ඔබ සියල්ලෝම දැනගණින්වා.

(කියා මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේගේ
කථාව හමාරකරන්ට යෙදුනාය.)

---

(වර්ෂ 1873 අගෝස්තු මස 26 වෙනි දින සවස
3 පටන් 4 දක්වා දාවිත් ද සිල්වා පාදිලි උන්නාන්සේ විසින්
ක ළ ක ථා ව.)

මීට ප්‍රථම කථාකළ මගේ විරුද්ධකාරයා විසින් ග්‍රන්ථශේඛරය ගැණ මට දෙස්කීවා කොහෙත්ම හරිනැත මක්නිසාද—ඒ පොතේ තිබෙන ඒ පාලිවාක්‍යගම මා විසින් සෑදූ එකක් නොවේය. පාලියට නගා බුරුම අකුරෙන් අච්චුගසා තිබෙන අලුත්තෙස්තමේන්තුවේ ඒ පාලිවාක්‍යගම තිබේ. එයින් උදුරාගෙණ මා විසින් කළ ග්‍රන්ථශේඛරයට ඒ වාක්‍යගම අඩංගු කළා සත්තකය. ඒ බව එම පොතේ පිට කොලයේ සඳහන්වේ. එපමණවත් තේරුම් නොගෙණ මට දෙස් කීඑක හරිනැත.

තවද—ආත්මය යකඩ භාජනයක දමා නවත්වාගන්ට පුළුවන් නැයි යන කීමක් මගේ විරුද්ධකාරයා කීවා මේ කාටවත් ඇහෙන්ට ඇත. විද්‍යුත් (එනම් විදුලිය) වාතයට වඩා සියුම්ය එය කොයි ආකාර භාජනයක දමාලාවත් නවත්වන්ට බැරිය. ආත්මයත් එසේ නවත්වන්ට බැරිඑකක්ය.

මේ ඇර—මගේ විරුද්ධකාරයා ඉංග්‍රීසි ක්‍රිස්තියානිකාරයන් විසින් 'දෙවියන්වහන්සේය' යන වචනය 'ඊශ්වර' යන නාමයෙන් පිටපත්කර තිබෙන බවක් කියා ඊට දෙස්කීවා 'ඊශ්වර' යන නාමය 'බලසම්පන්නවූ' කෙනෙක යන අර්ථයක් ඇතිනමක්ය. ඒ නාමය සියලු බලැති අපේ දෙවියන්වහන්සේට ව්‍යවහාරකරණ

එක අතිශයින් සුදුසුය. ඒගැණ දෙස් කීවේ මගේ විරුඩකාරයාගේ නොදැනුම් කමින්ය. තවද මගේ විරුඩකාරයා දෙවියෝය යන වචනයටත් විරුඩව ප්‍රලාපවගයක් දෙඩෙව්වාය. අපි විසින් වන්‍දනා කරණ තැනැත්තාට අපේ භාෂාවෙන් ඊට වඩා සුදුසු නාමයක් ව්‍යවහාරකරන්ට නැත.

අපේ දෙවියන්වහන්සේ 'ජවලිත දෙවිකෙනෙකැ' යි කියා මගේ විරුඩකාරයා ඊට දෙස් කීවා හරිනැත. මක්නිසාද — යම් භාෂාවක වචනයකට එකම අර්ථයක් මිස වෙන අර්ථ නැතැයි කියා කථාකිරීම අඥානගොචරය. වචනයකට නානාඅර්ථ තිබෙන්ට පුළුවන. විනය පිටකයෙහි මහවග කියන පොතේ 'පණ්ඩකො භික්ඛවෙ නාසෙ තබ්බො' කියා තිබේ. 'නාසෙ තබ්බො' කී වචනයට 'නැසිය යුතුය'යි සන්න කරන්නට පුළුවන. එසේ වීනමුත් ප්‍රාණඝාතය වැලැක්වූ බුදුන් විසින් නාසෙ තබ්බො කීහෙයින් 'පණ්ඩකයා උපසම්පද කලොත් ඔහුගේ සිවුරු කඩාදමන්නට' නියම කලා පමණකැයි අපි කියමු. මෙසේ පාලිභාෂාවේ වචනද ඒ ඒ තැනට සුදුසු පරද්දෙන් අර්ථ කියයුතුය.

ලෙවී 17, 3—7 පදේ දක්වා තිබෙන කාණ්ඩය ඒ තිබුනුතැනින් අන්තරාව වැලැක්වීම පිණිස අන්තැනකට ගෙණ යොදා තිබේ, බයිබලය සිංහලට පිටපත්කල උත්තමයන්ට ගල්කැටයක් ගසන්ට පුළුවන් සමර්ථයෝ ඇත්තේ නැත. මගේ විරුඩකාරයා අරත්දුම් මාය කියන පදේ බයිබලයේම වෙනතැනක තිබේ. පළමුවෙන් කල තුන්සලාත්තුවට වඩා දෙවනුකල තුන්සලාත්තුව ඉතා හොඳය. එම නිසා මගේ විරුඩකාරයා බයිබලය පිටපත්කල උත්තමයන් පිටට හොඩනගන්ට ගිය දොෂය ඒ උත්තමයන්ට ලැබෙන්නේ නැත.

උත්පත්ති පොතේ 6, 6 වෙනි පදයේ පෙණෙන පශ්චාත්තාප යන මුල්වූ හෙබ්‍රෙව් භාෂාවේ පාවිච්චිකර තිබෙන 'නෙහාම' යන වචනයෙබද නොයෙක් අර්ථ තිබේ. මෙහිදී ගතයුතු අර්ථය 'වෙනස්ව ක්‍රියාකරණවාය' කියාය. මේගැණ සුධර්ම ප්‍රකරණයේ ඉතා පැහැදිලි ලෙස කියා තිබෙනවාය (කියා ඒ පොත කියවා පෙන්වා දුන්නා ඇත.)

නික්මයාමේ පොතේ 12, 23 ඊශ්‍රාලිතවරුන් වාසයකල ගෙවල් වල උළුවස්සේ බැටළුලේ ගෑමට විරුඩව ගෙණහැර දැක්වූ කාරණා නිෂ්ඵලය. ඊශ්‍රාලිතවරුන් විසින් පැවැත්වියයුතු අණක් දෙවියන් වහන්සේ ඔවුන්ට දුන්නාය, මිසරවාසීන්ට දඬුවම් දෙනකල එම

අණ රක්ෂාකළ අය රක්ෂාවෙනවා ඇත, නොසැලකුවොත් නාස්ති වෙනවා ඇත, ඇරත් ඒ නියෝගය ක්‍රිස්තුස්වහන්සේගේ මරණය දක්වූ පූර්වලක්ෂණ නියෝගයක (!!) මාගේ විරුද්ධකාරයා විසින් ක්‍රිස්තියානි ආගමට විරුද්ධව ඇසූ ප්‍රශ්නවලට මේ උත්තර සෑහෙන නිසා මීට වඩා ඒගැණ උත්තරදීමට පමාවෙන්නට ඕනැකරන්නේ නැත,

(කියා ඉක්බිති බුද්ධාගමට විරුද්ධව
කථාකරන්ට පටන්ගත්තාය,)

මෙතැන්සිට බුද්ධාගමේ අසත්‍යතාව පෙන්වාදීමට වැදගත් කාරණයක් කියම්. ඒ ඇසුව මැනව; බුද්ධාගමේ වැදගත් ඉගැන්වීමක්ව තිබෙන්නේ ප්‍රතීත්‍යසමුප්පාද ධර්මකොඨාසය වේ; ඒ ධර්මය ඉතාම ආකූලය; එබව ඔප්පුකිරීම පිණිස සංයුත් සඟියේ ඒගැණ කියා තිබෙන පාඨය කියම්;—කතමංච භික්ඛවෙ පටිච්ච සමුප්පාදෙ අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං" යනාදී පාඨයෙන් උගන්වා තිබෙන්නේ අවිද්‍යාව නිසා සංස්කාරයද, සංස්කාරය නිසා විඤ්ඤාණයද; විඤ්ඤාණය නිසා නාමරූපයද; උපදිනවාය කියාය. ඉතින් මේ ඉගැන්වීමේ හැටියට අවිද්‍යාවය කියන නොදැනුම් කමින් නොහොත් මෝඩකමින් සංස්කාරයෝ උපදින බවත් සංස්කාරයෝ නිසා විඤ්ඤාණය උපදින බවත් පෙණේ; ආයෙත් මත් විඤ්ඤාණය නිසා නාමරූප උපදිනබවද පෙණේ. නාමරූප දෙකට පංචස්කන්ධය ඇතුළත්වේ, පංචස්කන්ධයේදී විඤ්ඤාණ ස්කන්ධයත් පෙන්වා තිබේ, ඉතින් මේ කියමන කොපමණ ආකූලද? එකතැනක සංස්කාරය නිසා විඤ්ඤාණයක් උපදිනවාය කියාත් ආයෙත්ම එකතැනක විඤ්ඤාණය නිසා නාමරූපය උපදිනවාය කියාත්තිබේ; නාමරූපයටත් විඤ්ඤාණය අයිති නිසා මේ කියුම තෙත් පෙණෙන්නේ "අප්පානිසා පුතා උපදිනවාය, පුතානිසා අප්පා උපදිනවාය" කීවාවගේය. බුදුන්ගේ අනේ ඇති ධර්මයක් තමයි, මෙබඳු කිසිවෙකුට තේරුම් ගන්ට බැරි කිසිසේත් නොගැළපෙන දහම් සැබෑය කියා සිහි ඇති කවරෙක් නමුත් පිළිගන්නවා ඇද්ද?

තවද—නාමරූප දෙදෙනා ප්‍රත්‍යකොට සළායතන (එනම් ඇස් කන් නාසාදිය) පහළවෙනවාය කියනවා, ඒ කීම සැබෑනම් සත්වයා ඇස් කන් නාසාදිය නැත්තෙක්වෙන්ට ඕනෑය. මෙසේ ඇස් කන් ආදිය නැති නාමරූප දෙකක් තිබෙනවාද? මීට වඩා පටලැවිලි අවුල් කීමක් වෙන තිබෙන්නට පුළුවන්ද? ඊලඟට ආයතනයන් ප්‍රත්‍යකොට ස්පර්ශය වෙනවාය, මේ ස්පර්ශයත් චක්ෂු ශ්‍රොත්‍රයන්ගේ ස්පර්ශයයි, "ඇරත් කතමංච භික්ඛවෙ නාමරූපං" යනාදී කියමනත්

සංයුත්සඞ්ගීයේ තිබේ, ඒ කියමනේ හැටියට ස්පර්ශය නාමයට අයිති බව පෙණේ, මෙවා එකක් සැබෑනම් අනික බොරුබව පෙණේ. මෙහෙම පටලැවිල්ලක් අනික් මිනිහෙකුට උනාය කියා සිතන්ට පුළුවන්ද? මේ බණ ගම්භීරය දකින්ට අමාරුය, කීපමණින් පිළිගන්ට කැමති තැනැත්තාට එහි අමාරුකමක් පෙණියතත් මේ එකිනෙකට විරුබවූ මහාපටලැවිල්ලක් ගෙණ පැවාම අපරීක්ෂාකාර බුද්ධාගම්කාරයන්ට ගෝචරවා මිස ඥානාලොකයට කැමති තැනැත්තා පිළිගනොහැකි. නවද "ඵස්සපච්චයා වෙදනං" ස්පර්ශය ප්‍රත්‍යකොට ගෙණ වෙදනාව උපදිනවාය යන කීමත් එසේම අවුල්ය මක්නිසාද—නාම රූප දෙක සැදුන තැනදී නාමයට වෙදනාස්කන්ධයත් ඇතුළත් හෙයින් වෙදනාව සැදුනේ විඥ්ඥාණය ප්‍රත්‍යකොටගෙණය මෙතන වෙදනාව ප්‍රත්‍යව ස්පර්ශයයි කියනවාය. මෙයින් එකක් සැබෑනම් අනික මිථ්‍යාය, මට කථාකරන්ට නියමවේලාව අන් ක්‍රාන්තවෙන්නට ලඟ බැවින් තවඑකක් දක්වා හමාරකරණවාය. වෙදනාව ප්‍රත්‍යකොට තණ්හාව සැදෙනවාය තණ්හාව ප්‍රත්‍යකොට උපාදානය, උපාදානය ප්‍රත්‍යකොට භවය, භවය ප්‍රත්‍යකොටගෙණ ජාතිය වෙනවාය. ඉතින් ජාතිය එනම් ඉපදීමයයි කීවේ "ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො" ස්කන්ධයන්ගේ පහළවීමය ආයතනයන්ගේ ප්‍රතිලාභය මෙසේ ස්කන්ධයන්ගේ පහළවීමටත් ආයතනයන්ගේ ප්‍රතිලාභයටත් ප්‍රත්‍යව තිබෙන්නේ භවයයි කියනවාය. නුමුත් කුසලාකුසල සංඛාරය විඥ්ඥාණයට ප්‍රත්‍යව තිබෙනවාය. විඥ්ඥාණය නාමරූපදෙකට ප්‍රත්‍යව තිබෙනවාය, ඒ විඥ්ඥාණය හා නාමරූප දෙකට පඤ්චස්කන්ධය ඇතුළත්ය. ඒ පඤ්චස්කන්ධයෙහි විඥ්ඥාණයට කුසලාකුසල සංඛාරය ප්‍රත්‍යව තිබුනාය. විඥ්ඥාණයට කුසලාකුසල සංඛාරය ප්‍රත්‍යව තිබුනාය විඥ්ඥාණය නාමරූප දෙකට ප්‍රත්‍යව තිබුනාය. මෙහිදී ස්කන්ධයන්ගේපහළවීමටත් ආයතනයන්ගේ ප්‍රතිලාභයටත් භවය ප්‍රත්‍යයයි කියනවාය. එකක් සැබෑනම් අනික බොරුය. මගේ විරුද්ධකාරයාට පුළුවන්නම් මේ පටලැවිල්ල හැරලා බේරාදුන්නාවේ.

(මෙසේ කියා අහගෙණ සිටිය සමූහයා සංසුන්ව අහගෙණ සිටියාට සතුටුකොට කථාව හමාරකළාය.)

---

(1873 අගොස්තු මස 26 වෙනි දින සවස 4 පටන් 5 දක්වා මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේ කළ කථාව.)

මෙහි රැස්ව සිටින සමූහයාම පළමුකොට දැනුම්දියයුතු කාරණාවක් තිබේ. එනම්—බුද්ධාගමට විරුබව කථාකළ මේ කථිකාචා

යාට ඔහුගේ නම ව්‍යවහාරකරන්ට ඕනෑකළ ප්‍රස්ථාවලදී "පාදිලි උන්නාන්සේය" කියා මා විසින් ව්‍යවහාරකළ බව මේ සියල්ලන්ටම මතක ඇත. එසේ මම කථාකළේවී නමුත් මේ කථාකාරයා මට ව්‍යවහාරකටයුතු නම එසේ ව්‍යවහාර නොකර "විරුඞකාරයාය" කියා ව්‍යවහාරකළ නිසා මොහුටත් ඒ නමම ව්‍යවහාරකරන්ට උනාට කණගාටුය. ඉතින් මෙතැන් පටන් "විරුඞකාරයාය, හතුරාය" යන නමක් මේ කථාවේදී මා විසින් ව්‍යවහාරකලොත් ඒ නම මොහුට බව මේ සියල්ලෝම දැනගණිත්වා. අපේ ආගම් දෙකේ හරිවැරදි කල්පනාකරන්ට අප දෙපක්ෂය මේ කථාව මෙලෙස කරන්නේවී නමුත් අපි දෙදෙනා අතරේ මිට ප්‍රථම එබඳු විරුඬකාරකමක් හතුරුකමක් තිබුනු බවක් මම දන්නේනැත.

ක්‍රිස්තියානි ආගමට විරුඬව මාවිසින් ඇසූ ප්‍රශ්නවලින් පළමුවෙනි ප්‍රශ්නය ඉංග්‍රීසි බයිබලයේ තිබෙන "ජෑලස්ගෝඞ්" යන වචනයට දියයුතු හරි තේරුම නොදී නුගත් සිංහල මනුෂ්‍යයන් රවට්ටන්ට බොරු අර්ථයක් ප්‍රකාශකොට සිංහල බයිබල්වල තිබෙන බවයා ඒගැණ කිසි උත්තරයක් මගේ විරුඞකාරයා නුදුන් බවත් ඒ වචනය ඔහුගේ කථාවේදී මතක්කරන්නේවත් නැතුව අත්හැරදමා ගියබවත් මේ සභාවේ සිටින සියල්ලන්ටම මටවාගේම මතකඇත. එසේකළේ මගේ විරුඬකාරයාට ඒගැණ හරි උත්තරයක් දෙන්ට බැරිනිසාවාට කොහෙත් සැකනැත ඔහුට ඒගැණ හරිඋත්තරයක්දෙන්ට නැතුව. මමත් දනිමි ඒබව මේ සියල්ලෝම දැනගන්නාසේක්වා.

තවද මගේ විරුඬකාරයා පාළිභාෂාව නොදන්නෙක් බවට මාවිසින් ගෙණහැර දැක්වූ කාරණා බිඳහෙළන්ට බොහොම තැත් කළේවීනමුත් ඒඋත්සාහය හරිගියේ නැත. ඔහුවිසින් සඞ්ග්‍රහකළාය කියන පොතේ තිබෙන "තවනාමො පවිසච්ඡො ගොතු" යනාදි පාලි වාසගම ඔහු සෑදූ එකක් නොවේ බවත් පාලිභාෂාවට නගා බුරුම අකුරෙන් අච්චුගසා තිබෙන අළුත් තෙස්තමේන්තුවෙන් උදුරා ඔහු විසින් සඞ්ග්‍රහකළ 'ග්‍රන්ථසෙකරය' කියනා පොතට ඇතුළත්කළබවත් ඔහු කීවා මේ සියල්ලන්ටම මතකඇත. අළුත් තෙස්තමේන්තුව අපට අයිති පොතක් නොවේය, ඒක ක්‍රිස්තියානිකාරයන්ගේම පොතක්ය. ඒකේ තිබුනු වාසගම් අතරෙත් මෙබඳු වැරදිවලින්යුත් වාසගම් කැබැල්ලම ඔහුගේ පොතට එකතුකරන්ට තෝරාගත් එකත් පුදුමයක්මය! මගේ විරුඞකාරයා පාලිභාෂාව දන්නෙක්නම් මේ අන්දමේ නින්දිත වැරදිවලින් යුත් වචන සවල්පය හරිනොගස්සා තමන්ගේ සඞ්ග්‍රහවට එකතුකරන්නේ නැත. වැරදි සකසා

ඒ වාසනම් කැබැල්ල එතනුකිරීමෙන් මගේ විරුද්ධකාරයා පාලිභාෂාව නොදන්නෙක් බවට වැඩිය සම්පූර්ණ සත්තකය. මගේ විරුද්ධකාරයා පාලිභාෂාව දන්නෙක්ය කියා එරෝපාකාර මහත්තැන් අතරේ අහවාගණ සිටියා සත්තකය. ඒ සිටිය අඩියට වඩා පහළ අඩියකට මේගැණ උත්තරදීමට ගොස් පැමුණුනාට මට කණගාටුය. එමනිසා මොහුගේ පාලි නොදැනීමේ තරම ඉතා කුඩාපටු නොවේබව මේ සියල්ලන්ටම හැගෙණවා ඇත.

මේඇර මගේ විරුද්ධකාරයා බයිබලය සිංහල භාෂාවට පිටත්කිරීමේ නෙවරදිකම අහවන්ට කළ කථාව කොහෙත්ම ඔබින්නේනැත, මක්නිසාද මාවිසින් පෙන්වා දුන්නේ 1840 දී වැසිලියන් සමාගම නමින් සිංහලභාෂාවට පිටපත්කොට අච්චුගසා තිබෙන බයිබලයේ පදයක් එම සමාගම නමින්ම දෙවනු ප්‍රසිද්ධකරපු බයිබලයේ එම ස්ථානයෙන් අරන්දමා තිබෙන බවය, මගේ විරුද්ධකාරයා කියන්නේ ඒ පදේ ඉහළට ඇද්දුය කියාලාය. තවත් බයිබලය සිංහලට පිට පත්කළ අයගේ උතුන්කම සහ සමර්ථකමය. ඒ උත්තමයන්ට කිසි වෙකුට ගල්කැටයක් ගසන්ට බැරිළු" ඉන්න් මගේ විරුද්ධකාරයාගේ මේ උත්තරය මගේ ප්‍රශ්නයට කොහෙත්ම ඔබින්නේ නැත. ඒබව මේ සමූහයාට තේරුම්යාම පිණිස කියාදෙමි. බයිබලය සිංහලට පිටපත්කළ සමහරෙක් බයිබලයේ තිබෙන පද ඉහළ අදින්ටත් සම හරෙක් පහළඅදින්ටත් ගියාම ඔය දෙගොල්ලම ඒකාකාර උත්තම යෝ වෙන්ටවත් ඒකාකාර සමර්ථයෝ වෙන්ටවත් බැරිය. එකකට එකක් විරුද්ධව තිබෙන මේ බයිබල දෙකින් එකක් වරදමය. යම් ස්ථානයක යම් පදයක් යෙදීමෙන් එහි හර අර්ථය ලැබේනම් ඒක එතන තිබේන්ට නැර වෙනතැනකට ඇද්දම එයින් වෙනස්ව හරි නැත්තාවූ අර්ථයක්ම ප්‍රකාශවේ. එසේ වරන්වර වෙනස්කොට අච්චුගස්සවා තිබෙන බයිබල් වලින් හරියකියා පිළිගන්නේ කොයි බයිබලද? මේ අන්දමට රෙපරමාදු ක්‍රිස්තියානිකාරයෝ වරන්වර තමතමුන්ට හිතෙන සිතෙන හැටියට බයිබලය වෙනස්කර ප්‍රසිද්ධ කරති, රෝමානු ක්‍රිස්තියානි කාරයෝ තමන්ගේ බයිබලය වෙනස් කරන්නේ නැතුව තිබුනු හැටියටම තිබාගෙණ ඉන්න නිසා ඔවුන්ට සතුතිකරන්ට එපී.

ක්‍රිස්තුස් ඊශ්වරයාගේ පුත්‍රාය කියා ක්‍රිස්තියානි ඉගැන්නුම්කාරයෝ කල්කටාවේදි කියන්නේ ඒ රටේ ඉන්න හින්දුවරු රවටන්ට බව වරක් මම කිවා. ඒගැණ මගේ විරුද්ධකාරයා උත්තරදෙන්ට ගත් උත්සාහය ඉතාම නිෂ්ඵල වෙච්ච. මක්නිසාද ඊශ්වර යන වච

නාමයට වෙන අර්ථ තිබුනත් හින්දුවරු අදහන දෙවියන්ට ඔවුන් ඊශ්වර කියන නිසා එහිදී ඒ නම ගත්තේ ඔවුන් රචනා අදහස පිටපය, හොඳයි ක්‍රිස්තියානිකාරයෝ අදහන්නෙත් ඊශ්වරයා නම් ඔහුට "උමයඞ්ගනාව" කියා භාය්‍යාවක් ඉන්නවා වාගේම යෙහෝවාටත් භාය්‍යාවක් ඉන්නවාද? යෙහෝවාටත් භාය්‍යාවක් ඉන්න බව ක්‍රිස්තියානිකාරයෝ නොදන්න නමුත් මම දන්නවා. මට ලැබෙන පැයකදී යෙහෝවාගේ භාය්‍යාව කව්දකියා මම පෙන්වා දෙනවා.

"යෙහෝවා, මනුෂ්‍යයා මැවූ බැවින් තැවුනුසේක" කියා උත්පත්ති 6, 6 පදේ කියා තිබේ. තැවෙන ක්‍රියා සෝකවෙන ක්‍රියා කරන්නේ මෝඩයෝය මෙයින් යෙහෝවාට දිව්‍යඥානයක් නැතිබව පෙන්වා මාවිසින් කළ ඒ කථාවට මගේ විරුද්ධකාරයා කිසි උත්තරයක් දුන්නේ නැත. නොබෞද්ධ ක්‍රිස්තියානි පක්ෂයේ අයවල් බුද්ධපක්ෂයේ අයවල් සමග කළ වාදයකදී ඔවුන් විසින් ප්‍රසිද්ධකරපු "සුධර්මප්‍රකරණය" කියන පොතක් මෙ සභාවේ කියෙව්වා මේ කාටත් ඇහෙන්ට ඇත. ඒ කියවීම මගේ ඒ ඇසීමට උත්තරයක් නොවේය. ඒබව මට වාගේම මේ හිටින සියල්ලන්ටත් හැඟෙන්ට ඇත. ඒ පොතේ තිබෙන සියල්ලටම අපි උත්තරදී ඒ සන්දියේ බිඳහෙළුවා සත්තකය. ඒ අවලඟුපොත මේ වාදය ඉදිරිපිටට ගෙණඒම කොහෙත්ම සෑහෙන්නේ නැත.

යෙහෝවාගේ අසර්වඥකම ගැණ හෙවත් සියල්ල දක්නා ඥානයක් නැතිකම ගැණ මාවිසින් පෙන්වාදුන්නේ ඊශ්‍රාලිතවරුන්ගේ ගෙවල් යෙහෝවාට ඇඳිනගැණීම පිණිස ඒ ගෙවල්වල උළුවස්සේ ලේගා තබන්ට යෙහෝවාම කීබවය. ඒගැණ මගේ විරුද්ධකාරයා දුන් උත්තරය නම්, "ක්‍රිස්තු මැරෙණවාට එක ලකුණක්ය" කියාය. ඒ උත්තරය කොහෙත්ම හරනැත. මක්නිසාද ක්‍රිස්තුස්ගේ මරණයේදී උළුවහුවල ලේගෑමක් කරලා නැත. එමනිසා මොහුගේ ඒ උත්තරය කිසිසේත් පණ්ඩිතගෝචර නොවේ, යෙහෝවා මිසරයේ කුළුඳුලන් මරන්ට ගියද ලේලකුණු දැක ඒ ගෙවල් ඇර සිටිනිසා යෙහෝවාට යම්දෙයක් නිශ්චයකර ගැණීමට ඇහැට පේණ ලකුණක් ඕනැකරණ බව පෙණේ. කණෙකුට කණවැල අල්ලන්ට කෙණෙක් ඕනැකරන්නාක් මෙන් මෙහිදී යෙහෝවාට ගෙවල් ඇඳිනගැණීමට ලකුණක් ඕනැකළා මහත් විහිළුවක්ය.

"පළමුවෙනි භාස්කම අදහානොගත්තොත් දෙවෙනි භාස්කමද දෙවෙනි භාස්කම අදහානොගත්තොත් තුන්වෙනිභාස්කමද කරවා" කියා යෙහෝවා මෝසෙස්ටඉගැන්නුහෙයින් යෙහෝවාටමතුවෙනාදේ

පේණ ඥනයක් නැතිබව පෙන්වා මාවිසින් කළ කථාවට කිසිම උත්තරයක් නුදුන් බව මේ සියල්ලෝම දනගණිත්වා.

තවද මාවිසින් ඇසූ ප්‍රශ්නවලින් දෙකක් ගැණ මගේ විරුඬකාරයා මේවනතුරු කිසි උත්තරයක් දුන්නේනැත. ඒගැණ මතක්කළේවත් නැතිබව මේ සියල්ලන්ට සිහිකරවමි. එනම් යෙහෝවඃ යුදසමග සිට කළ යුඬයේදී යකඩ රථවලට යෙහොවඃ භයවූ කාරණාව ගැණ මාවිසින් කළ කථාවද මෝසෙස්ගේ පුත්‍රයා ජ්නනම් කිරීම ගැණ මාවිසින් කළ කථාවටද යන දෙකය, මේ වැදගත් ප්‍රශ්නදෙක ගැණ මගේ විරුඬකාරයා යම් උත්තරයක් දෙනාවානබා ඒගැණ මතක්කළේවත් නැත. ඒවාගැණ යම් උත්තරයක් දෙන්ට බැරිබවට ඒක ලකුණකි, යකඩට බයවෙන්නෙත් මිනීලේවලට ප්‍රිය වෙන්නෙත් අමනුෂ්‍යයෝ බව මේ සමූහයාට වරක් හොඳවම එත් රුම්කර දුන්නා ඒනිසා මෙගැණ වැඩිය කාරණා මෙහිදී ගෙණ හැර නොදක්කුවත් යෙහෝවඃ වෙන අමනුෂ්‍යයන් මෙන්ම මිනීලේවලට ප්‍රිය බව මෝසෙස්ගේ පුතාට කළ කාරියෙන්ම පෙණේ.

මාවිසින් ක්‍රිස්තියානි ආගමට විරුඬව ඇසුවාවූ ප්‍රශ්නගැණ ක්‍රිස්තියානි පක්ෂයෙන් දුන් උත්තරවලට මට කියන්ට තිබෙන්නේ ඔපමණය.

තවද, ක්‍රිස්තියානිකාරයන් විසින් කියන නොනස්නා ආත්මය කෙබඳු එකක්ද ? ඒක කුමකින් සෑදීතිබේද? ඒක බුඬාගම්කාරයන් විසින් කියන ආත්මයට සමාන නැත්නම් ඒක මොකක්වාගේද ? කියා මීට ප්‍රථම පැයේදී මාවිසින් ඇසුවාය. ඒ ගැණ උත්තරයක් තවම දුන්නේනැත. ඒගැණ උත්තරයක් ඔය දෘෂ්ටියපිට ස්ටගණ විරුඬ පක්ෂයට දෙන්ට බැරුවා සත්තකය.

බුඬධර්මයේ ප්‍රකාශවූ පචස්කන්ඬධර්මයාගේ අදහස තේරුම්ගැණීම නුවනමද අයට දුෂ්කරය. සත්වයෙකුගේ මැරීමත් පරලොව ඉපදීමත් ගැණ තේරුම්ගැණීමද එසේම දුෂ්කරය. සත්වයෙකුගේ මැරීමේදී මේ සත්වයාගෙන් කිසිදෙයක් පරලොව යන්නේ නැත. එසේ යන්නේ නැති නමුත් මේ සත්වයා කරණකොටගෙණ පරලොව උපදින සත්වයා අනිකෙක් නොවේ. සත්වයෙකුගේ චුති ප්‍රතිසන්ධිදෙකේ ආකාර තේරුම්යාම පිණිස බුඬධර්මයේ කියාතිබෙන පාඨයක් දක්වමි. එය මනාව ඇසියයුතු.

,, මාරනන්තිකවෙදනා සන්තානතානං සන්නිපාතංඅසහන්තස්ස ආතපෙබිත්ත හරිතතාලපන්නම්ව කමෙන උපසුස්සමානාසරීරෙ නිරුඬෙසු චක්ඛාදිසු ඉන්ද්‍රියෙසු හදයවත්ථු මත්තෙපතිට්ඨිතෙ කායින්ද්‍රිය

මනින්ද්‍රිය ජීවිතින්ද්‍රියෙසු තංඛනාවසෙස හදයවත්ථු සන්නිස්සිතං
විඤ්ඤාණගරුසමාසෙවිතා සන්තාපුබ්බකානං අඤ්ඤතරං ලද්ධාව
සෙස පච්චයසංඛාර සංඛාතං විසයමාරබ්භපවත්තන්ති තදෙවං පව
ත්තමානං තණ්හාවිජ්ජානං අප්පහීනත්තා අවිජ්ජාපටිච්ඡාදීතාදීන
ච තස්මිං විසයෙ තණ්හා නාමෙති සහජාත සංඛාරාඛිපන්ති සන්තති
වසෙන තණ්හංනමීයමානං සංඛාරෙහි ඛිපපමානං ඔරිමතීරරුක්ඛ
විනිබද්ධං රජ්ජුමාලම්බිත්වා මාතිකාතික්කම කොවිය පුරිමචනිස්සයං
හති අපරඤ්චකම්ම සමුඨාපි තංනිස්සයං ආසාදයමානා අනාසාදයමානං
වා ආරම්මනාදීහි එවපච්චයෙහි පවත්තතී,,

යනමේ පාඨයෙන්ද පෙන්වා තිබෙන්නේ සත්වයෙකුගේ මරණ
යත් පරලොව ඉපදීමත් දෙක දැනගැණීම පිණිස කාරණාය එමනිසා
මේ පාඨයෙහිද සංක්ෂෙප අභිප්‍රාව කියාදෙමි. ඒ ඇසුව මැනව අව්
වෙහි දමනලද අමු තල්කොලයෙහි තිබෙන නිල්පාට ක්‍රමයෙන්
නැතිවීගොස් සුදුපාටවේ. එසේම සත්වයාගේ මරණාසන්නකාලයෙහි
සත්වයාට ඇතුව තිබුනු ඉන්ද්‍රිය ශක්තිය මරණවේදනාව කරණකො
ටගෙණ නැතිවේ. ඉන්ද්‍රිය ශක්තියනම් ඇහැපෙණීම කණඇහීම
ආදියය. එසේ ඉන්ද්‍රිය ශක්තිය නැතුව යාමේදී ඉන්ද්‍රියෝ තුන්දෙ
නෙක් ඇතුල්ව හෘදයවස්තුව ආශ්‍රයකරගණසිටී ඒඉන්ද්‍රියෝතුන්දෙ
නනම් කායින්ද්‍රිය, මනින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය යන තුනය. හෘදයවස්තුව
ආශ්‍රයවූ ඒ ඉන්ද්‍රියෝ තුන්දෙනාගෙන් කායින්ද්‍රිය කියන්නේ ශරීර
යට යමක් සපිණීවූවිට ඒ දැනගන්නා ශක්තියටය, මනින්ද්‍රිය කියන්
නේ මේ වෘක්ෂයය මේ සත්වයාය කියා වෙන්වෙන්කොට සලකන්ට
පුළුවන් ශක්තියටය. ජීවිතින්ද්‍රිය කියන්නේ නොමැරී ජීවත්වෙන
ශක්තියටය. මෙකියනලද ඉන්ද්‍රියයෝ හෘදයවස්තුව ආශ්‍රයකොට පවත්
නාකල්හි මැරෙන්නාවූ සත්වයාට කර්මනිමිත්ත ගතිනිමිත්ත කියා
දෙකක් පෙණේය, එයින් කර්මනිමිත්ත පහළවෙනවාය කියන්නේ
තමා බහුලව කරගණආ හොද හෝ නරක හෝ කරන්නාක්මෙන්
පෙණීමය. ඒ ස්වප්නයෙන් යමක් පෙණෙන්නාක්මෙන් පෙණීමය.
යමෙක් බොහෝකලක් පුරුද්දක් වශයෙන් කරගණආවේ ප්‍රාණඝා
තාදි පව්නම් මරණාසන්න කාලයෙහිත් ඒවා කරන්නාක්මෙන්
පෙණේ. යමෙක් පුරුදුකරගණආවේ දාන සීලාදී පින්කම් නම් ඒවා
කරන්නාක්මෙන් පෙණේ. මෙසේ පෙණෙන්නාවූ කර්මනිමිත්තයන්
අතුරෙන් යමෙකුට කුසලකර්ම නිමිත්තක් වැටහුනොත් ඔහුගේ උත්
පත්තිය සුගතියකවේ, යමෙකුට අකුසලකර්ම නිමිත්තක් වැටහු
නොත් ඔහුගේ උත්පත්තිය දුගතියකවේ. කර්ම නිමිත්තෙන් පසුගති
නිමිත්ත පෙණේ. එනම් උත්පත්තිය කරණ ඉඩම ස්වප්නයෙන්

යමක් පෙණෙන්නාක්මෙන් පෙණීමය. ඒ පෙණීම වන්නේ සුභවශයෙන් නිසා තෘෂ්ණාසහිත සත්වයාගේ සිත එහි ඇලේ, ඒ ඇලීම කාරණකොටගෙණ එහි උපදී. මෙසේ චුති ප්‍රති සන්ධිදෙකින් යුත් සත්වයාගේ චුතිචිත්තය හා සමග ප්‍රතිසන්ධි චිත්තය හටගණී. ශරීරයෙන් පිටවෙලා ගමනේ ගොස් පරලොව උපදින්ට යම්දෙයක් ඇත්තේනැත. එසේදවුවත් මේ සත්වයාගේ පැවති තෘෂ්ණාව නිසා ගති නිමිත්ත පහලවූකල්හි එහි ඇලෙන්නේය. ඒ ඇලීම නිසා උපදින්නේය. එමනිසා පරලොව උපදින සත්වයා අන්‍ය සත්වයෙක් නොවන්නේය. තවද යමෙක් සුගතියක හෝ දුගතියක හෝ උපදිනවා නම් සුභ අසුභ ලකුණු පහලවේ. සුගතියක උපදින ඇත්තාට දිව්‍යවිමානාදි හිත ප්‍රීතිකරණද් පෙණීමෙන් මහත් සන්තොෂයකට පැමිණේ දුගතියක උපදින ඇත්තාට නරකාග්නි ආදි භිතට භයඋපදිනදේ පෙණෙන නිසා මහත් භයට පැමිණේ. මේආදි ආසන්න කාලයෙහි පැමිණෙන ලකුණුද, සත්වයෙකුගේ ගතිය දැනගැණීමට කාරණාවේ. ''අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බා කොටි නපඤ්ඤායති'' යනාදි බුඩදෙශනාවේ ප්‍රකාරයට සංවයෙකුට පටන්ගැන්මක් වත් අන්තිමයක්වත් නැති බව පෙණේ. මෙකී බුඩදෙශනාවද ක්‍රිස්තියානි ආගමේ බයිබලයෙන් ස්ථිරකරත්. කෙසේද—උත්පත්ති 2, 7 වෙනි පදේ "යෙහෝවා දෙවියන්වහන්සේ පොළවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාසිකා තුළෙහි ජීවනයෙහි හුස්ම පිඹසේක එවිට මනුෂ්‍යයා ජීවමාන ආත්මයක් වුයේය" යනමේ කියමනෙන් ගැනෙන්නේ පොළවේ දූවිල්ලෙන් ආදම් කියන පළමුවෙනි මනුෂ්‍යයා සෑදූ බවත් දෙවියන්ගෙ සදාකාල ජීවන හුස්ම ඒ රූපයට ඇතුල් කල බවත්ය. එසින් ඔහු ජීවමාන ආත්මයක්වූ හෙයින් ඔහුගේ ජීවන හුස්ම අමුතුවෙන් මැවූ එකක් නොවේය. ඒ හුස්ම යෙහෝවාගේ හුස්මය. යෙහෝවාගේ සදාකාල ජීවන හුස්මෙන් කොටසක් ආදමට ලැබුනු නිසා ආදම්ගේ ජීවන හුස්මට පටන්ගැම්මක් නැත. දැනට ජීවත්ව ඉන්න සත්වයන්ගේ ජීවන හුස්ම ඔවුන්ගේ පියවරුන්ගෙන්ද, ඒ පියවරුන්ගේ හුස්ම ඒඅැත්තන්ගේ පියවරුන්ගෙන්ද යන ක්‍රමයෙන් දත්වැලක පුරුක් එකින්එක අල්ල අල්ලා යන්නාක් මෙන් ඉහලට කල්පනාකර බැළුවාම ආදම් නැමති මුල් පියාගේ ජීවන හුස්ම කරා පැමිණේ. ආදම්ගේ ජීවන හුස්ම කොහෙන් ආ එකක්දැයි කියා කල්පනා කළාම ඒක පටන්ගැන්මක් නැති! යෙහෝවාගේ ජීවන හුස්මේ කොටසක් බව පෙණේ. යෙහෝවාගේ ජීවන හුස්මට පටන්ගැන්මක් නැතිනිසා සියල්ලන්ගේම ජීවනහුස්මටත් පටන්ගැන්මක් නැති බව පැහැදිලිව පෙණේ. ක්‍රිස්තියානිකාරයෝ

සත්ත්වයාගේ ආත්ම ශරීර දෙකම දෙවියෝ මැව්වාය කියා විශ්වාස කරන්නේවී නමුත් ක්‍රිස්තියානිකාරයෝ කියන ආත්මය උපන්ගැන් මක් නැති එකක් බව මෙයින් තේරුම්ගණින්වා. තවද මෙහි කී කියමනෙන් බුද්ධධර්මයද ස්ථිරවූ බවත් දැනගණින්වා.

තවද ක්‍රිස්තියානිකාරයෝ විශ්වාසකරණ යෙහෝවඃ දෙවිකෙනෙක් නොවන බව පැහැදිලිව ඔප්පුකරන්ට පූර්වන් වැදගත් සාක්ෂියක් තිබේ. එනම්—විනිශ්චයකාරයාගේ පොතේ 11 වෙනි පරිච්ඡේදයේ 19 වෙනි පදේ පටන් 39 වෙනි පදේ දක්වා සඳහන්ව තිබෙන වගන්තිවලින් පෙණෙන්නේ "යප්තාගේ දුවගේ බොටුව කපා පුළුස්සා යෙහෝවඃට පූජාකල බවය" රෙපරමාදු ක්‍රිස්තියානිකාරයෝ "යප්තාගේ දූවගේ බොටුව කපා දවනපූජාකළේ" නැතැයි කියන්ට උත්සාහකරණවා සත්තකය. නමුත් රෝමානු ක්‍රිස්තියානිකාරයන්ගේ බයිබලයේ යප්තාගේ දූවගේ බොටුව කපා දවනපූජාවම කළ බව සපිරකොට තේරුම්කරදී තිබේ. ඒබව මම රෝමානු බයිබලයෙන් ඔප්පුකරන්නෙමි. ඉතින් මෙයින් හැඟෙන්නේ යෙහෝවඃ මිනිලේ වලට ප්‍රිය බවය. මේආදී නිත්දිත බිලිගැණිමට ප්‍රියවෙන්නේ කව්දකියා මෙහි සිටින සියල්ලෝම දනිත්. එමනිසා ඒගැණ මම වැඩිවිස්තාර නොකරම්.

"ක්‍රිස්තුස්වහන්සේ රෑ තුනකුත් දවල් තුනකුත් පෘථිවි ගර්භය තුළ වාසයකරණවා ඇත" කියා මතෙවු 12, 4 පදේ සඳහන්වතිබේ. නමුත් ඒ අනාගත වාක්‍යය හරිගියේ නැත. මක්නිසාද ක්‍රිස්තුස්ගේ ශරීරය සිකුරාද භූමදානකල බවත් ඉරිදට එළිවෙන්ට මත්තෙන් මළවුන්ගෙන් නැගිට්ට බවත් මතෙව් 28, 1 වෙනි පදෙන් ඔප්පුවෙන නිසාය. මේගැණ උත්තරදීමට මගේ විරුද්ධකාරයා නොයෙක් දේ අතින් මටින් දමාගණ උත්සාහකරණවා ඇත. එසේ උත්සාහකළාට ඒක පුළුවන් වැඩක් නොවේය. මේක මම පමණක් ක්‍රිස්තියානි ආගමට විරුද්ධව උපදවාපු ප්‍රශ්නයක් නොවේය. නොවෝද එංගලන්තයේ වැදගත් සභාවකදී "බ්‍රැඩ්ලෝ" කියන පණ්ඩිතයා පවා මේ ප්‍රශ්නය ක්‍රිස්තියානි ආගමට විරුද්ධව ඇසූබව ඉංග්‍රීසි ආරංචිපත්‍ර මාර්ගයෙන්ද අපට දැනගන්ට ලැබුනාය, මේ ප්‍රශ්නය අහන දවසේ එම ස්ථානයෙහි මේරවේ හිටිය පණ්ඩිත "බිෂොප්කල්වට්න්" උන්නාන්සේ හිටිය නමුත් උන්නාන්සේවත් මේගැණ උත්තරදීලා නැත. එසේනමුත් මගේ විරුද්ධකාරයාලාගේ පක්ෂයේ ඇත්තන් මේගැණ උත්තරය කියා විකාරවක් නොදොඩා අරින්නේ නැත. එසේ දොඩව්වත් ඒවා හරනැත්නම් පණ්ඩිතයෝ භාරගන්නේ

නැත. "බිෂොප් කෙලෝන්වත්" වැනි උගත් මහතුන්ට උත්තරදෙන්ට බැරිවූ එකකට මගේ විරුඬකාරයාට උත්තරදෙන්ට පුළුවන්වේ යයි නොසිතමි. එමනිසා මේගැණ කථාව මෙයින් නවත්වමි.

කළු මනුෂ්‍යයින්ගේ රටවල සියල්ලන්ම යමයකට පෙරටුව පැමිණෙන ශුභාශුභ නිමිති ගැණ විශ්වාසකරණ බව කවුරුත් දන්නා ඇත්තකි. එනම් යහපතක් පැමිණීමට පළමු සුභ නිමිත්තක්ද, අයහපතකට පෙරටුව අසුභ නිමිත්තක්ද පැමිණෙය. මීට සාක්ෂි පොත්පත්වලින්ද වෙනත් කාරණාවලින්ද පෙන්වන්ට පුළුවන. එයින් මදක් කියමි. දඹදිව පුරාණ බිම්බිසාර කියා රජකෙනෙක් සිටියාය. ඒ රජහුගේ අග්‍රමෙහෙසිකාවට දරුගැබක් හටගත් කල්හි ඒ දේවියට උපන් දොළදුක නම් තමාගේ ස්වාමිවූ රජාගේ ශරීරයේ ලේබොන්ටය ඒ කල්පනාව ඉෂ්ටවූවායින් පසු කුමාරයෙකු ප්‍රසූතකළාය. ඒ කුමාරයා තමාගේ පියරජ මරා රාජ්‍යයට පැමිණීබව කියාතිබේ. අයහපත් ලකුණෙන් අයහපතක්ම පැමිණි බව මෙයින්ද ඔප්පුවේ. මෙසේම ක්‍රිස්තුස් උපන් කාලයෙහි පහළවූ ලකුණත් යහපත් ලකුණක් නොවේ. එනම්-ක්‍රිස්තුස් උපන් බෙත්ලෙහෙම කියන පලාතේද ඒ අසල පලාත්වලද සිටිය දෑවුරුදු වයස්වූද ඊට බාලවූද සියලු පිරිමි දරුවන් මැරෙව් බව මතෙව් 2, 16 වෙනි පදේ පෙණේ. අඬන්වත් හිනාවෙන්වත් මිස වෙනකිසිදෙයක් නොදන්නා නිරපරාධ ළදරු සමූහයකට මරණය සිඬවුණේ ක්‍රිස්තුස් උපන් නිසාමය. බුදුන් මේලෝකයේ උපන් නිසා ඒ කාලයේදී මෙබඳු අවමඞගල්‍යයක් නොහොත් අසුභ නිමිත්තක් පහළවුනේ නැත. ඒ අපේ උත්තමයා දිව්‍ය ලෝකයෙන් චුතව දඹදිව සුඬෝදන රජ්ජුරුවන් නිසා මහමායා බිසව කුස පිළිසිඳගත් දවසේද උන්වහන්සේ මවුකුසින් බිහිවුනු දවසේද බුදුවූ දවසේද පලමුවෙන් දම්සක් පැවැත්වූ දවසේද සියල්ලන්ගේ හිත් ප්‍රීතිකරණ මඞගල්‍ය ලකුණුම පහළවූබව බුඬාගමේ පොත්වලද වෙනත් බාහිර පොත්වලද පෙණේ. ඒ පහළවූ ලකුණු නම්—ජාත්‍යන්ධයන්ට නොහොත් උත්පත්තියේ පටන් ඇස්නැතුව සිටිය අයට ඇස් ලැබීමද, ජාතිබධිරයන්ට කන්ලැබුනු බවද, ජාති පිලුන්ට සෘජු ගමන්කරන්ට පුළුවන්වූ බවද, නරකාදිවල ගිනි නිවීමද, ප්‍රේතයන්ගේ සාපිපාස නැතිවීමද, සුවකරන්ට බැරි අසාධ්‍ය රෝග සුවවීමද, යනාදි තිස්දෙකක් මඞගල්‍ය ලකුණුය. මෙසේ සියලු දෙනාගේ සිත් ප්‍රීතිකරණ හොඳ ලකුණු උන්වහන්සේගේ උත්පත්තිය නිසා සිඬවූ හෙයින් උන්වහන්සේ ලෝකයා සසරදුකින් ගලවන්ට නොහොත් ලෝකසත්වයන්ට හොඳක් කරන්ට හෙවත් සැබෑ

ආගමක් ප්‍රකාශකරන්නට මෙලොව උපන් කෙනෙක් බවට මෙහි දක්වූ කාරණා සාක්ෂිවේය. ක්‍රිස්තුස් උපන් කාලයෙහි සියළුදෙනාගේම හිත් අප්‍රියකරන්නාවූ ඇසූ පමණකින්ම භය උපදින්නාවූ ලංකාවන් රාක්ෂයකගේමරණයනැමති නපුරු ලකුණ පහළවූහෙයින් ක්‍රිස්තුස් ලෝකයා ගලවන්ට ආ කෙනෙක් නොවන බව ඔප්පුවේය. ක්‍රිස්තුස් උපන් කාලයේ නපුරු ලකුණු පහළවූ හෙයින් ඔහු බොරු ආගමක් ලෝකයාට උගන්වා ලෝකයා නරකාදියෙහි හෙළන්ට ආ නපුරෙක්වාට කොහෙත් සැකනැත. එමනිසා ක්‍රිස්තුස්ගේ සරණ ගෙණ පරලොව ගැලවෙන්ට නුපුළුවන් බව සියල්ලෝම කල්පනාවට ගණිත්වා. බුදුන් උපන් කාලයෙහි කුහුඹියෙකුටවත් උන්වහන්සේගේ උත්පත්තිය නිසා මරණයක් පැමුණුනාය කියා යමෙකුට පෙන්වන්ට පුළුවන්නම් අනික් අය කෙසේ උනත් මම බුද්ධාගම අදහන්නේ නැත.

තවද ක්‍රිස්තුස් අපේ නෑයෙකුත් නොවේය. බුදුන් අපේ නෑයෙකුත් නොවේය. මේ දෙදෙනා පිළිබඳ ආගම් දෙකෙන් යම් ආගමක් සත්‍යනම් ඒ ආගමේ ප්‍රධානියා අපේ නෑයත් වේ සතුරෙකුත් වේ. මේ නිසා සත්‍යආගමක් සොයා නැණීමට සියල්ලෝම උත්සාහ කරත්වා. මේ ඇර මගේ කථාවේදී වේගවත්ව තරහවෙන් වගේ කථාකළේ පිරිස වැඩිනිසාය සියල්ලන්ටම ඇසෙන්ට ඕනෑනිසාය. මේ සිද්ධිය සියල්ලෝම ඒබවද දැනගන්නා සේක්වා.

(කියා මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේගේ කථාව හමාරකරන්ට යෙදුනාය.)

---

( වර්ෂ 1873 ක්වූ අගොස්තු මස 28 වෙනි දින
උදය 8 පටන් 9 දක්වා සිරිමාන්න කතිසේරුනැන විසින්
කළ කථාව. )

යමෙකුට උණරෝගයක් වැලඳී තිබෙන තුරු ඔහුට සියළු මිහිරි ආහර තිත්තය. එසේ මගේ මිත්‍රවූ මේ කථාකාර උන්නාන්සේට මිථ්‍යාදෘෂ්ටිය නැමති උණරෝගය වැලඳී තිබෙන තුරු යහපත්වූ ක්‍රිස්තියානි ධර්මය වැටහෙන්නේ නැත. ක්‍රිස්තියානි ආගමට විරුද්ධව මේ උන්නාන්සේ ගෙණහැර දක්වූ කාරණා ඉතා ගම්භීරයයි ක්‍රිස්තියානි ආගම නුගත් අය සිතනවා ඇත. ඒවා එසේ ගම්භීර ප්‍රශ්න නොවේය, සෙකොලයකට පිකකලක් ගිය ළමයෙක් පවා ඒවාට උත්තර දෙනවා ඇත. ඊට උත්තරදෙන්ට මත්තෙන් මේ සභාවට දැනුම්දියයුතු වැදගත් කාරණයක් තිබේ. එනම්-ක්‍රිස්තියානි පක්ෂය

විසින් බුඩාගමට විරුඬව ගෙණහැරදක්වූ කාරණාවලට බුඬපක්‍ෂය විසින් හරිඋත්තරයක් දුන්නේ නැත, බුඬපක්‍ෂය විසින් දුන්නාවූ උත්තරවලින් ක්‍රිස්තියානි පක්‍ෂයේ කියමන් ස්ථිරඋනා සත්තකය, ඒබව දැනගැණීම පිණිස මදක් කාරණා කියමි. බුඩාගම්කාර මිත්‍රයෙනි, "මනුෂ්‍යයාගේ මරණයේදී පඤ්චස්කන්ධය මෙහිම නිරුඬවෙනවාය. නොමැරී ඉතුරුවෙන කිසිම වස්තුවක් නැතැ"යි කියා බුඩාගමේ උගන්වා තිබෙනවාය. ඒ ඉගැන්වීම ඉතා විස්තරලෙස පළමුවෙනි පැයේදී පෙන්වා දුන්නා ඇත ඒවාගැණ මේ උන්නාන්සේ දුන් උත්තරවලින් අපේ කියමන් ස්ථිරකළා පමණක එමනිසා ඒගැණ මම වඩා කියන්නේ නැත ආත්මය ආකාර රහිතය එමනිසා ඒක අසවල් හැටිය කියා පෙන්වා දෙන්ට බැරිය අරූපි බ්‍රහ්මලෝකවල ඉන්න බ්‍රහ්මයන්ට ශරීරයක් නැත සිත පමණක් පවතිනවාය කියා බුඩාගමේ උගන්වා තිබෙනවාය ආත්මයේ අන්දමත් එලෙසය කියා අපට කියන්ට පුළුවන

දෙවියන්වහන්සේ ඊෂ්‍යාවන්ත කෙනෙක කියා ඔප්පුකරන්ට මේ උන්නාන්සේ කළාවූ උත්සාහය නිෂ්ඵලය මක්නිසාද අනන්ත ගුණයෙන් යුත් උන්වහන්සේ ඊෂ්‍යාව ඇති කෙනෙක් නොවේය උන්වහන්සේට "ජ්වලිතවූ" දෙවිකෙනෙක කියා බයිබලයෙහි තිබෙනවා සැබෑය උන්වහන්සේට දියයුතු ගෞරවය අන්කෙනෙකුට දෙනවාට උන්වහන්සේ අකමැතිය ඒ අකමැත්ත උන්වහන්සේ කෙරෙහි පිහිටා තිබෙන නිසා උන්වහන්සේට "ජ්වලිතවූ" දෙවියෝය (!) කියනවාය

මිශ්‍ර දේශ වාසීන් පිටම දෙවියන්වහන්සේ වසත්ගත දසයක් එව්වා සැබෑය ඒනිසා දෙවියන්වහන්සේ සියල්ලදත් කෙනෙක් නොවේයයි මුන්නාන්සේ කීවාය වසත්ගත දසයක් මිශ්‍ර වාසීන්ට එව් කාරණාවෙන් දෙවියන්වහන්සේගේ සියල්ල දත් ඥානයට කිසි පලුදුවක් නැත.

සිප්පෝරා විසින් ඇගේ පුත්‍රයා ජිනනතම්කොට ඒ චර්මය විසිකෙළේ මෝසෙස් ඉදිරියටය. ජයහෝවඃවහන්සේ ඉදිරියට විසිකළාය කිම මිථ්‍යාවක්ය. ඒ බව බයිබලයෙහි 'ඔහු' කියා යොදාතිබෙන සර්වනාම වචනයෙන්ම ඔප්පුවේ.

දෙවියන්වහන්සේ යකඩ රථවලට භයවූනාය කීම වැරදිය මක්නිසාද යකඩරථ 900 යුක්ත සේනාවකින් ජයගත්බව විනිශ්චය 3 පර 3—15 වෙනි පදවලද නිවරථ 600 යකින් යුත් සේනාවකින් ජයගත් බව නික්ම 14, 7 වෙනි පදේද පෙණේ. නමුත් යුදට යකඩ

රථවලින් ජයගන්ට බැරිඋනේ ශ්‍රද්ධාවේ මදිකම්න්ය. යෙහෝවාඃවහන්සේ යුදා සමග සිට සියල්ලෙන් ජය ලැබාදුන්නාය. එසේදවුවත් යුදා සමතලාවේ වැසියන්ගේ යකඩ රථ දැක ඔහු භයවුනාය ඒ භයවීමෙන් ඔහුගේ ශ්‍රද්ධාව පිරිහුනාය ශ්‍රද්ධාව පිරිහීමෙන් ඔහු ඒ යුද්ධයෙන් පරාජය උනා සත්තකය, එමනිසා යෙහෝවාඃවහන්සේ යුදා සමග සිටියත් එයින් උන්වහන්සේට පලුදුවක් නැත.

"දෙවියන්වහන්සේ ආදම්ගේ නාසිකා තුලට ජීවනයේ හුස්ම පිඹාය ඒ පිඹීමෙන් උන්වහන්සේගේ හුස්ම ආදම් තුලට ගියාය" කීම ලාමක කථාවක්ය, යම්කෙනෙක් තවත් කෙනෙකුගේ කණට තෙල් ටිකක් පිඹාය කීවාම ඒ පිම්බඅයගේ ආත්මයෙන් කොටසක් කණ ඇතුලට ගියාය කියා මේ සිටින්නන්ගෙන් එක්කෙනෙක්වත් සිතුව ගණ්ද? නාසිකාතුලට ජීවනයේ හුස්ම පිඹාය යනු මනුෂ්‍ය ව්‍යවහාරයෙන් කියාතිබෙන කීමකි එහි අභිප්‍රාවනම් දෙවියන්වහන්සේ මනුෂ්‍යයා තුල ආත්මය පිහිටෙව්වාය නොහොත් තැබුවාය යනබව යයි දතයුතු,

යප්තාගේ දුව මරා පූජාකලාය කියා තේරුම්ගන්ට හේතුවූ කිසිවක් නොපෙණේ. මනුෂ්‍ය පූජාව දෙවියන්වහන්සේ තහනම්කර තිබෙනවත් ඇර යමෙකු විසින් එබදු ගිවිසීමක් කරගන්තොත් නොහොත් මනුෂ්‍යයෙක් පූජාවට කැපඋනොත් ඒගැණ කරන්නම නිසි ව්‍යවස්ථා පණවා තිබෙනවාය ඒනම් පූජකයාට මුදල් ගෙවා මුදන්නට කියාය. "ඔහු වුන පොරොන්දුව ලෙස ඈට කලාය" කියා සුධලියවිල්ලේ තිබෙනවා සත්තකය. යප්තාගේ පොරොන්දුව නම් "යුද්ධයෙන් දිනා ගෙදර එනවිට ඉස්සරහට සම්භවුන මොකෙක්, නමුත් යෙහෝවාඃවහන්සේට දවන පූජාවක් කරන්වය ඒ පොරොන්දුව එලෙස ඉෂ්ටකලාය" කියාතිබීමෙන් ඈ දවන පූජාවෙක් යෙහෝවාඃවහන්සේට පූජාකෙලේ නැත කියන්ට බැරිනමුත් ඈ ඇය හෙලින් සමග දෙමසක් කන්‍යාකම ගැණ වැලපුනා මිසක් මරණය ගැණ වැලපී නැති හෙයින් ඈ යෙහෝවාඃවහන්සේට කැපකලා පූමුණක කියන්ට පුළුවන හොඳයි යප්තා එසේකෙලේවීනමුත් දෙවියන්වහන්සේ ඊට එකඟඋනේවත් ඊට අවසර දුන්නේවත් නැත්නම් උන්වහන්සේට ඉන් කිසිම කිළිටක් නැත,

"මනුෂ්‍යපුත්‍රයා දවල් තුනකුත් රෑ තුනකුත් පොළව ගැබේ හෙවත් මිනීවලේ හිටිනවා ඇත" යන කීම ගෙණහැරදක්වා එරෝපයේ පඩිතයෙක්ය කියා නාස්තිකදෘෂ්ටි ගත් කෙනෙකුන් සරණකරගණ බිෂොප් කොලොටන් වන් ඊට එකතුකරගණ මගේ මිත්‍රයා මිථ්‍යාවක්

ප්‍රකාශකළාය ඒප්‍රශ්නයට වචන ස්වල්පයකින් උත්තරදෙමි. අපි දවස් තුනය යන්නෙ නියමයක් තේරුම්ගන්නවාද? එම තේරුම දක්වනු පිණිස 'යුදෙව්' භාෂාවේ වචන ව්‍යවහාරයේ හැටියට දවල් තුනකුත් රෑ තුනකුත්යයි භාවිතා කළාය, දවසකින් ඉතා ස්වල්ප කොටසක් අසුඋනත් මුළු දවසම අල්ලා කථාකරණ සිරිතක් යුදෙව්වරුන් අතරේ පැවතුනාය. ඒ ප්‍රකාරයට දවල් තුනකුත් රෑ තුනකුත්යයි කියන්ට පුළුවන. මේගැණ මිටවඩා යමක් කියන්ට ඕනෑකරන්නේ නැත.

ක්‍රිසතුස්වහන්සේ උපන් දවසේ දහස්ගණන් පිරිම්දරුවන් මැරූන්කැවාය කියා මගේ මිත්‍රයා කීවා මේ කාටත් ඇසෙන්ට ඇත, ඒ දරුවන් මැරුන්කැවේ ක්‍රිසතුස්වහන්සේ උපන් දවසේ නොවේය, උන්වහන්සේ උපන් දවසේ එහෙම යමක් සිඩඋනාය කියා මේ බයිබලයෙන් කිසිවෙකුට පෙන්වන්ට බැරිය. ක්‍රිසතුස්වහන්සේ ඉපදිලා අවුරුදු දෙකක් පමණ පසුඋනායින් පසු එවකට තිබිය 'හෙරෝද්' නම් දුෂ්ට රජා රාජ්‍යය ලෝභයෙන් ක්‍රිසතුස්වහන්සේ මරණ අදහස පිට ක්‍රිසතුස්වහන්සේ උපන් බැත්ලෙහෙමේද, ඒ අසල ගම්වලද, සිටි දැවුරුදු වයස්වූද, ඊට බාලවූද. පිරිම්දරුවන් මැරෙව්වා සත්තකය. එහින් ක්‍රිසතුස්වහන්සේට කිසි අපහසයක් ඇත්තේ නැත. එමනිසා මේගැණ මිටවඩා උත්තර ඕනෑනොකරයි,

තවද "බුදුන්ගේ ඉපදීම කරණකොටගෙණ කුහුඹියෙක්වත් මැරුණේ නැතැයි මේ උන්නාන්සේ කීවාය එසේ මැරුණු බවක් පෙන්වන්ට පුළුවන්නම් අනිත් ඇත්තෝ කොහොම වෙතත් මේ උන්නාන්සේ බුඩාගම අදහන්නේ නැතැ"යි කිවා මේ සමූහයාටත් ඇසෙන්ට ඇත. එමනිසා මේ උන්නාන්සේ බුඩාගමෙන් අත්හරවන්ට කුහුඹියෙකුට වඩා ලොකු කෙනෙක් මැරුණු බව මාවිසින් ඔප්පුකර දෙමි බුදුන්ගේ මෑනියෝ බුදුන් උපන් සත්දවසින් මැරුණාය කියා බුඩාගමේ පොත්වල තිබේ කුහුඹියෙකුට වඩා බුදුන්ගේ මෑනියෝ ලොකුනැද්ද? මේ ඇර බුදුන් උපන් දවසේ අභීත කේසර සිංහනාදයක් කළාය කියා තිබේ සිංහනාදයට මනුෂ්‍ය තිරිසන් සත්වයෝ මැරෙණවාය කියා බුඩාගමේ පොත්වල තිබේ අකනිටා බ්‍රහ්මලෝකයට ඇසෙන තරමට කළාය කියන ඒ සිංහනාදයේදී කොපමණ සත්වයෝ මැරෙන්ට ඇද්ද? තවත් නොයෙක් වතාවලදී බුදුන් නිසා අනන්ත සත්වයෝ මැරුණාය ඒවා ඔප්පුකිරීමට මාවිසින් මාන්සි ගන්නේ නැත, මේ වතාවට මෙපමණ ඇතිනිසා මෙයින් නවත්වමි.

සුභාසුභ ලකුණු ගැණ මේ උන්නාන්සේ තෝරාපු හැටියට අපි තෝරන්නේ නැත. අපේ තේරුම සම්පූර්ණයෙන්ම අනිත්අතට වන බැවින් එයත් අසා සාධාරණව තිබෙන්නේ කාගේ තේරීමදැයි කල්පනාකරණ මෙන් මේ සමූහයාගෙන් ඉල්ලමි. ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට ආවේ මේ සිටින මනුෂ්‍යයෝ පව්කොට නිරායින්නට පත්වෙන්ට සිටින නිසා ඔවුන් නරකාදියෙන් ගලවන පිණිසය.

එමනිසා උන්වහන්සේ ලොවපහලවූවිට මෙහි සිටි හෙරොද්ආදි පාපතරයෝ "මෙන්න අපේ පාප සැපත විනාශකරණ සතුරා එන වාග මොහු පාපරාජ්‍යය විනාශකොට ධර්මිෂ්ඨකමේ රාජ්‍යය පිහිටුවන්ට ආවාය. මොහු නසමුව" කියා යක්ෂයාගේ උපදෙසින් උත්සාහ කරමින් නොයෙක් අසුභ ලකුණු පහලකලාය ඒ අසුභ ලකුණු පහලවීමෙන් ක්‍රිස්තුස්වහන්සේ පාපයේ සතුරා වග ඔප්පුවෙන්නේය. මගේ මිත්‍රයා විසින් ක්‍රිස්තියානි ආගමට විරුඩවගෙණහැරදක්වූකාරණාවලට උත්තර මෙපමණ සෑහෙන හෙයින් මෙයින් නවත්වා බුඩාගමේ අසත්‍යකම පෙන්වීමට මදක් කාරණා කියමි.

බුඩාගම්කාර මිත්‍රවරුනි,

නුබලා විශ්වාසකරගණ එන බුඩාගම දරාතිබෙන්නේ තුන්පිටකය කියන පොත්වලය. ඒ පොත් ලිව්වේ බුදුන් උපන් රටේදීවත් බුදුන් උපන් කාලයේදීවත් නොවේය. ඒවා ලිව්වේ බුදුන් මැරිලා හාරසිය පනස්තුන් අවුරුද්දක් පසුගියායින්පසු දඹදිවට බොහොම දුරරටක්වන මෙම ලඞ්කාවීපයෙහි මාතලේ කියන පලාතේ තිබෙන අළුවිහාරයේදීය. ඒබව මහවංශය ආදිපොත්වල පෙණේ. ඉතින් මිත්‍රවරුනි, මෙපමණ දුර රටකදී මෙපමණ කල් ගියායින් පසු ලිවුවාවූ ධර්මය බුදුන් විසින් දේශනාකල ධර්මයමයි කියා විශ්වාසකරන්ට පුළුවන්ද ?

තවද ගෞතම බුදුන් විසින් බුඩත්වය ලබාගැණීම පිණිස කල කුසල්වලින් එකකුසලක්නම්, අඹුදරුවන් දන්දීමයි. වෙස්සන්තර රජ දරුවන් දෙන්නා දුන්නේ කොපමණ කෲර අදහසකින්දැයි කියා වෙස්සන්තර ජාතකය කියවන කාටත් දැනගන්ට පුළුවන. එපමණක් නොව තමාගේ ස්ත්‍රී දනට දුන්නාය අඹුදරුවෝ කාටවත් දෙනවා තබා එක මාසයක්වත් ඔවුන්ට සංග්‍රහනොකර ඇරියොත් ආණ්ඩුව ඔවුන්ට අච්චුකරනි දූන්කෝලයේ පින්ගන්ට යමෙක් අඹුව කාටවත් දුන්නොත් වෙනඅය ගල්ගසති. ඇස් ඉස් මස් ලේ දන්දීම ගැණ කියාතිබෙන්නේ මහපොළවේ පස් පරදවා මස් දන්

දුන්නාය මහමුහුදේ දිය පරදවා ලේ දන්දුන්නාය මෙරගල් පරදවා ඔටුනු පලන් හිස් දන්දුන්නාය මේවා මෙපමණ දෙන්ට තමුන්ම නසාගන්ට ඕනෑය තමුන්ම නසාගැණීමත් අනුන් මරන්නාවාගේම භයානක පාපක්‍රියාවක, මේවා බුඩාගමේ පොත්වන අමාවතුර ආදි පොත්වල තිබේ, බුඩත්වය ලබාගැණීම පිණිස බුදුන් කළ පින් මේවා තමාය මේවත් පින්ද කියා නැනවත් ලොකයා කල්පනා කරත්වා.

බුදුන්ට තිබුනාය කියන සර්‍වඥතාඥනාය මහ පුදුම අන්දමේ එකක්ය. මක්නිසාද ඔහුගේ ඒ ඥණයට ඇතිඅය නැති හැටියටත් නැතිඅය ඇති හැටියටත් ඔහුට පෙණීතිබෙනවාය. ඒබව ඔප්පුකරණ පිණිස මදක් කාරණා කියමි. බුදුන් බුදුවුනායින් පසු තමන්ගේ ධර්‍මය දේශනාකළොත් තේරුම්ගන්ට කෙනෙක් නැතැයි කියා බණ නොකියන්ට සිතටගත් බවද ඉන්පසු බ්‍රහ්මයා ඇවිත් බණ තේරුම් ගන්ට පුළුවන්අය සිටිනවායයි කීවාම බණකියන්ට සිතටගත් බවත් මහවග කියන පොතේ පෙණේ. තවද බුදුන් බණකියන්ට කාට යුතු දැයි කියා බැළුවාම ආලාරකාලාමනම් තාපසයාට බණකියන්ට ඕනෑ යකියා සිතූබවත් ඒ කාලයේදී ඔහු මැරීලා බවත් දේවතාවෙක් දැනුම්දුන්නාම උද්දකරාම පුත්‍රඝා නම් තාපසයාට බණකියන්ට ඕනෑ යයි සිතුවාය. ඔහුත් එවකට මැරීලා බව දේවතාවෙක් විසින් දැනම් දුන්නාය. මේවත් ඉහතකී පොතේම තිබේ. ඉතින් මේ කියමන් වලින් ඔප්පුවෙන්නේ බුදුන්ට දිව්‍යඥනයක් නැති බවය. බුදුන්ට දිව්‍යඥනයක් නැති බව බණ තේරුම්ගන්ට පුළුවන් අය නැතැයි කියා පළමුකොට සිතා දෙවනු බ්‍රහ්මයාගේ ආරාධනාවෙන් පසුව බණ තේරුම්ගන්ට පුළුවන් අය සිටිනවාට ඒත්තුගෙණ බණකියන්ට සිතටගත් එකින්ද මැරුණාවූ දෙදෙනෙකුට බණ කියන්ට කල්පනාකළ එකින්ද පෙණේ. බුදුන්ට යන්තන්වත් ඥනයක් නොතිබුනු බවට කියන්ට මේඇර නොයෙක් කාරණා තිබේ ඒවා කියන්ට මට ලැබීත්බෙන කාලය මදිය ඒනිසා මෙසින් නවත්වමි

බුඩාගම්කාරයනි, තුබලා බුදුන් දහම් සංඝයා යන තුන්සරණ යක් කොරේ සරණගමණය කරණ නිසා ඒගැණත් කාරණා සවල්ප යක් කියමි. පළමුකොට :“ බුඩංසරණංගච්ඡාමි ” කියාද, දෙවනුව “ ධම්මංසරණං ගච්ඡාමි ” ක්‍යාද, තුන්වෙනුව :“සඞ්ඝංසරණංගච්ඡාමි” කියාද සරණයති බුදුන් දැනට ජීවත්ව නැත බුදුන් මැරීලාය මැරිච්ච බුදුන්ගෙන් සරණගියාට ඇති ඵලය මොකද? ධර්‍මයෙන් තුබ ලාට සරණ තිබෙනවාද? ධර්‍මය කියන්නේ පූස්කොලවල ලියාතිබෙන පොත්ය ඒ පොත් තුබලාගේ සරණීන් පවතිනවා මිස ඒපොත්

නුඹලාට පිහිටවෙන්නේ කොහොමද ? නුඹලා ගන්න සඞ්ඝ සරණය ගැණ ඇත්තටම පුදුම නොවී බැරිය ඒ ගැණ මම වඩා කාරණා නොදක්වුවාට මේ හිටින සියල්ලෝම සඞ්ඝයාගේ තරම දන්නවා ඇත මේ පව්වුවූ පවුකාර මනුෂ්‍යයන් කෙරේ සරණයාම කෙපමණ මෝඩකෑකද? මේ සඞ්ඝයා කියන අය ක්‍රෝධ මෝහ රාග තණ්හා මාන්න ආදීයෙන් පිරීසිටින්නාවූ කොයිතරම් පාපයක් නමුත් කරන්ට කැමති අය බව නුඹලා නොදනිද්ද? මේ ලංකාවේ සිටින සඞ්ඝයා සියම් අමරපුර කියා සමාගම් දෙකකට අයිතිය. ඒ සමාගම් දෙකින් එක සමාගමක අය අනිත් සමාගමේ අයට සරණවත්, සිල්වත්, උපසම්පදාවවත්, නැතකියා ඒ ගැණ බොහෝ කාරණාවලින් ඔප්පුකර තිබේ. අනිත් සමාගමේ අයත් ඒවාගේම තමන් විරුඬ පාශ්චියට සරණසිල් උපසම්පදා නැතකියා ඔප්පුකර තිබේ. මෙදෙගොල්ලම තමතමන්ගේ කියමන් ස්ථිරකරගැණීමට වැදගත් කාරණා ගෙණහැර දක්වා තිබෙන බව කිරන්පත්‍ර සූණොපායනී, ආදී ප්‍රසිඬ පත්‍ර කියවන කව්රුත් දනිති. මෙයින් නුඹලා පිළිගන්නේ කාගේ කීම්ද? මෙයින් එකගොල්ලකටවත් එකතුනොවී දෙගොල්ලගේම කීම් පිළිගෙණ මොවුන් මහණකමක් නැති දුස්සීල පාපින්බව සලකා මොවුන්ගේ සරණ නොගෙණ අත්හැරදැමීම නුඹලාට යුතු නොවේද? මිත්‍රයනි, ඉතින්වත් නුඹලා ගන්න තුන්සරණයේ තිබෙන නිෂ්ඵලකම සලකා ඒ ඇරදමා සියළු ලෝකය මවා ආරක්ෂාකරන්නාවූ දෙවියන්වහන්සේගේ සරණය ගනිල්ලා එකම ගැලවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහාගනිල්ලා එවිට නුඹලා ගලවනු ලැබේ.

(කියා **සිරිමාන්න** කතිසේරු තැනගේ කථාව
අවසනිමවන්ට යෙදුනාය.)

---

(1873 ක්වූ අගෝස්තු මස 28 වෙනි දින උදය 9 යේ පටන්
10 දක්වා මොහොට්ටිවත්තේ **ගුණානන්ද** උන්නාන්සේ
විසින් කළ කථාව.)

මාගේ මිත්‍රවූ මේ සිරිමාන්න කතිසේරුතැන බුඬාගමට විරුඬව මෙපමණවේලා කළාවූ කථාව හාත්පසින්ම පණ්ඩිතගොචරවූ කථාවක් නොවේය. මොහු පළමුවෙන්ම කථාකරන්ට පටන්ගත්තේ උණරෝගයක් ගැණය. ඒ ගැණ යමක් කියන්ට ඕනැකරන්නේ නැත. මක්නිසාද–ඒක නිෂ්ඵල කථාවක් නිසාය. තවද මේ කතිසේරුතැන බුඬපක්ෂයෙන් ඉෂ්ටනොකළ කරුණ ඉෂ්ටකළාය කියා

බොරුවක් කීවාය. එනම් "ක්‍රිස්තියානි පක්‍ෂයෙන් පංචස්කන්ධය ගැණ යමක් කීවානම් ඒ සියල්ල බුද්ධපක්‍ෂයෙන් සම්පූර්ණකළාය" යන කීමය. පංචස්කන්ධය ගැණ ක්‍රිස්තියානි පක්‍ෂයෙන් බුද්ධාගමට විරුද්ධව යමක් කීවා ඇද්ද ඒ සියල්ලම බුද්ධපක්‍ෂයෙන් උත්තරදී බිඳහෙළූ බව මේ සියල්ලටම මතකඇත. එමනිසා පංචස්කන්ධය ගැණ වැඩිපුර යමක් මෙහිදී කියන්ට ඕනෑකරන්නේ නැත.

තවද මගේ මිත්‍රයා "ජැලස්ගෝඩ්" යන වචනය ගැණ උත්තර දුන්නා කදිමයි! එසින් මගේ කීම සම්පූර්ණනා සත්තකය. හෙබ්‍රෙව් භාෂාවේ මේ කතිසේරුනැත "ජැලස්ගෝඩ්" යන වචනය තේරුවේ යෙහෝවාවහන්සේ "ඊෂ්‍යාවන්ත" දෙවිකෙනෙක් බව හැඟෙන්ට මය. ඒබව ඔහුගේ මේ කියමනෙන් පෙණේ. "දෙවියන්වහන්සේ තමන්වහන්සේට ලැබෙන ගෞරවය අනුන්ට ලැබෙනවාට අකමැතිය එසේ අකමැති නිසා දෙවියන්වහන්සේට 'ජැලස්ගෝඩ්' යයි කියනවාය" ඉතින් මොහුගේ මේතේරුම "ජ්වලිත" * දෙවිකෙනෙක යන තේරුමට කොහෙත්ම එකඟවෙන්නේ නැත. යමෙකුට ලැබෙන හොඳට යමෙක් අකැමැතිනම් "ඊෂ්‍යාවන්ත" කියන්නෙත් ඒක තමයි. "ලෙඩෙන් වල්ගේය" කීවාවගේ මුන්නැහේගේ තේරුමත් නරකනෑ !!

පළමුවෙනි භාෂ්කම අදහානොගත්තොත් දෙවෙනි භාෂ්කමද, දෙවෙනි භාෂ්කම අදහානොගත්තොත් තුන්වෙනි භාෂ්කමද, කරන්ට යෙහෝවා මෝෂෙස්ට ඉගැන්නු හෙයින් යේහෝවාටම යමක් නිශ්චයකරන්ට බැරිබව ඔප්පුකිරීම පිණිස මම කළ ඒ කථාවට මේ කතිසේරුනැත මිශරයට පැමිණුන වසංගත වගයක් ගැණ ප්‍රකාශ කළා. මිශරයට පැමිණි වසංගත ප්‍රකාශකළ එක මගේ කථාවට උත්තර නොවේය. ඒ බව මෙහි සිටින සිහිඇති කාටත් තේරෙන්ට ඇත; එමනිසා මේගැණ වැඩිය කථානොකරමි.

මෝසෙස්ගේ පුතාගේ "ජිනනනම්" කිරීමගැණ මම කළ කථාව මේ කතිසේරු නැතට කොහෙත්ම තේරීනැත. තේරුනානම් ඒ ජිනනනම් කරපු "කැබැල්ල මෝසෙස් ඉදිරියට දැම්මාය" යන උත්තරය දෙන්නේ නැත. යේහෝවා මෝසෙස් මරන්ට සෙවූවිට ඒබව මෝසෙස්ගේ සත්‍රිවන "සිප්පෝරා" දුන තමාගේ පුතා ජිනන නම් කොට ඒ කැබැල්ල පුද, මෝසෙස් මරණයෙන් නිදහස් කරගත්

* ජ්වලිත යන්නට 'ශබ්දකෝෂාංමමහානිධි' යෙහි තෝරාතිබෙන්නේ දීප්තේ, උජ්වලේ, කීයාලයි එහි තේරුම 'බැබලීමය;

බව බයිබලයෙහිපෙණේ. මරන්ට සෙවූ කෙනෙකුන්ට ඒපූජාව දෙන්ට ඕනෑවා මිස මරණයට පත්ව හිටි මෝසෙස්ට කොහොත්ම දෙන්ට ඕනෑනැත. ජීන්තනම් කිරීම යේහෝවඃගේ ආඥාවක්ළු. ඒ ආඥාව කඩකල නිසා මෝසෙස් මරන්ට සෙවූවායයි මොහු කීවා, ඒ උත්තරයෙන්ද යේහෝවඃ මිනීමස් මිනීලේ වලට ප්‍රියබව ඔප්පු වෙනවා සත්තකය. එමනිසා මේගැණ කරණ කථාවද මෙයින් නවත්වමි.

යකඩරථ ගැණ මාවිසින් ඇසූ ප්‍රශ්නයට මගේ මිත්‍රවූ මේ කතීසේරු නැන දුන් උත්තර හාත්පසින්ම වැරදිය, මක්නිසාද "යකඩ රථ 900 කින් යුත් සේනාවකින් යේහෝවඃවහන්සේ ජයගත් බව විනිශ්චය. 3 වෙනි පරිච්ඡේදයේ 3 වෙනි පදේ පටන් 15 වෙනි පදේ දක්වා සඳහන්ව තිබෙනවාය"යි මේ කතීසේරුනැන කීවා මේ කාටත් ඇසෙන්ට ඇත, එබඳු කීමක් බයිබලයේ එම පදවල සඳහන් වනැත. බයිබලයේ නැති කියමන් ඇතැයි කියා මෙබඳු වැදගත් සභාවක ප්‍රකාශකළා පුදුමයක්ය. හාත්පසින්ම මිථ්‍යාආගමක් විශ්වාසකරණ අයට ඉඳහිටලා මෙබඳු බොරුවක් කීවාට ඒක එප මණ බරපතල නොවේය! කෙපමණ බොරු කීවත් යේහෝවඃ යකඩට හයවූනේ නැතැයිකියා ඔප්පුකරන්නට බැරිය. හොඳයි යුදෘගේ ශ්‍රද්ධාව මදිකමින් ඒ යුධයෙන් යුදට ජයගන්ට බැරිවූනාය කියන නිසා එයින් යේහෝවඃට සියල්ල දක්නා දිව්‍යඥානයක් නැතිබවද පැහැදිලිව මේ සභාවට වැටහෙන්ට ඇත. යුදෘගේ ශ්‍රද්ධාව මදිකමින් ඒ යුධයෙන් ජයගන්ට බැරිඋනාය. යේහෝවඃවහන්සේ යකඩට හයඋනේ නැත යන මේ කියමන් මේ කතීසේරුනැන කීබව මේ කාටත් ඇසෙන්ට ඇත. හොඳයි යේහෝවඃ යකඩට හයඋනේ නැත් නම් යෙහෝවඃ යුදෘ සමග සිටලත් ඒ යුධයෙන් ජයගන්ට බැරිඋණේ මන්ද? යුදෘගේ ශ්‍රද්ධාව මදිකමින් පැරදුනාය කියනවානම් ශ්‍රද්ධාව මදවන කෙනෙකුන්ට සියල්ලදක්නා ඥාණයක්ඇති යෙහෝවඃ එකතු උණේ ඇයි? එකක් හරිගස්සන්ට ගියාම අනිකට වෙන වැරද්ද නොපැණී මෙබඳු උත්තරදීම අඥානගොචරය. ඉතින් මේගැණ මෙප මණ සෑහෙන නිසා මෙයින් නවත්වමි.

තවත් මගේ මිත්‍රයා කණට තෙල්පිඹීම ගැණ කල කථාවත් නිෂ්ඵලය. කණට තෙල්පිඹිනවාය යන කීමෙන් හැඟෙන්නේ කණේ තෙල් වක්කර ඒවා ඇතුල්වීමට පිඹීමය. එයින් ජීවන හුස්මක් පිඹාය කියා හැඟෙන්නේ නැත. ලෙඩෙකුගේ කණේ තෙල් වත්කොට කණට පිඹිනවාය කියනවා මිස කණට ජීවන හුස්ම පිඹින

වාය කියා කවරෙක්වත් කියන්නේ නැත. එමනිසා මොහු ගෙණ හැරදැක්වූ තෙල් පිඹීමේ කථාව ප්‍රලාපයක්ය. ආදම්ගේ නාසිකාතුලට යෙහෝවඃ ජීවන හුස්ම පිඹාය කීමෙන් හැඟෙන්නේ යෙහෝවඃගේ ජීවන හුස්ම ආදම්ගේ ශරීරයට ඇතුළ්කළ බවය. යෙහෝවඃගේ ජීවන හුස්ම ආදම්ගේ ශරීරයට ඇතුළ්කෙළේ නැතිබව පෙන්වන්ට මොහුගේ මේ තෙල්පිඹීමේ උදාහරණය කොහෙත් සෑහෙන්නේ නැත. කණේ තෙල් වක්කරණ අයවල් තෙල්වක්කර දෙවනු පිඹින්නේ තෙල් ඇතුළ්කිරීමට ඔවුන්ට ආනුභාවක් බලයක් නැති නිසාය, එසේම යෙහෝවඃටත් ජීවනය ඇතුළ්කරන්නට බලයක් නැති නිසා පිඹාද? ඉතින් මේගැණ මීටවඩා යමක් කීම නිෂ්ප්‍රයෝජන නිසා වඩා නොකියමි,

තවද මගේ මිත්‍රයා යප්තාගේ දුවගැණ උත්තරදුන්නේ ඇගේ බොටුව නොකැපූ බවටය. "ඇ වෙනුවට මුදලක් යෙහෝවඃට ගෙවා ගලවාගත්තාය" කියාය. හොඳයි එසේගලවාගත්තානම් "යප්තාගේ පොරොන්දුව ඉෂ්ටකළාය" කියා බයිබලයේ ලියාතිබෙන්නේ මන්ද? යප්තාගේ පොරොන්දුවනම් යුධයෙන්දිනා ගෙදරඑනවිට මොකෙක් හමුන් ඉස්සරහට ආවොත් ඒ ආ එකා යෙහෝවඃට දවන පූජාවක් කරන්ටය. "ඒ පොරොන්දුව එලෙස ඉෂ්ටකළාය" කීමෙන් හැඟෙන්නේ ඔහුගේ ඉදිරියට ආ ඔහුගේම දුව යෙහෝවඃට දවනපූජාවක්කොට පිදූබවය. මෙම්ඇර යප්තාගේ දුවගේ බොටුව කපා දවන පූජාවක් කොට යෙහෝවඃට පූජාකළ බව ඒත්තුගාම පිණිස දක්වන්ට මට වැදගත් සාක්ෂියක් තිබේ. එනම්—රෝමානුකාරයින්ගේ බයිබලයය ඒ බයිබලය මෙන්න ඔය කාරණාව ගැණ මේ බයිබලයේ විස්තාරකොට තිබෙන්නේ යප්තාගේ දුවගේ බොටුව කපා දවනපූජාවක් කළ බවමය. ඒගැණ අනුමානනම්, මෙයින් බලාගණීවා (කියා එම බයිබලය ක්‍රිස්තියානි පක්ෂයට භාරදුන්නාය.) මේ අඳමේ වැදගත් සාක්ෂි තිබෙන කාරණා නැතිකරන්ට කථාකරණ මුන්නැහේලා සමග මෙබඳු කථාවල් කරන්ට සෑහෙන්නේ නැත. ඉතින් මේ ගැණ කරණ කථාව මෙයින් අත්හිටවමි.

තවද මගේ මිත්‍රයා ක්‍රිස්තුන්ගේ ශරීරය මිනීවලේ රෑතුණකුත් දවල් තුණකුත් තිබුනු බව ඔප්පුකරන්ට දුන්න උත්තරයනම් "යුදෙව්වන් දවස ගණින්නේ හෙවත් දවසේ මුළට ගණින්නේ උදය හසේ පටන්ය. එමනිසා තුන්දවස අසුවෙ"යි කීවා මේ කාටත් ඇසෙන්ට ඇත. මොහුගේ මේ උත්තරයට මට කියන්ට තිබෙන්නේ නොවායා භාවත් කීනා සමණත්ය. හමුත් දවසේ මුල උදය හසට ගන්නව

නම් සෙනසුරාදට එළිවෙන්ට මත්තෙන් ක්‍රිස්තුස් මළවුන්ගෙන් නැගිට්ටාය කීවාම ක්‍රිස්තුස්ගේ මළවුන්ගෙන් නැගිටීම සෙනසුරාද උදය හයට ඉස්සරියෙන් ඉරිදා ලබන්ට මත්තෙන් බව ඔප්පුවේ. එන කොට ඉරිදා දවසින් මදක්වත් අසුවෙන්නේ නැත. එමනිසා තුන් දවසට ගණන්ගන්ට කොයිප්‍රකාරයකින්වත් බැරිය. මේගැණ මීට වඩා යමක් නොකියමි.

තවත් මේ ඇත්තා තදබල මුසාවාදයක් මේ සභාවේ කීවා ඒක මේ සමූහයාට මතක්කරවමි. "ක්‍රිස්තුස් උපන් දවසේ ළදරුවන් මැරුවාය" කියා මගේ කථාවේදී මම කීවාලු. මමකිවේ එසේ නොවේ. ක්‍රිස්තුස් උපන් කාලයේදී හෙරොද් විසින් ක්‍රිස්තුස්ගේ උත්පත්තිය නිසා ළදරුවෝ මැරූ බවය. මම නොකී බවක් කීවාය කියන්නේ මුසාවාදයට විළිබියනැති නිසාය. මගේ මේ කීම ගැණ මෙහි සිටින සියල්ලෝම මාවෙනුවට සාක්ෂිකියති.

ක්‍රිස්තුස් නිසාවූ කැතය නැතාකියන්ට බැරිකමෙන් ඒවාගේම කැතයක් බුදුන් උඩටත් ගොඩනගන්ට බුදුන් උපන් සත්දවසින් මෑනියෝ මැරුණු එක ගැණ මේ කතිසේරුනැන කථාකළා මේ කාටත් ඇසෙන්ට ඇත. බුදුන් උපන් සත්දවසින් මෑනියෝ මැරුණේ බුදුන් උපන් නිසා නොවේ. ඒ දේවියට ආයුඇත්තේ එපමණ නිසාය. බොධිසත්වයෝ දිව්‍යලොකයෙන් චුතවෙන්ට මත්තෙන් කාරණා පහක් බැලූබව බුඩාගමේ පොත්වල තිබේ. එයින් එකක් මෑනියන්ගේ ආයුප්‍රමාණය බැලීමය. දසමස් සත්දවසක් ඉදිරියට ආයුතිබෙද්දී බෝසතානෝ මව්කුස පිළිසිඳගත් බව බුදුබණේ තිබේ. දසමාසයක් ගබ්ජීවත්හිටිය කාලයට ගියාම ඉතිරි ආයුසඇත්තේ සත් දවසය. බෝසතානෝ උපන් සත්දවසින් මෑනියන් මැරුණේ මෑනියන්ගේ ආයුප්‍රමාණයේ හැටියටය. මේ අන්දමේ පැහැදිලිව බුඩාගමේ පොත්වල තිබෙන ඇත්ත වසා නැත්ත පෙන්වා කථාකරණ මුන්නැහෙලා සමග කරණ වාදය මොකද ? මේ අන්දමේ මුසාවාද කියාපෑවාට ක්‍රිස්තුස් උපන්නිසාවූ ළදරුවන්ගේ මරණය හොඳඅතකට හරවන්ට බැරිවේය. බුදුන්ගේ මෑනියන්ගේ ආයුප්‍රමාණයේ හැටියටවූ මරණය බුදුන් උපන්නිසා වීයයි භගවන්ට කළ උත්සාහයෙන් කිසිම ප්‍රයොජනයක් ලැබුනේ නැත. එමනිසා මේගැණ කරණ කථාවත් මේ ඇතැයි සිතමි.

තවත් මේ ඇත්තා කළාවූ සියලු කථාවල්වලට වඩා නැණවත් අයට සිනහවියයුතු කථාවක් කළා. එනම්—බොධිසත්වයා මව්කුසින් බිහිවූවායින් පසු අභීත ශබ්සරසිංහනාදයක් කළාය කියාද සිංහනා

දයනම් සත්ත්වයන්ගේ කණ් පැළෙන ඝෝර නාදයක්ය කියාද ඒ නාදයට බොහෝ සත්ත්වයෝ මැරුණාය කියාද මේ කතීසේරුතැන කිවා. මේ සියල්ලන්ටම ඇසෙන්ට ඇත. මේ කතීසේරුතැනගේ මේ කථාවෙන් මොහුගේ නූගත්කම ප්‍රකාශවෙනවා මිස බුද්ධාගමට මෙයින් කිසිම අපහාසයක් නැත. මක්නිසාද බෝධිසත්ත්වයා මව්කුසින් ප්‍රසූතවූවායින්පසු අභීතකෝෂ්ඨරසිංහනාදයක් පැවැත්වූවාය කීවේ "උතුම් නාදයක්" පැවැත්වූබව හඟවන්ටය. "රාජසිංහ" කීවේ සිංහරජෙක්වාට නොවේය. "උතුම් රජෙක්" යන අර්ථය හඟවන්ටය මේ කතීසේරුතැනගේ අඥාන මේ කියමන්වලින් මොහුගේ තරම මේ සමූහයාට පෙන්වාදීමේ ප්‍රයෝජනය මොහුට ලැබුනා සත්තකය. මොහුගේ ලාමක කථාවලින් බුද්ධාගමට කිසිම හානියක් නැත. හොඳයි බෝධිසත්ත්වයා මව්කුසින් ප්‍රසූතවූවායින් පසු කළ සිංහනාදයෙන් යම් සත්ත්වයෙකුට අනතුරාවක් උනාය කියා බුද්ධාගමේ පොතක තිබෙනවාද ? එසේ ඇතුවානම් ඒ බව පෙන්වනමෙන් ඉල්ලමි.

නැවත මගේ මිත්‍රයා ක්‍රිස්තුස් උපන් නිසා උනාවූ ළදරුවන් මැරීමේ දෝෂයෙන් ක්‍රිස්තුස් මුදවන්ට දුන්න උත්තරයනම් මෙසේය "ක්‍රිස්තුස් පාපයෙහි හතුරාය ඒ නිසා ළදරුවන් මැරීමේ පාපලකුණ පහළඋනාය" මගේ මිත්‍රයාගේ මේ උත්තරය ඉතා නිෂ්ඵලය නිඳිනය මක්නිසාද ක්‍රිස්තුස් පාපයෙහි හතුරා නොව මිතුරා බව පාප ලකුණු පහළවීමෙන්ම පෙණේ. හොඳයි හොඳක් සිද්ධකරදෙන්ට ආකෙනෙක් උපන් කාලයෙහි පහළවෙන්ට ඕනෑ හොඳ ලකුණක්ය. ළදරුවන්ගේ මරණය හොඳලකුණක් නොවේනිසා ක්‍රිස්තුස් කරණ කොටගෙණ සත්ත්වයින්ට නපුරක්ම සිද්ධවෙනවාට සැකනැත. යමෙක් ගමනක් යන්ට පිටත්වූකල්හි යහපත් කෙනෙක් ඉස්සරහට ආවොත් ඒ ගමනෙන් වැඩක්ම සිද්ධවෙන බවත් අයහපත්කෙනෙක් ඉස්සරහට ආවොත් ඒ ගමනෙන් අවැඩ සිද්ධවෙන බවත් සියල්ලන්ට අත් දකින්ට ලැබෙන ඇත්තක්ය. මේ කතීසේරුතැන මේ ඇත්ත අනික්අතට හරවන්ට කළ උත්සාහයෙන් ඇති ප්‍රයෝජනය මොහුගේ කපටිකම මේ සභාවට ඇඟුනා පමණක. මෙකී පූර්වනිමිති ගැණ මීටප්‍රථම බොහෝ විස්තරව කීනිසා මෙහිදී මීටවැඩි යමක් කියන්ට ඕනෑ නොකරති.

මේ කතීසේරුතැන බුද්ධාගමට විරුද්ධව ගෙණහැරදැක්වූ අනිකුදු කාරණා ගැණ දෙවනු උත්තරදෙන්නෙමි.

පසුගිය අඟහරුවාදා මගේ විරුද්ධකාර පාදිලිතැන පටිච්චසමුප්පාද ධර්මයෙන් බුද්ධාගමේ දෝෂදක්වන්ට උත්සාහකළා ඒ ගැණ

දෙවනු උත්තරදෙනවාය කියා මගේ පොරොන්දුවක් ඇත. ඒ පොරොන්දුව මේ පැයේදී ඉෂ්ට කිරීම මගේ යුතුකමකි. පටිච්චසමුප්පාද ධර්මය තේරුම්ගැනීමේ තිබෙන දුෂ්කරකම ගැන බුද්ධඝොෂාචාර්‍ය්‍යයන්වහන්සේ මෙසේ කියා තිබේ. කෙසේදයත්—

"වත්තුකාමො අහං අජ්ජ පච්චයාකාරවණ්ණනං
පතිට්ඨං නාධිගච්ඡාමි අජ්ඣොගාළ්හොව සාගරං"

යනමේ කියමන විසුද්ධිමාර්ගයෙහි තිබේ. මෙහි අභිප්‍රාය නම් මුහුදේ වැටුනාවූ කෙනෙකුන්ට පිහිටක් නැත්තාක්මෙන් පටිච්චසමුප්පාද ධර්ම නමැති මුහුදට වැටුනාවූ මටත් පිහිටක් නැත්තේය. එසේ වීනමුත් අර්හත්වයට පැමිණි ඥාණවන්තයන්ට පටිච්චසමුප්පාදධර්මය වැටහෙන බවත් පෘථග්ජනයන්ට වැටහීම දුෂ්කර බවත් මේ ගාථාවේ අභිප්‍රායවේ. බුද්ධඝොෂාචාර්‍ය්‍යයන්වහන්සේ වැනි ත්‍රිපිටකධාරී උත්තමයෝ පවා මෙලෙස දක්වූ පටිච්චසමුප්පාදධර්මය තේරුම්ගෙණ දෙස්සියන්ට තැත්කළ මගේ විරුද්ධකාරයාගේ කථාව කෙබඳුද කීවොත් හඳට ඊර්ෂ්‍යාවෙන් බුරන බල්ලන්ගේ බිරීම හා සමානවේ. පටිච්චසමුප්පාදධර්මයේ අගමුලවත් මගේ මේ විරුද්ධකාරයාට හැඟිලා නැත. "අප්පා නිසා පුතත් පුතා නිසා අප්පත් උපදිනවාය" කියන උපමාව දක්වූයේ ඒනිසාවාට කොහෙත් සැකනැත. එබඳු වමකුරු උත්පත්තියක් ක්‍රිස්තියානි ආගමේ තිබෙන බව මට ඉදිරියට කථා කරන්ට ලැබෙන පැයකදී පෙන්වාදෙන්නෙමි. පටිච්චසමුප්පාද ධර්මයේ තත්වය මදක් තේරුම්යාම පිණිස මගේ දැනුම්පමණින් කියමි එය කළබල නැතුව සියලුදෙනාම අසනසේක්වා.

"අවිජ්ජාපච්චයා සංඛාරා සංඛාරපච්චයා විඤ්ඤාණං විඤ්ඤාණපච්චයා නාමරූපං නාමරූපපච්චයා සළායතනං සළායතනපච්චයා ඵස්සො ඵස්සපච්චයා වෙදනා වෙදනාපච්චයා තණ්හා තණ්හාපච්චයා උපාදානං උපාදානපච්චයා භවො භවපච්චයා ජාති ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති"

මෙහි සංක්ෂෙප අභිප්‍රාය නම් අවිජ්ජාව නිසා සංස්කාරයෝ හටගණිත්, සංස්කාරයෝ නිසා විඥ්ඥාණය හටගණිත්, විඥ්ඥාණය නිසා නාමරූපයෝ හටගණිත් යනාදී ක්‍රමයෙන් එකකට එකක් ප්‍රත්‍යව මෙකී සියල්ලම හටගන්නා බව බුදුන් වදාරාලා තිබේ. මේ කියමන මගේ විරුද්ධකාර පාදිලිතැනට තේරුම්ගන්ටබැරිකමෙන් "අවිද්‍යාව කියා සත්වයෙක් නැතුව පවතිනදේකින් සංස්කාරයෝ උපදිනවාය සංස්කාරයෙන් විඥ්ඥාණය උපදිනවාය" කියා වරදවා සිතාගෙණ පටිච්චසමුප්පාදය ගැණ දෙඩෙව්ව සියල්ලක්ම ප්‍රලාපය. තවද මොහුගේ

ඒ කල්පනාවේ වැරදිකම භගවත්ට සුළු උදාහරණයක් දක්වමි ඒ ඇසුවමැනව. හුන්කිරිනිසා මිදිච්චකිරිද මිදිච්චකිරිනිසා වෙඬරුද වෙඬරුනිසා ගිතෙල්ද හටගණියයි කීවාම හුන්කිරි මිදිච්චකිරි වෙඬරු ගිතෙල් යන සියල්ලම වෙන්වෙන්ස්වභාවට පැමුණුනේවීනමුත් ඒ සියල්ලම එකාබද්ධව එකට තිබුනා සත්‍යකය. එමෙන්ම සංඛයෙක් නැතුව තනිකර අවිජ්ජාවක් තිබුනේවත් අවිජ්ජාවක් නැතුව තනිකර සංසකාරයෝ තිබුනේවත් සංසකාරයෝ නැතුව තනිකර නාමරූප දෙකක් තිබුනේවත් නැත. මේ සියල්ලම එකාබද්ධව පවතිනවා සත්‍යකය. සංඛයෙක් සංඛාරයේ හැසිරෙණ අත්දම දක්වන්ට බුදුන් වදාළ ධර්මය නොපිටට පෙරළාගෙණ මගේ විරුද්ධකාරයා කළ කථාව ප්‍රලාපයක් වැනිය. තවද මේගැණම අභිධර්මයේ පට්ඨානප්‍රකරණයෙහි මෙසේ කියාතිබේ. කෙසේද—

"මොහංපටිච්චසම්පයුත්තකා ඛන්ධාපටිසන්ධික්ඛණෙවත්ථුං පටිච්ච සහෙතුකාඛන්ධා"

යනාදී මෙයින්ද තේරුම්කර තිබෙන්නේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයම තේරුම්කැණීමට කාරණාය එනම්—මෝහය නිසා එක්වයෙදුනු ස්කන්ධයෝද වස්තුරූපය නිසා එක්වයෙදුනු ස්කන්ධයෝද උපදින කියාය. සංස්කාරයෝ තනිව නූපදින බව භගවත්ට විසුද්ධි මාර්ගයෙහිද මෙසේ කියාතිබේ.

"සංඛාරාකම්මපච්චයෙනච උපනිස්සය පච්චයෙනචපච්චයාහොන්ති"

යනාදියද සංස්කාරයෝ කර්මප්‍රත්‍යවීමෙන්ද ආශ්‍රයහෙතුවීමෙන්ද විඤ්ඤාණයට ප්‍රත්‍යයවේ කියා හැගේ.

"විපාකවිඤ්ඤාණංසහජාත අඤ්ඤමඤ්ඤනිස්සයසම්පයුත්තවිපාක ආහාරඉන්ද්‍රියඅත්ථි අවිගතපච්චයෙහි නවධාපච්චයාහොති"

යන මෙයින්ද විඤ්ඤාණය නාමරූපදෙකට ඉස්සරියෙන් උපන්නානොව සමගම උපදින බව පෙණේ. තවද මෙහි විස්තරනම් විපාකවිඤ්ඤාණය සමගම උපන්නාවූද අන්‍යොන්‍යවූද හෙතුවූද ආශ්‍රයවූද එකවයෙදුනාවූද විපාකවූද ආහාරවූද ඉන්ද්‍රියවූද විද්‍යමානවූද වෙන්වූද ප්‍රත්‍යයවලින් නවආකාරයකින් ප්‍රත්‍යයවේ. මේ ආරහස්‍ය සියුම්ලෙස දැනගත්විට විඤ්ඤාණයට පසුව නාමරූපය උපදිනවායයි තේරුම්ගන්ට හැකිවේ. මෙබඳු සියුම්වූ අභිප්‍රායක් ඇති පටිච්චසමුප්පාදධර්මය තේරුම්කරන්ට ගියේ අන්ධ ඇතෙක් වනාන්තරයෙහි ගමන්කරන්නාක්මෙන්! එමනිසා මේගැණද කරණ කථාව මෙයින් අත්හිටවමි.

තවද මගේ මිත්‍රවූ කතිසේරුනැන බුඩාගමේ පොත් ලිවීමගැණ
කළ කථාවත් අතිශයින්ම නිෂ්ඵලය. බුදුන්ගේ මරණයෙන් අවුරුදු
හාරසිය පණහකට පසු බුඩාගමේ ධර්‍මය පොත්වල ලිව්වාය කියාද,
එපමණ දීර්‍ඝකාලයක් බුදුන් විසින් දෙසූ ධර්‍මය පාඩමෙන්ම ගෙණෙ
න්ට බැරිය කියාද පොත් ලිව් කාලයේ හිටිය සඞඝයාට ඕනෑඕනෑ
අන්දමට ලියාගත්තෝයයි කියාද මේ කතිසේරුනැන කීවා මේකා
වත් ඇහෙන්ට ඇත. මේ කතිසේරුනැනගේ මේ කථාවේ තිබෙන
නිස්සාරකම පෙන්වාදෙමි. හෙ මනාව ඇසියයුතු. බුදුන් පිරිනිවන්
පා අවුරුදු හාරසිය පණස්තුනකට පසු වලගන්බාහු රජකාලයේ
මේ ලඞකාවේදී බුඩදෙශනාව පොත්වල ලිවා සත්තකය. බුදුන්
ජීවත්ව වැඩසිටි කාලයේදීත් රත්රන් පත්‍රවල පවා ධර්‍මය ලියූබව
පෙණේ. මේරටේදී පොත් ලිව්වේ දිව්‍යඥානයඇති කෙලෙස් නැසූ
රහතන්වහන්සේලා ජීවත්ව සිටි කාලයේදීය. රහතන්වහන්සේ
ලාට යමක් වරදින්නේ නැත. බුදුන් ඇරුනාම රහතුන්ට වඩා
උත්තමයෝ ලොකයේ නැත. උන්වහන්සේලාට යමක් පාඩමින්
තබාගැණීම අමාරුවක් නොවේ. උන්වහන්සේලාගේ ලියුම්වල
උන්වහන්සේලාට එක ඉස්පිල්ලක්වත් පාපිල්ලක්වත් බුදුන් වහන්සේ
ලාට වඩා අඩුවැඩිවෙන්නේ නැත.

ක්‍රිස්ත්‍යානි බයිබලය ලිව්වේ මේ අන්දමේ උත්තමයෝ නොවේ
ය. මිනීමරා හැන්ගී රටඇරගිය මෝසෙස් ආදි කෙලෙස්සහිත පුද්ග
ලයෝය. තවද බයිබලය වරක් පුළුස්සාදමා නැතිකළබව බයිබල්
යෙහිම පෙණේ. ආර්‍යමවරක් යේහෝවාගේ කපුරාල කෙනෙක්
විසින් තමාට ඕනෑහැටියට ලියා ඒකාලයේ හිටිය රජා රවටා ක්‍රියාත්
ලබවද පෙණේ. මේ කාරණාවල විස්තර ක්‍රිස්ත්‍යානි ආගමට විරුද්ධ
ව ප්‍රසිඩකොට තිබෙන විභජ්ජවාදයෙන් දැනගන්ට පුළුවන. මේගැණ
විස්තර දෙවනු මට ඉඩලැබුනොත් කියාදෙමි.

තවද මේ කතිසේරුනැන වෙස්සන්තර රජ්ජුරුවන්ගේ දාන
ධ්‍යානය ගැණ නින්දාකරන්ට නිතාගණ කථාකළා. ඒ කථාවෙන්
ඒගැණ කිසිම පළුදුවක් කරන්ට බැරිවිය. මක්නිසාද මේ ලෝකයේ
ඇති සියල්ලටම වඩා බුඩපදවිය උතුම්ය. ඒ බුඩත්වය ලබන්ට ලොභ
චේතනාව මැඩපවත්වන්ටඕනෑය. බුදුබව පතාගණඅා වෙස්සන්තර
රජ්ජුරුවන්ගේ ස්ත්‍රී දරුවෝ ඉල්ලුකල්හි තුදුන් නානම් ස්ත්‍රීවත් දරු
වන්වත් ඇති ලොභකම මැඩපවත්වන්ට බැරිබව එයින් පෙණේ. දාන
චේතනාව ජයගන්වන්ට ලොභවේතනාව මැඩපවත්වන්ට ඕනෑවා
සත්තකය. ලොභචේතනා මැඩපවත්වා දානචේතනාව ජයගන්වන්ට

බැරිකෙනෙකුන්ට තුන්ලොකාග්‍රවූ බුද්ධ පදවිය නොලැබේ. එමනිසා වෙස්සන්තරරජතෙම ජූජකනම් බමුණාට දරුවන් දුන්නාය. ඒ දීමෙන් ඒ දරුවන්ට සැපක් මිස දුකක් ලැබුණේ නැත. ඒබව වෙස්සන්තර ජාතකයෙන් බණඇසූ ස්ත්‍රීන්පවා දනිත්. මේ කතිසේරුනැන කී ප්‍රකාරයට වෙස්සන්තරරජ්ජුරුවන්ගේ මහේසිකාව යමෙකුට භාර්‍ය්‍යාවක්උනේ නැත. දෙදෙව්ලොවට අධිපති ශක්‍රදෙවෙන්ද්‍රතෙම වෙස්සන්තරමහරජහුගේ දානපාරමිතාව මස්තකප්‍රාප්තකිරීම පිණිස මිනිස්වෙසක්රගෙණවිත් මහෙසිකාව ලබාගණ එමක්ෂණයේදීම දෙවනුත් මහෙසිකාව වෙස්සන්තර මහරජහටම පාවාදී ගියබව එම ජාතකයෙහිම පෙණේ. ඉතින් මෙයින් පෙණෙන්නේ එම රජහුගේ දානපාරමිතාව මස්තකප්‍රාප්තවූ බවය. මේ කතිසේරුනැන කීලෙස ඒ මහෙසිකාව යමෙකුට භාර්‍ය්‍යාවවූනේ නැත, එමනිසා මොහුගේ ඒ කථාවට මීටවඩා කථාකිරීම නිෂ්ඵලය.

තවද මීට ප්‍රථම දවසේ කථාකල මගේ විරුද්ධකාරයා බුද්ධාගම තබා තමන් විශ්වාසකරණ ක්‍රිස්තියානි ආගමවත් දන්නෙක් නොවේය. ඔහු ඒ දවසේ බුද්ධාගමට විරුද්ධව කල කථාවෙන් ක්‍රිස්තියානි ආගමට පොළපහර වැදුනාමිස බුද්ධාගමට එයින් කිසි හානියක් නැත. "මක්නිසාද ඌරෙකුට බල්ලෙකුට ගරඬියෙකුට මනුෂ්‍යයා සමානකරලා බුද්ධාගමේ තිබෙනවාය"යිකියාද, "මේඅන්දමේ විශ්වාස කරන්ට බැරි මුසාවාදවලින් පිරිච්ච බුද්ධාගම විශ්වාසකරන්ට බැරිය" කියාද ඒ පාදිලිනැන කීවා මේ කාටත් ඇහෙන්ට ඇත. මගේ මේ විරුද්ධකාරයා කීලෙස එබන්දක් බුද්ධාගමේ පොතක නැත. මනුෂ්‍යයා මෘගයෙකුට සමානකරලා තිබෙන්නේ බයිබලයේය. ඒබව පැහැදිලිව ඔප්පුකරමි මේ සියල්ලෝම අසනසේක්වා.

"මනුෂ්‍යපුත්‍රයන්ට සිදුවෙනදේ මෘගයින්ටත් වන්නේය. එකම දෙයක් ඔවුන්ට සිදුවෙයි. එකෙක් නසිනහැටියේ අනිකා නසින්නේය ඔවුන් සැමටම එක හුස්මක. මෘගයෙකුට වඩා මිනිහෙකුට කිසි උතුම්කමක් නැත. මක්නිසාද සියල්ල නිෂ්ඵලය" දෙශනාකාරයාගේ පොතේ 3 වෙනි පරිච්ඡෙදයේ 19 වෙනි පදේ මේලෙස තිබේ. ඉතින් මනුෂ්‍යයා මෘගයෙකුට සමානකෙළේ ක්‍රිස්තියානි ආගමේ කියමන්වලින් නොවේද? බුද්ධාගමේ කියමනක මේවාගේ මනුෂ්‍යයා මෘගයෙකුට සමානකර තිබේද? නැත්තේමය. එමනිසා මගේ විරුද්ධකාරයා තමාගේම ආගම බොරු බව මෙයින් ඔප්පුකලා නොවේද? මොහුගේ සමාගමේ ප්‍රධානියා දැනට මේ ස්ථානයෙහි ඇත්නම් මොහුගේ ඔය ධානාන්තරය පමණවත් තිබෙන්ට අරණවාඇතකියා නොසිතමි

මේ ඇර මගේ විරුඬකාර පක්‍ෂයෙන් තවත් ප්‍රශ්නයක් අසමි. ඒ කෙසේද—කොරොන්තිවරුන්ට ලියනලද 1 වෙනි පත්‍රයේ 15 වෙනි පරිච්ඡේදයේ 22 වෙනි පදේ පටන් 28 වෙනි පදේ දක්වා තිබෙන්නේ මෙලෙසය.

"තවද ආදම්කරණකොටගෙණ සියල්ලෝම මරණට පැමිණෙන් නාක්මෙන් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙණ සියල්ලෝම ජීවත්වනු ලබනවා ඇත" යනාදියය. මේ කියමන්වලින් පෙන්වාතිබෙන්නේ ක්‍රිස්තුස් විශ්වාසකරණ සියල්ලෝම සදාකාල නරකාදි දුකට නොපැමිණෙන බවය. ක්‍රිස්තියානිකාරයන්ගේ විශ්වාසයත් මෙලෙසමය, මේ කියමනට විරුඬව තව කියමනක් බයිබලයෙහි තිබේ. හෙ කෙසේද—

"පසුව වම්පැත්තේ සිටින්නන්ට කියනසේක් සාපලත් තැනැත්තෙනි, මා කෙරෙන් පහව සාතන්ටත් ඔහුගේ දූතයන්ටත් සාදා තිබෙන සදාකාල ගින්නට පලයල්ලාය මක්නිසාද-බඩගිනි ඇතිවීම් නුබලාමට කෑමදුන්නේ නැත; පිපාස ඇතිවීම් නුබලා මට බොන්නට දුන්නෝ නැත, ආගන්තුකවීම් නුබලා මට වාසස්ථාන දුන්නේ නැත, අඳින්ට නැතිවීම් නුබලා මට ඇඳුම් දුන්නේනැත, රෝගාතුරවද හිරගෙයිද සිටියෙම් නුබලා මා බලන්නට ආවේනැතැයි කියන සේක, එවිට ඔවුනුත් උත්තරදෙමින් ස්වාමිනි කොයිකලක බඩගිනි ඇතිවූවත් පිපාස ඇතිවූවත් ආගන්තුකවූවත් ඇඳුම් නැතිවූවත් රෝගාතුරවූවත් හිරගෙයි සිටියාවූවත් ඔබවහන්සේ දැක උපස්ථාන නොකෙළෙමුදැයි කියනවා ඇත. එවිට උන්වහන්සේ උත්තරදෙමින් සැබෑවක් නුබලාට කියමි, මොවුන්ගෙන් ඉතා කුඩාඑකෙකුටවත් යමක් නොකර ඇරියොත් ඒක මට නොකළෝය කියනාසේක, ඔවුන් සදාකාල දඬුවමටත් ධර්මිෂ්ඨයෝ සදාකාල ජීවනයටත් යන්වා ඇතැයි කීසේක" මතෙව් 25 වෙනි පරිච්ඡේදයේ 41වෙනි පදේපටන් 46 වෙනි පදේ දක්වා මෙලෙස තිබේ. ඉතින් මෙයින් හැඟෙන්නේ ක්‍රිස්තුස් විශ්වාසකළ පමණකින් පරලොව ගැලවිල්ලක් නොලැබෙන බවත් ධර්මිෂ්ඨකමෙන් හෙවත් හොඳකිරීමෙන් පරලොව ගැලවෙන් බවත්ය.

බයිබලයේ එකපලක "ක්‍රිස්තුස්නිසා සියල්ලෝම ගැලවෙනවාය" කියාද, තවපලක "ධර්මිෂ්ඨයෝ පමණක් ගැලවෙනවාය" කියාදතිබෙන මේ කියමන් දෙකින් භාරගන්නේ කොයිඑකද? මෙයින් එකක් සැබෑනම් එකක් බොරුවෙන්ට ඕනෑවා සත්තකය. මෙලෙස එක

කට එකක් විරුඬවූ මේ බයිබලයේ කියමන් හාත්පසින්ම විශ්වාස කරන්ට බැරිය, එමනිසා ක්‍රිස්තියානි ආගම සැබෑ ආගමක් වෙන්ට බැරිය, ඒ බව සියල්ලෝම දැනගණිත්වා. මගේ කථාවට ලැබීතිබුනු පැය දැනට ඉවරවෙන්ටගොස් තිබේ. එමනිසා මේ කච්චේරු තැන ඇසුවාවූ ප්‍රශනවලින් ඉතුරුව තිබෙන ප්‍රශනවලට දෙවනු උත්තරදෙන්නෙමි.

(කිසා මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේගේ ඒපැයේ කථාව අත්හිටවන්ට යෙදුනාය.)

---

(මේ 1873 අගෝස්තු මස 28 වෙනි දින සවස 3 පටන් 4 දක්වා දාවිත් ද සිල්වා පාදිලිඋන්නාන්සේ විසින් කළ කථාව.)

මේ සවස කථාකළාහින් පසු මේ වාදය හමාරවෙනවාය. එම නිසා මේ අන්තිම කථාව යහපත්ලෙස අසා සිත්වලටගන්නාමෙන් මේ සමූහයාගෙන් ඉල්ලමි. බුඬපක්ෂයට කථාකරණ මේ උන්නාන්සේට මම "විරුඬකාරයාය" කීවායකියා කෝපවී ඔහු මට "හතුරාය"ය නනමක් කියාගණුනවාය. "විරුඬකාරයා"ය යනවචනයේ කිසිඅපහාසයක් නැත. එසේදවුවත් අපිදෙදෙනා කිසිකලක මෙබඳුකාරණාවලදී අවිරුඬව හිටියේනැත. එමනිසා මගේ මිතුරා "විරුඬකාරයා මයූ" නමුත් මගේවචනයේ අපි නොසලකා නොහොත් "අපනානකංඛාකමෙතං" යන ගාථා පදයේ අභිප්‍රාව පමණවත් නොසලකා මට හතුරෙක් වෙන්ඩ කැමතිඋනාට කනගාටුය.

මගේ මිත්‍රයා දේශනාකාරයාගේ පොතේ—3, 19,යෙන් "මනුෂ්‍යයා තිරිසනාටසමානකළාය" කියාඔප්පුකරන්ට උත්සාහකළාය. ඒක ඔහුට බැරි වැඩක්ය. මනුෂ්‍යයාට තිරශ්චීන මැරෙණ ස්වභාවක් ඇති කාණ්ඩයක් තිබේ. මේ ශරීරයට ජරාමරණ දෙක පැමිණේ ඒක තිරිසනාටත් වේ එමනිසා මනුෂ්‍යයා තිරිසනාට සමානකළාට වරදක් නැත.

නවද මගේමිතුරා ප්‍රතීත්‍යසමුප්පාදධර්මය තෝරාදුන්නාය නමුත් බුඬඝොෂටත් තෝරාදෙන්ටබැරුව "මුදේවැටීලාදූගලූවාය" යන්නක් කීවා මේ කාටත් ඇසෙන්ට ඇත. බුඬඝොෂටත් බැරිවුනු ප්‍රතීත්‍ය සමුප්පාද ධර්මය තෝරාදෙන්ට මගේ මිතුරා තැත්කෙළේ බුඬඝොෂටත් වඩා මගේ මිතුරා ව්‍යක්තයෙක්ද? කියා මේ සමූහයා කල්පනා කරණසේක්වා.

ප්‍රතීත්‍යසමුප්පාද ධර්මය ගැණ නැවතත් ටිකක් මනස්කරවා හරින්ට කැමතිය. විඤ්ඤාණයනිසා නාමරූප සෑදෙනවාය නාමරූප නිසා ආයතනහය සෑදෙනවාය ආයතනහය නිසා ස්පර්ශය සෑදෙන වාය එසේ එකක් නිසා එකක් සෑදීගණ ගොස් භවයනිසා ජාතිය සෑදෙනවායයි කියනවාය. විඤ්ඤාණය කියන්නේ ඇස් කන් නාසා දින්ගේ විඤ්ඤාණයය, ඒ විඤ්ඤාණයනිසා ආයතනයෝ පහළවෙනවායයි කියනවාය. ආයතනය කියන්නේ ඇස් කන් නාසාදියය. මේආකාර පටලැවුන් සහිත කීමක් වෙනත් තිබෙනවාද? මෙසේ එකිනෙකට විරුඬවූ කීම්ඇති බුදුන්ගේ මේ ඉගැන්වීම කෙළෙසද් කීවොත් "අප්පානිසා පුතා උපදිනවාය පුතානිසා අප්පා උපදිනවාය" කීවාහා සමානය.

සියලු මනුෂ්‍යයන්ට නොමැරෙණ ආත්මයක් තිබෙනවා සත්‍යකය, එම ආත්මයම දිව්‍යලොකයට යනවාය! දිව්‍යලොකයේ සිටින් නෙත් අජරාමර වාසනාවන්ත මනුෂ්‍යයෝමය.!!

තවද "ආදම් නිසා පාපයට වැටුනු සියල්ලෝම ක්‍රිස්තුස්වහන් සේ නිසා ජීවත්වනුලබනවා ඇත" යන කීමත් 'ක්‍රිස්තුස්වහන්සේ නිසා සියල්ලෝම නැලවෙන්නේනැත' යන කීමත් බයිබලයේ මගේ මිතුරා පෙන්වාදුන් පදවල තිබෙනවා සත්‍යකය. එසේදවුවත් මගේ මිතුරාට එබඳු තර්කයක් කරන්ට ගිහුනේ ජීවත්වනුබලනවාය යන කීම තේරුම්ගන්ට බැරිවෙලාවාට කොහෙත් සැකනැත.

අරූපලොක ගැණ මගේ මිතුරා කීවේ ඒවා තේරුම්ගන්ට බැරි සියුම් ධර්මකොට්ඨාසයට අයිතිය කියාලාය. එසේනම් ඉතා සියුම්වූ ආත්මය කෙබඳු එකක්ද කියා අපෙන් ඇසුඑක විහිලුවක් නොවේද?

තුන්පිටකය ගැණ මගේ මිතුරා කීවේ බුදුන් කාලයේදිත් රන් පත්‍රවල බණ ලිව්වාය කියාලාය. ඒ කීම ඒත්තුගන්ට බැරි කාරණා තිබේ. එනම් අටුවාසහිත සියලු බුඬවචනයන් බුදුන් පිරිනිවි හාර සිය පනස්වර්ෂයක් වනතුරු මුඛපාඨයෙන්ම ගෙණාවාය කියාලා තිබෙන නිසාය. මගේ මිතුරාගේ ඒ උත්තරය නිස්සාරය ඒ උත්තරය සවිකරන්ටනම් මුඛපාඨයෙන් ගෙණාවේ මොනවාද කියා පෙන්වන්ට ඕනෑය.

මෝසෙස් මිනීමරුවෙකැයි කියාද ඒ මෝසෙස් විසින් ලිවූ දේව වාක්‍යය පිළිගන්ට බැරිය කියාද මගේ මිතුරා කීවා මෝසෙස් එයා කාර මිනීමැරුවේ දෙවියන්වහන්සේ භාරගන්ට ඉස්සරියෙන්ය ඇරත් අපි මෝසෙස්ගේ සරණයන්නේනැත එමනිසා මෝසෙස් කෙපමණ වැරද්දක් කළත් එයින් අපට ඕනෑකමක්නැත.

බුඩාගම්කාරයෝ සරණ යන ඇත්තන්ගෙන් එක්කෙනෙක් අඟුලිමාලයෝය ඔහු මිනිස්සු නවසිය අනූනවදෙනෙක් මරාලා තිබෙනවාය මේතරම් කෲර පුද්ගලයා බුදුන් එකපාරට මහණඋපසම්පදකලා පමණක්නොව රහත්වුනායයි කියාත් බුඩාගම්කාරයෝ කියනවාය අඟුලිමාල පිරිතෙයි කියා මේ ඇත්තාගේ නමින් පිරිතකුත් සාදගණ බුඩාගම්කාරයෝ කියනවාය.

ආලවකයක්ෂයා අවුරුදුදොළහක් මුළුල්ලේ දවසකටඑකාබැගින් මිනිස්සු හාරදස් තුන්සියකට වඩා මරාකෑ කෙනෙක්ය නමුත් ඔහු සෝවාන්උනාය කියා බුඩාගම්කාරයෝ සරණයනවාය

බුදුන් බොධිසත්ව කාලයේදී හෙවත් වෙස්සන්තර රජව උපන් කාලයේදී තමන්ගේ ස්ත්‍රී බමුණෙකුට දීලා තිබේ බොධිසත්වයෝ තමාගේ ස්ත්‍රී කිසිවෙකුට අඹුකමට දුන්නේනැතැයි අපේ මිතුරා කීවාය. නමුත් අපේ මිතුරාගේ ආගමේ පොත්වල "නෙකකොටි සහස්සානංභරියත්ථායදසිමං" යනාදි ගාථාව තිබේ මේ ගාථාව කියා තිබෙන්නේ යශෝදරා සව්පිරි විසින්ය. මෙවා කුදුගොත් සඟිගෙ ථෙරිඅපදනයෙහි කියාතිබේ ඉහතකී ගාථාපදයේ අභිප්‍රාවනම් "නොයෙක් කෙළසහශ්‍රවාරවල අනුන්ට අඹුකමට මා දුන්නාය එත් මම නුඹවහන්සේට අමනාපයක් වුනේනැත" යනුයි. මේ අන්දමේ බුඩාගමේ පොත්වල තිබෙන කියමන් අනික් අතට පෙරළන්ට මේ පිරිවරගණ ඉන්න සම්මියොන් සමග එකතුවෙලා සිටින බව කවුරුත් දනගනිත්වා.

තවද "ආගතාගතානංයාචකානං" යනාදි පාඨයෙන් පෙණෙන්නේ "ඉල්ලා එනඑන තැනැත්තන්ට හිසගසාදුන්නාය ලේබොන්නට දුන්නාය ඇස්උගුලා දුන්නාය දරුවන් දුන්නාය භාර්‍යාව දුන්නාය මාවිසින් නුදුන් දනයක් නැත" කියා බුදුන් කියාතිබෙනවාය. ඉතින් මෙවා නැතකියන්නන් සමග කරණ වාදය මොකද?

ඉතින් මෙතැන්පටන් මේ 'බුඩාඞ්කුර'ගේ ලක්ෂණ පෙන්වාදෙමි. 'අඞ්කුරය' කියන්නේ පැලෑටියය බුදුවෙන පැලෑටියේ හැටි පෙන්වාදෙන්ට ජාතක දෙකක් තුනක් පෙන්වාදෙමි ඒ ඇසුවමැනව. පරන්තප ජාතකය බලනු එම ජාතකයේ බුඩාඞ්කුර රාජකුමාරයෙක්ව තමාගේ පියාට විරුඩව කැරලිගැසුවාය පියරජ තමන් බිසවත් 'පරන්තප' නම් දසයත් සමග වල්වැදුනාය. එහිදී පරන්තපයා, බිසවට එකතුවෙලා පියරජා මැරුවාය. දෙවනු උපන් කුමාරයා පරන්තපයා මැරුවාය. මේ සියලූ අනතුරු සිඩඋනේ බුඩාඞ්කුරකළ ද්‍රොහිකම නිසාය. මේ බුදුවෙන්ට ලොකුවේගණ එන තැනැත්තා කලවැඩේය.

සුසන්දිය ජාතකය ඒ ජාතකයේදී බෝධිසත්වයෝ ගුරුලෙක, ඔහු සුදුකෙළියට රජගෙයකට ගොස් ඒ රජ්ජුරුවන්ගේබිසව හොර කම්කරගණ පැන්නාය, මේ ක්‍රියා ලොකුවෙගණ බුදුවීමටඑන අතර කළ වැඩේය. මේවා බුදුවීමට කරණ වැඩනම් බුදුබව පතන අනිත් අයටත් ආදර්ශයට ගන්ට හොඳය.

බුදුවුනායින්පසු සර්වඥතාඥනයක් තබා මේ කාලයේදී ළමයෙකුන්ට ඇතිතරමේ ඥානයක් නොතිබුනු බවට වැදගත් කාරණාවලින් සාක්ෂිදෙමි. අඞ්ගුත්තර සඟියේ සප්තසූර්යෝද්ගමනසූත්‍රයෙහි

“සිනෙරු භික්ඛවෙ පබ්බතරාජා චතුරාසීතියොජන සහස්සානි ආයාමෙන”

යනාදි පාඨයෙන් පෙන්වා තිබෙන්නේ මහමෙර කියන පර්වතයෙහි උසමහත සහ කල්පවිනාසයේදී සූර්යයන් හත්දෙනෙක් පායන අන්දමය “සිනෙරු පර්වතරාජයා අයමින් අසූහාරදහසක් යොදුන විතරින් අසූහාරදහසක් යොදුන අසූහාරදහසක් යොදුන් මහාසමුද්‍රයෙහි ගිලීතිබෙන්නේය. එපමණ මහාසමුද්‍රයෙන් උස්ව නැගේය’ කියා එම පාඨයෙන් පෙණේ. ඉතින් මෙපමණ උසමහතඇති මේ පර්වතරාජයා තිබෙන්නේ මේ ලෝකයේ කොතනද? ඒක මනුෂ්‍යයන්ගේ ඇසට නොපෙණීතිබෙන්නේ කොහොමද? (මෙහිදීලොකසංස්ථානබෝලයක් පෙන්වා) මේ ලෝක බෝලයේ වටප්‍රමාණය නම් හැතැක්ම විසිපන්දහස, ඒබව ලොකයේ ඥාණවන්ත පඬිත සියල්ලන් විසින් පිළිගෙණ තිබේ. ඉතින් ඉහතකී තරමේ විසාල පර්වතයක් මෙපමණ කුඩා ලෝකයක තිබෙන්ට බැරිය. ඇරත් ලොකයේ මේආකාර එකක් තිබෙනවාද? කියා සහිගණනාකදී දූතගන්නට ලොකය වටේ යාත්‍රා කරන්නට පුළුවන, එබඳු නැව් යාත්‍රාකරණ කොයිපඬිතයෙකුටවත් මෙබඳු පර්වතයක් තිබෙන බවට ලකුණක් ලැබීනැත. එමනිසා මෙබඳු පර්වතයක් ඇතකියා දෙශනාකළ බුදුන්ට හාත්පසින්ම සර්වඥතාඥනයක් නැත. එබඳු කෙනෙක් සියල්ල දන්නවාය කියා පිළිගෙණ දූගලීම නිෂ්ඵලය.

තවද බ්‍රහ්මලොකවල උපදින්නට පතාගණ මාතර උන්නාත් සේලාවගයක් පිස්සුඅල්ලනකල් ධ්‍යාන භාවනාකළවගක් පසුගියකාලයේ අපට සැලය. ඒවාගේ පිස්සන්ට මේ ධර්මවල් හොඳවාමිස නැත වතුන්ට හොඳනැතුවා සත්තකය.

තවද බුද්ධන්ගේ ගෝලයෝ බුදුන් ජීවත්ව සිටිද්දීම අනන්ත පාපක්‍රියාකරලා තිබෙන බව පාරාජිකාපොතේ පෙණේ ඒවා මේ මේවායයි විස්තරවශයෙන් මෙබඳු සභාවල කියාදෙන්ටබැරිය. නමුත් ස්වල්පයක් කියමි.

මක්කටිකාවස්තුආදි වස්තුවලින් "තෙනඛොපන සමයෙන අඤ්ඤතරොභික්ඛු සීවථිකං ගන්ත්වායෙභුය්‍යෙන ඛායිතං සරීරංපස්සිත්වා මෙථුනධම්මංපතිසෙවි" යනාදියෙන් පෙණේ.

මේ ඇර බුදුන්ගේ මරණය ගැණ මදක් කියමි බුදුන් මැරුණේ චුන්දනම් තාපසයා විසින් දෙනලද සූකරමද්දවය අනුභවකොට ලොහිතපක්ඛංදිකානම් රෝගයෙන්ය. එනම් ලේඅතීසාර රෝගයෙන්ය. ඒ රෝගය අල්ලා නොයෙක් දුක්විඳ තැන්තැන්වල යන්ට බැරුව ඉඳ ඉඳ කුසිනාරානුවරට ගියබව මහාපරිනිර්වාණ සූත්‍රයෙහි පෙණේ. මේ දුක්විඳීමේදී බුදුන්ට තිබුනාය කියන ඉර්ධියක්වත් දිව්‍යබ්‍රහ්මයන්ගෙන් උපකාරයක්වත් ඇතිබව නොපෙණේ. මෙයින් පැහැදිලිව පෙණෙන්නේ බුදුන් සම්බන්ධව කියාතිබෙන කියමන අඥානයන් රවටන්ට කියාතිබෙන ප්‍රලාප බවය,

මේකීම් නොසිහැවිඋනත් අපි සියල්ලන්ම මවාආරක්ෂාකරන්නාවූ සර්වපරාක්‍රමයානන්වහන්සේත් උන්වහන්සේගේ ඒකජාත පුත්‍රයා වන අපේ පව්වලට දුක්විඳවූ ජේසුස්ක්‍රිස්තුස්වහන්සේත් විශ්වාසකොට අපේ ගැළවීම ලබාගන්ට ඕනෑය. ඉතින් අප විසින් බුද්ධාගමට විරුද්ධව ගෙණහැරදැක්වූ කාරණාවලින් එකම කාරණයකටවත් අපේ මිත්‍රයා උත්තර නුදුන් බවත් ක්‍රිස්තියානි ආගමට විරුද්ධව ඇසූවාවූ සියල්ලට අප විසින් උත්තරදුන් බවත් මේ සියල්ලම හිත්වල තබාගන්නමෙන්ද ඉල්ලනවාය. මගේ කථාව මෙයින් නවත්වමි.

(කියා දවිත්ද සිල්වා පාදිලිඋන්නාන්සේගේ කථාව
අත්හිටවන්ට යෙදුනාය.)

---

(වර්ෂ 1873 ක්වූ අගෝස්තු මස 28 වෙනිදින සවස 4 පටන් 5 දක්වා
මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේ විසින්
කළ කථාව.)

**මේ පාදිලිතැන** මීට ඉහත කථාකරද්දී මට "විරුද්ධකාරයාය" කියාත් මාවිසින් ඒගැණ කාරණාකීවායින් පසු "මිත්‍රයාය" කියාත් ව්‍යවහාරකළාය. එයින් ඔහුගේ වැරද්ද ඔහුටම තේරුම්ගිය බව පෙණේ. එම්නිසා ඒගැණ යමක් කියන්ට ඕනෑකරන්නේ නැත.

පසුගිය අඟහරුවාද උදයවරුවේ මේ පාදිලිතැන කළ කථාවේදී "මනුෂ්‍යයන් මෘගයන්ට සමානකරලා බුද්ධාගමේ තිබෙනවාය" සි කීවාය එබඳුඉගැන්වීමක් බුද්ධාගමේ පොත්වල නැත. මනුෂ්‍යයන් මෘගයන්ම සමානකරලා තිබෙන්නේ ක්‍රිස්තියානි ආගමේය, ඒබව මීට ඉහත

බයිබලයෙන්ම වරක් මා විසින් ඔප්පු කළාය නමුත් ඒ කාරණාවම තවවරක් ඔප්පුකරමු. මක්නිසාද ඒ ප්‍රස්ථාවට ඒකථාව අහගන්න නොසිටිය වැදගත් උදවිය දැනට පැමිණසිටින නිසාය. දෙසනාකාරයාගේ 1 වෙනි පොතේ 3 වෙනි පරිච්ඡේදයේ 19 වෙනි පදේ මෙලෙස තිබේ. "මනුෂ්‍යපුත්‍රයන්ට සිදුවෙන දේ මෘගයන්ටත් වන්නේය. එකමදෙයක් ඔවුන්ට සිදුවේ. එකෙක් නසිනහැටියේ අනිකා නසින්නේය ඔවුන් සැමටම එක හුස්මක මෘගයෙකුට වඩා මිනිසෙකුට කිසි උතුම්කමක් නැත" ඉතින් මනුෂ්‍යයන් මෘගයන්ට සමානකරලා තිබෙන බව මෙයින් පැහැදිලිව ඔප්පුවේ. "මනුෂ්‍යයන් මෘගයන්ට සමානකරලා තිබෙනබව ක්‍රිස්තියානි ආගමෙන් ඔප්පුකරන්ට බැරිය" කියා මේ පාදිලිතැන කීනමුත් "ඔවුන් සැමටම එක හුස්මක" යන බයිබලයේ තිබෙන වචනවලින් මෘගයන්ගේද, මනුෂ්‍යයන්ගේද වෙනසක් නැතිබව ඔප්පුවේ.

ප්‍රතීත්‍යසමුප්පාද ධර්මය තේරුම්ගැණීමේ අමාරුව ප්‍රකාශකිරීම පිණිස බුද්ධඝෝෂ තෙරුන්නාන්සේ විසින් දක්වාතිබෙන "වතනුනාමෝ අහංඅජ්ජ" යනාදි ගාථාවේ අභිප්‍රාව මා විසින් කියාදී ඉන්පසු මගේ දැනුම්පමණින් ප්‍රතීත්‍ය සමුප්පාද ධර්මය තේරුම්කරදුන්නා ඇත. එම නිසා බුද්ධඝෝෂ තෙරුන්නාන්සේට වඩා මම සමර්ථයෙක්! වෙන්නේ නැත. එබන්දක් මා විසින් ඇඟෙව්වෙත් නැත. මෙලෙස නිවරදිව කලාවූ මගේ ඒකථාවට මේ පාදිලිතැන දොස්කීවේ මේ පාදිලිතැනගේ පාලිදැනීමේ තරම මා විසින් මේ සමූහයාට පෙන්වා කළ කථාවට ඊර්ෂ්‍යාවෙන්ය කියා සිතමි. එමනිසා මේගැණ මීටවඩා යමක්කියන්ට ඕනෑනොකරමි.

තවද මේ පාදිලිතැන ප්‍රතීත්‍යසමුප්පාද ධර්මය ගැණ නැවතත් කියාදෙනවාය කියා පටන්ගෙණ කාටවත් නොතේරෙණ හැල්ලක් කියාගණගොස් "බුදුන්ගේ ඉගැන්වීම අවුල්සහිතය" කියාද, "එකකට එකක් විරුද්ධය" කියාද, තීන්දුකළාය. මේ පාදිලිතැන කීලෙස ප්‍රතීත්‍යසමුප්පාද ධර්මයෙහි අවුලක්වත් එකකට එකක් විරුද්ධකමක්වත් ඇත්තේනැත. මේ පාදිලිතැනට උත්පත්ති විඤ්ඤාණ චිත්තයෙන් ඇස් කන් නාසාදින් සම්බන්ධවපවතින චක්ෂුර්විඤ්ඤාණාදීන්ගේත් වෙනස තේරෙන්නේ නැත, එසේ තේරෙණවානම් "ප්‍රතීත්‍යසමුප්පාද ධර්මය අවුල්ය එකකට එකක් විරුද්ධය" කියන්නේ නැත. උත්පත්ති විඤ්ඤාණ චිත්තයෙන් චක්ෂුර්විඤ්ඤාණාදින්ගෙන් වෙනස දැනගැණීමට සෑහෙන තරමට මීට ඉහත වරක් මා විසින් කාරණා කියාදුන්නාය එමනිසා මෙහිදී ඒගැණ වඩා විස්තරනොකරමි මේ පාදිලි

නැත "අප්පානිසා පුත්තාද පුත්තානිසා අප්පාද උපදිනවාය කීවාක්මෙන් ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයද අවුල්ය"යි කීවා මේ කාටත් ඇසෙන්ටඇත. එමනිසා ඒගැණ යමක් නොකියාම බැරිය "අප්පානිසා පුත්තාද පුත්තානිසා අප්පාද උපදිනවාය" කීවාම ඒ උත්පත්තියේ වටකුරු ගතියක් තිබේ. එබඳු වටකුරු උත්පත්තියක් ක්‍රිස්තියානි ආගමේ තිබේ, ඒ කෙසේද යෙහෝවඃ විසින් ක්‍රිස්තුස්ගේ මෑනියෝවන මරියා මැවූනිසා යෙහෝවඃ මරියාගේ පියාවේ, මරියා යෙහෝවඃගේ දූවේ, සුධාත්මය මරියාගේ බඩේ පිළිසිඳගත්නිසා යෙහෝවඃ මරියාගේ පුතාවේ, මරියා යෙහෝවඃගේ මව්වේ, ක්‍රිස්තුස් මරියාගේ පුතානිසා යෙහෝවඃ මරියාගේ පුරුෂයාවේ, මරියා යෙහෝවඃගේ ස්ත්‍රීවේ, ඉතින් මෙයින් පෙණෙන්නේ එකම මරියා එකවරකට යෙහෝවඃගේ දූ! බවත් එකවරකට යෙහෝවඃගේ මව්!! බවත් එකවරකට යෙහෝවඃගේ ස්ත්‍රී!!! බවත්ය. මෙබඳු නින්දිත උත්පත්තියක් ක්‍රිස්තියානි ආගමේ තිබෙද්දී ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයට "අප්පානිසා පුත්තාද පුත්තානිසා අප්පාද උපදිනවාය" යන උපමාව කීවා කොහෙත් හරි නැත. අප්පානිසා පුත්තාද පුත්තානිසා අප්පාද උපන්නාය කීම හාත්පසින්ම ක්‍රිස්තුස්ගේ උත්පත්තියට කීවා නම් හරිය. එමනිසා මේගැණ මීටවඩා යමක් කියන්ට ඕනෑකරන්නේ නැත.

ඉන්පසු මේ පාදිලිතැන "දිව්‍යලෝකයේ සිටින්නෙත් මනුෂ්‍යයෝය"යි කීවා මේ පිරිසට ඇසෙන්ට ඇත. "දිව්‍යලෝකයේ සිටින්නේ මනුෂ්‍යයෝය"යි මේ පාදිලිතැන කියනවාම්ස මොනයම් ශාස්ත්‍රාගමක වත් කියාලා නැත. මුන්නැහේගේ මේ කියමන අළුත් කියමනක්ය 'පරලොවට ගමන්කරණ ආත්මයක් ඇත" කියන මුන්නැහේලාට මේ අන්දමේ ප්‍රලාප නොකියා බැරිය. බොරු දෘෂ්ටිය සවිකරන්ට කියන්ට ඕනෑ බොරුමය! මිථ්‍යාදෘෂ්ටීන්ගේ කියමන්වල තිබෙන නිස්සාරකම මෙයින් දැනගණින්වා "මෙලොවින් පිටත්ව පරලොවට ආත්මයක් ගමන්කරණවානම් දිව්‍යලෝකයේ සිටින්නෙත් මනුෂ්‍යයෝ වෙන්ටඕනෑය" කියා මවිසින් ඇසූ ප්‍රශ්නයට උත්තරයක් දෙන්ට බැරිකමනිසා "දිව්‍යලෝකයේ සිටින්නෙත් මනුෂ්‍යයෝය" කියා දඟලනබව මේ කථාවලින් පෙණේ. මේඅන්දමේ හැරුණු හැරුණු අතට උත්තරදෙන තමන්ගේම ආගමටත් විරුද්ධවන කියමන් කියන මුන්නැහේලා සමග වාදකරණවාට වඩා නිකන්හිඳීම යුතුය. දිව්‍යලොක වල මනුෂ්‍යයෝ නැති බවත් ඒවායේ ආනුභාසම්පන්න දෙවියන් වහන්සේලා සිටින බවත් මේ සියල්ලන්ගේ හිත්වල ඇඳීතිබෙන ඇත්තක් නිසා ඒගැණ වැඩිය යමක් කියන්ට ඕනෑකරන්නේනැත.

"ජීවත්වනු ලබනවා ඇත" යන වචනය "මට තේරෙන්නේ නැතැ"යි කීවාමිස මේ පාදිලිතැනවත් ඒගැණ අමුතු තේරුමක් කෙළේනැත. "ආදම්කරණකොටගෙණ සියල්ලෝම මරණයට පැමිණෙන්නාක්මෙන් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙණ සියල්ලෝ ජීවත්වනු ලබනවාඇත" කියා බයිබලයේ තිබේ. ඒගැණ මිට ඉහත විස්තරකොට කීමි. එමනිසා මෙහිදී ඒගැණ බයිබලය පෙරලන්නේ නැත. මෙලොව ජීවත්වීමට "ජීවත්වනුලබනවා ඇත" කීවානම් ක්‍රිස්තුස්ට ගැලවුම්කාරයාය කියන්ට ඕනැකරන්නේ නැත, ක්‍රිස්තුස් ඇදහීමෙන් පරලොවට වැඩකුත් නැත.

මෙලොවින් පරලොවට ගමන්කරණ ආත්මය ඉතා සියුම්නිසා ඒකේ ආකාර කියන්ට බැරිළු. එසේ සියුම්නම් පරලොවට ගමන් යන බව දැනගත්තේ කොහොමද? අරූපලොකවළ උපදින සත්වයන්ගේ චිත්තලක්ෂණයන් කියාදීමට "කාලයමදිබැව්" කීවාමිස "කියන්ට බැරිය"යි නොකීවෙමි. අරූපලොකවල ඉපදීසිටින බ්‍රහ්මයන්ගේ ආත්මත් මුන්නැහේලා කියනලෙස ගමන්යන්නේ නැත. මුන්නැහෙලා එබඳු බ්‍රහ්මලොකවල් ඇතකියා විශ්වාසකරන්නෙත් නැත්, එමනිසා මුන්නැහෙලා කියන ආත්මය ඊට සමානකළා වැරදිය.

අද උදයවරුවේ කථාකළ සිරිමාන්න කතීසේරුතැන විසින් බුඩාගමේ දෙස් දක්වීම පිණිස කළ කථාවක් මේපාදිලිතැන විසින් ගෙණහැරදක්වූවා එනම් "බුදුන් පිරිනිවන්පාලා අවුරුදු 453 කට පසු බුඩාගමේ ධර්‍මය පොත්වල ලිවූවාය" යන කීමය. ඒ කීමනට මවිසින් නිසි උත්තර ඒලඟ පැයේදී දුන්නාඇත. එබැවින් මෙම්පැයේදී ඒගැණ වැඩියයමක් නොකියමි. නමුත් "සමයසංග්‍රහව" කියනපත්‍රයේ 4 වෙනි කලාපයෙහි ඒගැණ විස්තර කියමන් තිබේ, එම්නිසා ඒ සංග්‍රහව මුන්නැහේලාට භාරදීම ඊට උත්තරවේ (කියා "ඒ සංග්‍රහව" ක්‍රිස්තියානි පක්ෂයට භාරදුන්නා ඇත)

තවද මේ පාදිලිතැන මෝසෙස්ගේ උත්තමකම හඟවන්ට උත්සාහකළා ඒ උත්සාහය සපිරකරන්ට අතිසයින්ම බැරිය. මක්නිසාද මෝසෙස් මිනීමරා රටහැරගිය තක්කඩියෙක්ය, "ඔහු යෙහෝවඃ භාරගත්තායින් පසු එලෙස තක්කඩිකම් කෙළේ නැතැ"යි කියා මේ පාදිලිතැන කීනමුත් බයිබලයේ නික්මයාමේ පොත කියවාබලනකොටනමුත් පෙණෙන්ට තිබෙන්නේ මෝසෙස් මැරෙණතුරුම මිනීමැරූ බවය. එබැවින් මෝසෙස් කොයිකාලයකවත් ධර්මිෂ්ට පුද්ගලයෙක් නොවේ බව මේ සියල්ලන් විසින් තේරුම්ගණින්නා. මෝසෙස්

වැනි මිනිමරුවෙක් විසින් ලියනලද "බයිබලය සැබෑවූ පොතක්ය ඒ පොතේ කියමන් විශ්වාසකොට පරලොව ගැලවෙන්ට පුළුවනැ"යි සිතීම වැලිමිරිකා තෙල්ගන්ට කරණ උත්සාහයක් වැනිය. මේආදි අනෙක කාරණාවලින් ක්‍රිස්තියානි ආගම සැබෑනොවනබව ඔප්පුවේ එමනිසා ක්‍රිස්තියානි ආගම දුරින්ම දුරුකටයුතු,

"අඞ්ගුලිමාලතෙරුන්නාන්සේ මිනිමරුවෙකැ"යි මේපාදිලිතැන කීවා. ඒ කීම හාත්පසින්ම බොරුය, අඞ්ගුලිමාල තෙරුන්නාන්සේ කිසිකලක මිනිහෙක් මැරීම තබා කුහුඹුවෙක් පමණවත් මැරුවේ නැත. එබන්දක් මේ පාදිලිතැනට බුඩාගමේ පොතකින් පෙන්වන්ටත් බැරිය. "අඞ්ගුලිමාල තෙරුන්නාන්සේය" යන නාමය උන්වහන්සේට ලැබුනේ මහණව රහත්වූවායින් පසුවය. බුඩාගම්කාරයෝ වැඳුම් පිදුම් පවත්වන්නෙත් එම රහතන්වහන්සේටය. මහණව රහත්වෙන්ට මත්තෙන් වැරදිකෙළේ ඒ රහතන්වහන්සේ නොවේය, ඒ වැරදිකෙළේ පෘථග්ජන පුද්ගලයෙක්ය. ඒ පුද්ගලයා උත්තමයෙකැයි අපි කියන්නේ නැත. 'අඞ්ගුලිමාල' නම් කෙලෙස් සහිත ගෘහස්ථ පුද්ගලයෙක් සිටියා සත්තකය. ඒ පුද්ගලයා කළ වැරදි ආශී පුද්ගලයෙක් පිටට හෙළන්ට උත්සාහකළාට ඒක පුළුවන් වැඩක් නොවේය. ගරන්තික ආලවක ගැණත් දෙන උත්තර එලෙසමය. එමනිසා ඒගැණ මගේ කාලය මිඩංගුකරන්නේ නැත.

තවද මේ පාදිලිතැන වෙස්සන්තර රජ්ජුරුවන්ගේ දානාධ්‍යාශයට නින්දාකරණු කැමතිව කථාවක් කළාය. අද උදය වරුවේ සිරිමාන්න කතිසේරුතැන විසින් කළ කථාවත් මේ කථාවමය. එම නිසා සිරිමාන්න කතිසේරුතැනගේ ඒ කථාවට මවිසින් දුන් උත්තරම මේකථාවට උත්තරවේ. එබැවින් මේපාදිලිතැන වෙස්සන්තර රජ්ජුරුවෝ ගැණ කී කථාවට උත්තර ඒවාම බව සැලකියයුතු. නමුත් මේ පාදිලිතැන "ථෙරඅපදාන" යෙහි තිබෙන ගාථාකැබලි කීපයක් කිවා එනම් "නෙකකොටිසහස්සානං හරියජායදාසිමං" යනාදියය. මේ ගාථාකැබලි කීවේ බෝධිසත්වයෝ තමන්ගේ ස්ත්‍රී අඹුකමට අනුන්ට පාවාදුන්නු බව ඔප්පුකරන්ටය. ඒ ගාථාවලින් එබන්දක් ඔප්පුවෙන්නේ නැත. මක්නිසාද වෙස්සන්තරරජ ශක්‍රබ්‍රාහ්මණයාට මන්ද්‍රිදේවි පාවාදුන්නා සත්තකය. ඒ දීමට "හරියජායදාසිමං" නොකියා බැරිය. නමුත් ඒ බ්‍රාහ්මණයා මන්ද්‍රිදේවි අඹුකමට තබාගත්තේ නැත. එම වෙස්සන්තර රජ්ජුරුවන්ටම එම ක්ෂණයේ දීම ආපසු භාරදී ගිය බව වෙස්සන්තර ජාතකයෙහි පෙණේ. එමනි

සා ඒ ගාථාපදවලින් එබන්දක් ඔප්පුනොවේ "බෝධිසත්වයෝ තමාගේ සත්‍රී අඹුකමට දුන්නාය" කියා ඔප්පුකරන්ට නම් එසේ දීපුකාලයෙහි සත්‍රීකොට තබාගණ උන්නු තැනක් පොතකින් පෙන්වන්ට ඕනෑය, එසේ පෙන්වන්ට මේ පාදිලිතැනගේ සමර්ථකම මදිය. මේ ගැණ උත්තර මෙපමණ සෑහෙන නිසා මෙයින් නවත්වමි.

තවද මේ පාදිලිතැන "ආගතානාගතානං" යනාදි පාලි වාසගම් කැබැල්ලක් කීවා ඒ වාසගම බුද්ධදේශනාවය කියාලත් බොහොම උඩපැන්නා එබඳු පාලි වාසගම් කැබැල්ලක් බුද්ධදේශනාවේ කොතනකවත් ඇත්තේනැත. එසේ ඇතුවානම් දේශනාපොතකින් පෙන්විය යුතු. ඒ පෙන්වන්ට බැරුවා සත්තකය බෝධිසත්වයො දන් පිණිස ඇස්, ඉස්, මස්, ලේ, අඹු, දරුවන් දුන්නා සත්තකය, බුද්ධත්වය ලෝකෝත්තම පදවියක් නිසා එබඳු ආශ්චර්යයීමත් දනාධ්‍යාශයක් ඇතිකෙනෙකුන්ට මිස නැතිකෙනෙකුන්ට ලබන්ට බැරිය. මේ ගැණත් මීට ඉහත මවිසින් කාරණා පෙන්වා දුන් නිසා මීට වැඩිය යමක් කියන්ට ඕනෑකරන්නේ නැත.

තවද මේ පාදිලිතැන බුදුරජානන්වහන්සේට නින්‍දාකිරීමපිණිස පරන්තපජාතකයද, සුසන්දීජාතකයද, යන ජාතකදෙක ගෙණහැර දක්වා එහිදී බෝධිසත්වයො වැරදිකළබව කීවා මේ ඇත්තන්ම ඇසෙන්ට ඇත. එයින් බුදුරජානන්වහන්සේටවත් බුද්ධාගමටවත් කිසි අපහාසයක් නැත. මක්නිසාද කෙලෙස්සහිත පුද්ගලයෝ වැරදි කරණවා සත්තකය. කෙලෙස් සහිත පුද්ගලයෙක් වැරදිකළාට නික්කෙලසිවූ බුදුන්ට එයින් කිසිඅපහාසයක් නැත. "බෝධිසම්භාරයපුරණ බෝධිසත්වයන් වහන්සේලා වැරදිකරන්නේ නැත" කියා අපි කියන්නේ නැත. බුදුවනාසින්පසු උන්වහන්සේකිසි වැරැද්දක් කෙලේනැත. බුද්ධාගම්කාරයෝවන අපි සරණයන්නේ අදහන්නේ වඳින්නේ පුදන්නේ බුදුන්ටය. බෝධිසත්වයන් සරණයාමක් අපේ නැත. එනිසා බෝධිසත්වයෝ කළදෙෂයක් ගෙණහැරදක්වීම නිෂ්ඵලය තවද "බුද්ධාඞ්කුර" කියන්නේ "පැලවෙන්නාවූ බුදුන්ය" කියා මේ පාදිලිතැන කීවා මේ කාටත් ඇසෙන්ට ඇත, එබඳු අර්ථයක් බුද්ධාඞ්කුර යන වචනයට කියන්ට බැරිය. මේ පාදිලිතැනගේ තිබෙන නූගත්කම නිසා ඔය අන්දමේ ප්‍රලාප දෙඩෙව්වා මිස උගතෙක්නම් දෙඩවන්නේ නැතුවා සත්තකය.

තවද "බුදුන්ට සර්වඥතාඥනයක්තබා ලමයෙකුන්ට ඇති නුවණක්වත් නැත" කියා මේ පාදිලිතැන කිවා, ඒ බව පෙන්වන්ට "සිමෙ

රුක්ඛඛමෙව පබ්බතරාජා" යනාදි පාඨයක් ගෙණහැරදක්වූවා ඒපා,
ඨය ගෙණහැරදක්වූවේ "මහමේරුපර්වතය කියා පර්වතයක් ඇතැයි
බුදුන්ගේ දේශනාවේ තිබෙනවා' යයි පෙන්වන්ටය. මහමෙර නැති
බව පෙන්වන්ට මේ පාදිලිතැන ඉදිරියට ගෙණාවේ ඉංග්‍රීසි භූමිශා
ස්ත්‍රයය. ඒ ඉංග්‍රීසි භූමිශාස්ත්‍රය ඉපදෙව්වේ "සර් ඓසෙක් නිව්ටන්"
යන ඉංග්‍රීසි පණ්ඩිතයාය. ඒ පණ්ඩිතයා ඉපදෙව් භූමිශාස්ත්‍රයට විරු
බව "ආර්. ජේ. මොරිසොන්" කියන ඉංග්‍රීසි පණ්ඩිතයා පොතක්
සාදාතිබේ. ඒපොත දැනට මාලඟ තිබේ. ඒ පොතේ කියාතිබෙන
කියමන්වල හැටියට නිව්ටන්ගේ භූමිශාස්ත්‍රය බොරුබව ඔප්පුවේ.
මේ පාදිලිතැන සරණකොටගත් නිව්ටන්ගේ භූමිශාස්ත්‍රයේ අන්දමට
රුදවල් වෙන්නේ පොළොව කරකැවීමෙන්ය. නමුත් මොරිසොන්
ගේ කියමන්වල හැටියට ඉර ගමන්කරණ බවත් පොළව නිශ්චලව
තිබෙන බවත් පෙණේ. ඉංග්‍රීසි පණ්ඩිතයන් අතරේ පවා මෙලෙස
එකසත්කමක් නැතුව වාදවිවාදව තිබෙන භූමිශාස්ත්‍රයකින් බුඩධර්ම
ය බොරුකරන්ට ආඑක කෙපමණ ලාමකද? මේ පාදිලිතැන බෝ
ලයක් දික්කළබව කාටත් පෙණෙන්ට ඇත. ඒ පෙන්නුවේ නිව්ටන්
ඉපදෙව් භූමිශාස්ත්‍රයේ අන්දමට සාදපු බෝලයක්ය. ඒ බෝලය
ඉතා ඉක්මනින් විසිකරමි හෙයිනසේද—මොරිසොන් කියන්නෙත්
වැදගත් ඉංග්‍රීසි පණ්ඩිතයෙක්ය. ඔහු පොළොව කරකැවෙන
බවට අනන්ත සාක්ෂිදීලාතිබේ. (ඒවා දැනගැණීමට ක්‍රිස්තියානි පක්ෂ
යට ඒපොත භාරදුන්නාය.) එයින් ඉහතපෙන්නූ බෝලය විසිවුනා
සත්තකය. තවද මේ පාදිලිතැන පෙන්වාතිබ්ය භූමිශාස්ත්‍රය ගැණ
ඉංග්‍රීසි පණ්ඩිතයන් අතරේද "සූර්‍යසිඩාන්ත" ආදි පොත්කළ සංස්
කෘත පණ්ඩිතයන් අතරේද, කිසිකලක නිශ්චයකට පැමිණිලානැත.
ඉංග්‍රීසි පණ්ඩිතයන් නිතරම භූමිශාස්ත්‍රය ගැණ වාදවිවාද කරති.
මෙඅන්දමෙන් නිශ්චයකට නොපැමිණ තිබෙන අවලඟු ශාස්ත්‍රය
කින් කාරණා පෙන්වා බුඩධර්මය බොරුකරන්ට ආඑක මහත් විහිළු
වක්ය. මේ පාදිලිතැනගේ බෝලයද විසිවිය. තවද "මහමෙර" කියා
විශාල පර්වතයක් උතුරුදිශාවේ තිබෙන බවට වැදගත් සාක්ෂිතිබේ.
එනම් "කොම්පාස්එකය" එම කොම්පාස්එකේ කාන්දම් බැඳි
කෙනා නිතර උතුරටම හැරීසිටී වෙනදිසාවකට ඒ කටුව කොයිකල
කවත් හැරීසිටින්නේනැත. එයින් කාන්දම අදින වස්තුවක් උතුරු
දිශාවේ තිබෙන බව ඔප්පුවේ. "මහමෙර තිබෙන්නෙත් සතරමහ
ද්වීපයෙම උතුරෙන්ය"? කියා බුඩාගමේ පොත්වල තිබේ. එමනිසා
මහමෙරට කාන්දම අදිනවා කෙනෙකුට ඕනැවා සත්තකය. එසේනො

වේනම් කොත්පාස්එකේ කාන්දම් බැඳි කොන වෙනදිසාවලටත් ඇදීසිටින්ට ඕනෑය. වෙන කොයිදිසාවකටවත් හැරීසිටින්නේ නැතුව එම කටුව උතුරටම හැරීසිටිනනිසා වෙනදිසාවල නැති වස්තුවක් උතුරේ තිබෙන බව ඔප්පුවේ. ඒ වස්තුවනම් අපි කියන මහමෙරය. මගේ මේ කියමන බිඳහෙලන්ට කිසිවෙකුන්ට බැරුවා සත්තකය. එමනිසා මහමෙර ඇතිබව මෙයින් ඔප්පුවේ. තවද කොත්පාස්කටුවේ කාන්දම් බැඳී කොන උතුරට අදින්නේ මේනිසායකියා කොයියම් ඉංග්‍රීසි පණ්ඩිතයෙක්වත් සොයාලා තිබේද? සොයාලා තිබෙනවානම් කියන්ට හොඳ. ඒගැණ යමක් මේ හිටින කිසිවෙකුන්ට කියන්ටබැරුවා සත්තකය. මහමෙර සමාන විසාලපර්වතයක් ලොකයේ වෙන නැත්තේය. එමනිසා ඒ පර්වතය තිබෙන දිසාවට කාන්දම් කටුව අදින්නේය. තවද ලෝකයේ වට මහත හැතැක්ම විසිපන්දහක් බවද මහමෙර ජලයෙන් උඩට අසූහාරදහක් තිබෙන බවද කියා එපමණ ලොකු පර්වතයක් මෙපමණ පුංචි ලෝකයක තිබෙන්ට බැරිබව ඔප්පුකරන්ටත් මේ පාදිලිනැන උත්සාහකළා. ඒ උත්සාහයත් ඉතා නිෂ්ඵලය මක්නිසාද ලෝකයේ ප්‍රමාණය කියා දුන්නෙත් නිව්ටන්ගේ ශාස්ත්‍රයේ හැටියටය, වෙන ඉංග්‍රීසි පණ්ඩිතයන් දෙස්කියන අස්ථිරශාස්ත්‍රයෙන් ගෙණහැරපෑ ලෝකයේප්‍රමාණය ඒත්තුගන්ට බැරිය. මේ ඇර දඹදිව පණ්ඩිතයන් අතරේ යොදුන්වල ප්‍රමාණය ගැණ නානාමත තිබේ. ඉන්නිසා බුඩාගමේ පොත්වල පේණ යොදුන් ප්‍රමාණය එයින් කොයිප්‍රමාණයට එකතුවේයි මේ පාදිලිනැන දන්නවාද? ඉතින් මහමෙර ගැණ මේ පාදිලිනැන කළ කථාවට දියයුතු උත්තර මෙපමණ සෑහෙන හෙයින් මෙයින් නවතිමි. නමුත් මහමෙරක් ඇතිබවට මවිසින් ගෙණහැරදැක්වූ කාරණාවල තිබෙන ස්ථිරකමත් මේ පාදිලිනැන මහමෙරක් නැතිබවට ගෙණහැරදැක්වූ කාරණාවල තිබෙන අස්ථිරකමත් එපමණින් මේ සමූහයාට වැටහෙන්ට ඇතකියා සිතමි.

මේලඟට පාදිලිනැන කථාකෙළේ මාතරදිසාවේ උන්නාන්සේ කෙනෙකුන්ට ඇල්ලූ පිස්සුවක් ගැණය. උන්නාන්සේකෙනෙකුන්ට ලෙඩක් ඇල්ලීම බුඩාගමට නින්දාවක් නොවේ.' බුඩාගමේ තීක්ෂ්ණ භාවනාක්‍රමය නොදන අස්සීලව හිටගණ භාවනාවේ යෙදෙන අයට පිස්සුඅල්ලන බව බුඩාගමේ පොත්වල තිබේ ඒනිසා එයින් බුඩාගමට කිසි පළුදුවක් නැත. තවද මේ පාදිලිනැන බුදුන් ජීවත්ව සිටිය කාලයේ හිටිය කෙලෙස්සහිත පාපිෂ්ට භික්ෂූන් කළ වැරදි කියා පාපිෂ්ට පුද්ගලයන් වැරදිකරන්නේ නැතකියා අපි කියන්නේ නැත මේ කාලයේද එසේම වැරදිකරණ භික්ෂූන් හිටිනවා සත්තකය

එයින් බුඩාගමට කිසි දෝෂයක් ඇත්තේ නැත. ශික්ෂාපද පැණෙව්වායින්පසු වැරදිකළ භික්ෂූන් බුදුන් විසින් නියමකළ දඬුවම්වලට යටත්වාමිස ශික්ෂාපද පණවන්ට මත්තෙන් වැරදිකළ භික්ෂූන්ට දඬුවමක් පණවා ඇත්තේ නැත, යම් රජකෙනෙක් ආඥාවක් පැණෙව්වොත් ඒ ආඥාව කඩකළ ඇත්තන්ට දඬුවම්කරණවා මිස ආඥාවට පූර්ව ඒ ක්‍රියාවට යමෙකුට දඬුවම් දෙන සිරිතක් ඇත්තේ නැත. එමෙන්ම විනයධර්මයෙහි ආදිකර්මිකයාට දඬුවමක් නියමකළ බව පෙණෙන්නේ නැත. වැරදිකළ භික්ෂූන්ට අච්චුදුන්නේ නැතැයිකියා මේ පාදිලිනැත කීවේ මේ කාරණාව තේරුම්ගන්ට බැරි අඥානකමන්ය, අසවල් භික්ෂුව අසවල් වැරද්ද කළාය ඒගැණ මෙනම් අච්චුව නියමකළාය යනාදී වශයෙන් ඒ ඒ වැරදිකළ භික්ෂූන්ගේ නම්ද ඒවා ගැණ නියමකළ ශික්ෂාපදද විනයෙහි පැහැදිලිව පෙණේ. එසේ තිබීමෙන් බුද්ධධර්මයෙහි තිබෙන නිර්මලකම ඔප්පුවේ. මේ පාදිලිනැත එබඳු නිර්මල විනය ධර්මයෙහි දෙස්දක්වීම පිණිස ඒවා ප්‍රකාශකළාට එයින් බුඩාගමට කිසිම කිළුටක් නැත. දරුගැබක් නෙළන්ට උපක්‍රමයෙදූ පාපිෂ්ට ශ්‍රමණයෙක් ශාසනයෙන් තුරන්කළ බව විනයෙහි පෙණේ. ඒ ශ්‍රමණයාට "දුස්කටආපත්තියක් නියමකළාය"යි මේ පාලිනැත බොරුවක් කීවා. එබන්දක් විනයධර්මයෙන් මොහුට පෙන්වන්ට බැරුවා සත්තකය. බුඩධර්මයේ නැතිකරුණු ඇතැයිකියාද ඇතිකරුණු නැතැයිකියාද මිථ්‍යාවචන කියන්නේ මේ පාදිලිනැතගේ තිබෙන නූගත්කම නිසාමය.

"චුන්දනම් තාපසයෙක් බුදුන්ට සූකරමාංසයක් දුන්නා" බවක් මේ පාදලිනැත කීවා. එබන්දක් බණපොතක ඇත්තේ නැත. චුන්ද නම් කර්මාරපුත්‍රයාය කියා කෙනෙක් බුදුන් පිරිනිවන්පාන දවසේ සූකරමද්දවයක් සහිත දානයක් දුන්න බව බණපොත්වල පෙණේ. එම දානය වැළඳූ නිසා ඒ ආබාධය බුදුන්ට වැළඳුනා නොවේ, ඒ දානය ඒදවසේ වැළඳුවේ නැතත් බුදුරජාණන්වහන්සේගේ පිරිනිවන්පෑම ඒදවසේ වෙනවා සත්තකය. බුදුන් පිරිනිවන්පෑ දවසේ වැළඳූ දානය කීවාමිස ඒ දානය නිසා බුදුරජාණන්වහන්සේට ඒ ආබාධය සෑදුනු බවක් පෙන්වන්ට කීවා නොවේය, ඒදවසේ වෙනදෙයක් වැළඳුවත් ඒත් ඔයඅන්දමටම කියනවා ඇත. එම්නිසා මේ ගැණ වැඩිය කාරණාකියන්ට ඕනෑනොකරම්.

මේ පාදිලිනැත විසින් බුඩාගමට විරුඩව ගෙණහැරදැක්වූ කාරණාවලට උත්තර මෙපමණ සෑහෙන නිසා මෙයින් නවතිම්, අද උඳය වුනු [illegible] විසින් බුඩාගමට විරුඩව ගෙණහැරදැක්වූ කාරණාවලින් උත්තරනොදී ඉතුරුව තුනක් තිබේ:

එනම් තුන්සරණය ගැණද උපසම්පදාවාදය ගැණද, ආලාරකාලාම උද්දකාරාම යන දෙදෙනා ගැණද, කළ කථාතුනය. ඒගැණ කීවේ බුදුන් ජීවත්ව නැතිනිසා ඒ බුදුන්ගේ සරණයාමෙන් ඵලක්නැතිළු. බුදුන්ගේ මරණය ගැණ මේ කතිසේරුතැන යමක් නොදන්නාබව මොහුගේ කථාවෙන්ම පෙණේ හෙකෙසේද—

බුදුන්ගේ මරණය කාලතුනකටවේ. එයින් පළමුවෙනි මරණයනම් කෙලශ පරිනිර්වාණයය—දෙවෙනි මරණය ස්කන්ධපරිනිර්වාණයය—තුන්වෙනි මරණය ධාතුපරිනිර්වාණයය—එයින් පළමුවෙනි මරණයවූ කෙලශපරිනිර්වාණය බුදුවූ දවසේ බොධිමූලයෙහිදී වූයේය එනම් සියළු කෙලෙස් නසා සර්වඥතාඥානයට පැමිණීමය. ස්කන්ධපරිනිර්වාණය මල්ලව රජදරුවන්ගේ සල්උයනෙහිදී වූයේය එනම් පඤ්චස්කන්ධය නිරුද්ධවීමෙන් නිර්වාණට පැමිණීමය. ධාතුපරිනිර්වාණය බුදුන් පිරිනිවිතැන්පටන් අවුරුදු පන්දහක් ගියතැන බුදුන්ගේ සියලු ධාතු දඹදිව ජයමහා බෝධිද්‍රැමමූලයට පැමිණ එයින් ජීවමාන බුදුන්සේ බුද්ධරූපයක් නිර්මිතව ස්වල්පකාලයක් දෙවියන්ට බණ කියා ඉන්පසු ධාතු ආදාහනයවීමය ඒ ධාතු ආදාහනයවීමට තව අවුරුදු දෙදාස් පන්සියගණනක් තිබේ.

ඒකාලය යනතුරු බුදුන්ගේ ධාතු තිබෙන නිසා බුදුන්ගේ පිරිනිවීමේ සම්පූර්ණ නීන්දුව වෙන්නේ නැත. එමනිසා බුදුන්ගේ පැවැත්ම දැනට ලෝකයේ නැතැයිකියා මේ කතිසේරුතැන කීවාවැරදිය- ශ්‍රද්ධාවඇතිඅයට ජීවමාන බුදුන්ටවැඳපුදාලබන ආනිසංස ධාතුක චෛත්‍යාදියට වැඳපුදාලත් ලබාගන්ට පුළුවන. තවද බුදුන්ගේ ගුණශරීරය සිහිකරන්ට පුළුවන් අය යම්පමණ කාලයක් ඇතුව සිටිනවානම් එපමණ කල් නැතිවෙන්නේ නැත. ධර්මයේ සරණයනවාය කියන්නේ බණපොත්වල සරණයාම නොවේ. ධර්මය කියන්නේ බුදුන් වදාළ නවලෝකොත්තර ශ්‍රීසද්ධර්මරත්නයටය ඒ ධර්මය බුදුන්ටත් ගුරුවේ- ඒ ධර්මය යමෙක් විශ්වාසකරණවානම් එලෙස පිළිපදිනවානම් එයින් පරලොව ගැලවීම ලැබේ. ධර්මයේ සරණයාමේ අදහස මෙයින් තේරුම්ගණිත්වා. "සඞ්ඝංසරණං ගච්ඡාමි" යන පදයට ඇතුලත්වෙන්නේ දන්නිවිත මේ සඞ්ඝයා නොවේ. සඞ්ඝයාවනාහි "ආර්‍යසඞ්ඝයාය, සම්මුතිසඞ්ඝයාය" කියා කොට්ඨාස දෙකක් වේ. එයින් ආර්‍යසඞ්ඝයාය කියන්නේ සතරමග සතරඵලයට පැමිණි අෂ්ටාර්‍යපුද්ගල සඞ්ඝරත්නයය. සම්මුතිසඞ්ඝයාය කියන්නේ චතුර්විධ විනයකර්මයට ඇතුලත් උපසම්පදා සඞ්ඝයාය. මෙකී විප්‍රකාර සඞ්ඝයා අතුරෙන් ආර්‍යසඞ්ඝයා සරණගැණීමට ඇතුලත්වේය. එබඳු උත්තමයන් විශ්වාසකිරීමෙන්ද උන්වහන්සේලාට වන්දනාමානාදිය කිරීමෙන්ද අනන්ත පින්ලැබේ. සඞ්ඝයාගේ සරණයාමේ අදහස මෙයින් දැනගණිත්වා.

තවද මේ කතිසේරුනැන සියම් අමරපුර යන සමාගම්දෙකේ සඞ්ඝයාට දෙස්කිම ගැණ ලක්රිවිකිරණ පත්‍රමාගියෙන් කරණ උපසම්පදාවාදය ගෙණහැරදක්වූවාය. ඒ වාදයට සියම් අමරපුර යන සමාගම් දෙකේ හිටිනා වැදගත් සඞ්ඝයා වහන්සේලා බැඳී නැත. ඒ වාදයෙන් එයට බැඳීහිටිනා දෙදෙනාගේ මොකක්දෝ අදහසක් ඉෂ්ට කරගැණීමට හරනාම්වලින් ඉදිරියට නැවිත් සැඟවිලා හිටගණ කරණ මිථ්‍යාවාදයක්බව පෙණේ. සම්ප්‍රකාරයෙන්ම ඒබව ඔප්පුකරන්ට පුළුවනි. එමනිසා ඒ වාදයකිරීමෙන් අපේ මේ සමාගම්දෙකේ සඞ්ඝයාට කිසිම කිළුටක් නැත. එබැවින් ඒගැණ කරණ කථාවද මෙහිත් නවත්වමි,

ආළාරකාලාම උද්දකාරාම යන දෙදෙනා ගැණ මේ කතිසේරුනැන කළ කථාවට නිසි උත්තර මීට ප්‍රථම අපි දෙපක්ෂය අතරේ කළ බද්දේගම වාදයේදීද වෙනත් වාදවලදීද දීලාඇත. ඒ ගැණ අච්චුගහපු පොත්පවා දැනට මාලඟ තිබේ. එහිත් පොතක් ක්‍රිස්තියානිඅංගම්ට භාරදීම ඒට උත්තරවේය. නමුත් මට ලැබිතිබෙන පැය තව ඉකුත්නොවූ බැවින් ඒගැණ මදක් කාරණා කියමි.

බුදුන්ට නිතර පේණ ඥානයක්ඇත්තේනැත උන්වහන්සේගේ සර්වඥතාඥානය ආවර්ජනාව පිළිබඳය, එනම් උන්වහන්සේට යමක් බලන්ට ඕනෑවූවිටක දිව්‍යඥානය නමැති ඇස ඇරබැලීමය. එසේ බැලූකල්හි ඒ සියල්ල පේණවාය. මේ මනුෂ්‍යයන්ගේ ඇස්වලට නමුත් යමක් පෙණෙන්නේ ඇස් ඇර බැලුවාමය. ඇස ඇර නොබැලූ යමක් නුදුටුවාට ඇස් තිබෙන කෙනෙකුන්ට ඇස් නැත කීම වැරදිය. ආළාරකාලාම උද්දකාරාම යන තව්සන් දෙදෙනාට බණ කියන්ට බුදුන් කල්පනාකළා මිස දිව්‍යඥාන නමැති ඇස ඇරබැලුවේ නැත. එකල ඒ දෙදෙනා මැරිලා බව දේවතාවෙක්විසින් කීවාය ඉක්පසු දිව්‍යඥානයෙන් බලා ඒ දෙදෙනා උපන්තැන් පවා දැනගත්බව බුද්ධදේශනාවේ තිබේ. ඒ දෙදෙනාට බණකියන්ට බුදුන් සිතුවේ ඔවුන් ආශ්‍රයකරලා අඳුනන නිසාය. නිතර සියල්ල පෙණී පෙණී තිබෙන ඥානයක් යමෙකුන්ට ඇතුවානම් ඒඇත්තාට ඒක නරකාදි දුකක් හා සමානවේය. එබඳු ඥානයක් බුදුන්ට නැත. “යෙහෝවාට එබඳු ඥානයක් තිබෙනවාය”යි ක්‍රිස්තියානිකාරයෝ කියති. එබඳු නිතර පෙණෙන ඥානයක් යෙහෝවාට තිබෙන නිසා මේ ලෝකයේ මනුෂ්‍යයන් අතරේ පවතින ඇඟට දකින්ට අප්‍රියවූ මලමුත්‍රාකිරීම්ආදි නින්දිත දේ පෙණිපෙණී ඉන්නවා සත්තකය. එසේ නින්දිතදේ

පෙණිපෙණී ඉන්න යෙහෝවාට ඇති දුක නරකාදි දුකක් හා සමානය. බුද්ධරජාණන්වහන්සේට එබඳු දුකක් ඇත්තේනැත. මක්නිසාද නිතර සියල්ල ප්‍රේණ ඥානයක් උන්වහන්සේට නැතිනිසාය. සර්වඥතාඥානය ආවර්ජනාව පිළිබඳය. යෙහෝවාගේ නිතර ප්‍රේණ ඥානය අවාසනාවන්ත ඥානයක් බවත් ආවර්ජනාව සහිත බුදුන්ගේ ඥානය වාසනාවන්ත ඥානයක් බවත් මෙයින් ඔප්පුවේ. ආලාරකාලාම උද්දකාරාම යන දෙදෙනා ගැණ ඇසූ ප්‍රශ්නයට මේ උත්තර ඕනෑවාටත් වැඩිනිසා මෙයින් නවතිමි.

මිත්‍රවරුනි, මට කථාකරන්ට බලේ තිබෙන පැයෙන් නව සම්ලප කාලයක් ඉතිරිව තිබේ. ඒ කාලය අතර ක්‍රිස්තියානි ආගමේ තත්වය පෙන්වීම පිණිස මදක් කාරණා කියමි, ඒ යහපත්ව ඇසිය යුතු

ක්‍රිස්තියානිකාරයෝ මැවුන්කාරයා කව්දකියා අඳුනන්නේනැත ඒ බවට සාක්ෂි බයිබලයෙන්ම මට පෙන්වන්ට පුළුවන "දෙවියන්වහන්සේගේ ඉස්ප්‍රීතුව ජලමතුයෙහි හැසුරුනේය" කියා බයිබලයෙහි මුලම තිබේ. ඒ වචනය ලිව්වාවූ බයිබල්කාරයත් එපමණ මෝඩයෙක් නොවේය. මක්නිසාද ඉස්ප්‍රීතුව ජලමතුයෙහි හැසිරෙන්නේනැතුව යමක්හට ගන්ට හෙවත් මැවෙන්ට බැරිනිසාය. ඒ බව හොඳට වැටහෙන්ට වැදගත් සාක්ෂියක් පෙන්වමි.

මේ පොල්නස්වල තිබෙන පොල්ගෙඩි මාස දෙළහක් පමණ ගහේ තිබෙනවාය, ඒ ගෙඩියේ වතුර තිබෙන නමුත් ඒ වතුරේ පනුවෝ නැත, එම පොල්ගෙඩිය හිල්කරලා කීපදවසක් තිබෙන්ට ඇරියොත් එහි පනුවෝ උපදිනවා සත්තකය, පොල්ගෙඩිය හිල්කරන්ට මත්තෙන් පනුවෝ නූපදින්නෙත් හිල්කළායින් පසු පනුවෝ උපදින්නෙත් මක්නිසාදකියා කල්පනාකටයුතු. කොපමණ කාලයක් නමුත් හුලඟ නොවදින්ට වතුර තිබෙන්ට පුළුවන්නම් පනුවෙක්වත් වෙන මොනයම් සතෙක්වත් එහි හටගන්නේ නැත. හුලඟ වදින ලෙස ටිකදවසක් වතුර යම්තැනක තිබුනොත් එහි පනුවෝ හට ගණී. මක්නිසාද වායෝ තෙජෝ ආපෝ යන ධාතුතුන එකට සංසර්ගවන නිසාය. "දෙවියන්වහන්සේගේ ඉස්ප්‍රීතුව ජලමතුයෙහි හැසුරුනාය" කියා බයිබල්කාරයා ලීවේ යමක් හටගැණීමට ඕනෑකරන්නාවූ හේතුව පෙන්වීම පිණිසවාට කොහෙත් සැකනැත. "වායෝ තේජෝ ආපෝ" කියන හුලඟත් ගින්නත් වතුරත් යන ධාතුත්‍රයනිසා සියල්ල හටගන්නවා සත්තකය, එමනිසා මේ ධාතුතුන මැවුන්කා

රයෝ වේය. මේ ධාතුන්ගේ ආධාරය නැතුව ලෝකයේ කිසිදෙයක් පවතින්ට බැරිය. එබැවින් සියල්ල රක්ෂාකරන්නාවූ ආරක්ෂාකාරයොත් මේ ධාතුම වේය. තවද මෙකියනලද ධාතුත්‍රය සියළුතැන පැතිරී තිබේ. එමනිසා "සියළුතැන පිරී වැඩසිටිනවාය' කීවාමත් කොහෙත් වැරැද්දක් නැත. තවද මේ ධාතුත්‍රයට පටන්ගැන්මක්වත් අන්තිමයක්වත් නැතිනිසා "සදාකාලිකය" කිවාවත් වැරැද්දක් නැත. ඇරත් මේ ධාතුතුන නිතරම එකාබද්ධව පවතී. හෙයින්ද වායෝධාතුවෙනි ආපෝ ගුණයද, තේජෝ ගුණයද දෙකම පවති. එම නිසා මේ තුන්දෙනාට "එක්කෙනාය" කීවාටත් වැරැද්දක්නැත මෙකියනලද ධාතු තුනට "පිතා පුත්‍ර ඉස්ප්‍රිතුසාන්තු" කියා අමුතු නම් තුනක් දමාගෙණ "එකම දෙවියෝය" කියා ක්‍රිස්තියානි ආගම උපදවා තිබේ. මේ ධාතුත්‍රයට "බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර" කියා හෝ "පිතා පුත්‍ර ඉස්ප්‍රිත්තු" කියාහෝ කොයි කොයි නාමයක් ව්‍යවහාර කළත් මැවුම්කාරයෝ නම් මුන්වහන්සේලා තුන්දෙනාමය. වෙන මැවුම්කාර දෙවිකෙනෙක් ඇත්තේනැත.

තවද බයිබලයේ කියාතිබෙන තහනම් ගහත් ඒ ගහේ ගෙඩි කෑමත් ඒ ගෙඩි කෑමට උපක්‍රම යෙදූ සර්පයාත් ඒ ගෙඩි කෑ වැරැද්දට දුන් අව්චුවත් මොකද කියා ක්‍රිස්තියානිකාරයෝ පවා දන්නේනැත. දන්නවානම් "සියලු මනුෂ්‍යයන් මවන්නේ දෙවියෝය"කියා විශ්වාස කරන්නේනැත තහනම් ගහත් ගෙඩිකෑමත් සර්පයාත් යනමේ ආදිය තේරුම්ගන්ට බැරිකමෙන් "මනුෂ්‍යයන් මවන්ට දෙවිකෙනෙක් ඇත" කියා විශ්වාසකරති එමනිසා ඒගැන මදක් කාරණා කියමි. ඒ මනාකොට ඇසියයුතු. තහනම් ගහනම් ආදම්ය ගෙඩිකෑමට උපක්‍රම යෙදූ සර්පයානම් ඒවගේ හිතේ පැවැති රාගහිතය. ගෙඩිකෑවායකීවේ නම් ඒ දෙදෙනාගේ එකතුවීමටය මගේ මේ අභිප්‍රාව මෙලෙසම බවට තිබෙන වැදගත් සාක්ෂියනම් ඒව ගෙඩිකෑ වැරැද්දට ඇට ලැබුන අව්චුවය. ඒ අව්චුවනම් "ගැබ්ධාරීමේ දුකත් දුකින් දරුවන් වැදීමත් ඒවට සහ ඇයින් පැවතෙන සියළු ස්ත්‍රීන්ට ලැබුනාය" කියා බයිබලයේ ලියාතිබීමය. දැනට නමුත් ඔය ගෙඩිය කැමෙන් ස්ත්‍රීන්ට ලැබෙන්නේ ගැබ්ගැනීමත් දුකින් දරුවන් වැදීමත් යන දෙක පමණය. මුලින් බයිබලය ලිව් තැනැත්තා මේ සියලු මනුෂ්‍යයන් දෙදෙනකුගෙන් පැවතඑනවායකියා සිතාගෙණ මුලට "ආදම් ඒව" කියා දෙන්නෙක් නියමකොට ඒ දෙදෙනාගේ සංසර්ගයෙන් බෝවිල්ලවන බව හඟවන්ට ලිව් ලියැවිල්ලක් බව නැනාවත් ලොකයාට තේරුම්

ගන්ට පුළුවන. එසේ නොවේනම් තහනම් ගහේ ගෙඩිකෑමෙන් ගණී දුරීමත් දුකින් දරුවන් වැදීමත් නියමකරන්ට කොහෙන් ඕනෑකරන්නේ නැත. පුනුල් හොරා කෙරෙන්ම අඳුනන්ට පුළුවන්වා වාගේම ඒවා දුන් අච්චුවෙන්ම තහනම් ගහත් සර්පයාත් ගෙඩිකෑමත් මොකද කියා නැනවත් අයට තේරුම්ගන්ට පුළුවන. මනුෂ්‍යයන්ගේ බෝවීල්ල පෙන්වීම පිණිස බයිබලයේ තිබෙන උපමා කථාව තේරුම්නොගෙණ මැවුම්කාර දෙවිකෙනෙක් ඇතකියා ක්‍රිස්තියානිකාරයෝ මුලාව සිටිති. ඒ මුලාවෙන් දුරුවීම පිණිස මින්ඉහත දක්වූකාරණා ඉතා ප්‍රයොජනවත් වේය. මේආදි කාරණාවලින් ක්‍රිස්තියානි ආගම සැබෑ නොවන ආගමක් බවත් පරලොව ගැලවීම පිණිස විශ්වාසකරන්ට යුතුනැති බවත් මෙහි රැස්වහිටින සමූහයා විසින් තේරුම්ගණිත්වා. තවද මට කථාකරන්ට ලැබීතිබෙන අන්තිම පැය තවම කෙළවර උනේ නැත. තව ස්වල්ප කාලයක් කථාකරන්ට මට බලය තිබේ. ඒ කාලයතුළ තුන්ලොකාග්‍රවූ බුදුරජානන්වහන්සේගේ උත්තමකම ඔප්පුකිරීමට තිබෙන්නාවූ වැදගත් කාරණාවලින් ස්වල්පයක් ගෙණ හැරදක්වමි. මේ සභාවේ හිටින සියල්ලන් විසින් එය මනාකොට ඇසියයුතු. මෙලොව ප්‍රයොජනය ලැබීම පිණිස කරන්නාවූ සියල්ලටම වඩා පරලොව් ගැලවීම පිණිස කරන්නාවූ වැඩේ ඉතා ප්‍රවේසමෙන් කටයුතුය මක්නිසාද පරලොව වැඩසිඩකරගැණීම පිණිස කරණ ක්‍රියාවනම් සැබෑවූ ආගමක් සොයාගෙණ ඇදහීමය සැබෑවූ ආගමක් අදහා මිස වෙන මොනයම් දෙයක් කරලාවත් පරලොව වැඩක් සිඩකරගන්ට බැරිය. එමනිසා සැබෑවූ ආගමක් සොයාගැණීම අප සියල්ලන්ටම යුතුය. රන්රන් බඩු මිළේට ගන්න අය රන්කරුවන් ලවා පරීක්ෂාකරවා ඒවායේ වටිනාකම දැන මිළේට ගණිති. එසේ කරන්නේ ඒ බඩු ගන්නා තැනැත්තාට එයින් අලාභයක් පැමිණේදෝ යන භයින්ය. ඒවාගේම ආගම්වල සත්‍යාසත්‍යභාවය පරීක්ෂාකිරීම පිණිස පළමුකොට පණ්ඩිතයන්ට භාරදීම යුතුය. පුරාණ හිටිය ඉර්ෂිවරයන්වහන්සේලා නම් මහපොළව සමාන විශාලවූ ප්‍රඥාවකින් යුක්තවූ සියලු ලොකයා විසින් ගරුකටයුතුවූ සියලු ශාස්ත්‍රයෙහි කෙළවරට පැමිණියාවූ උත්තමයන්වහන්සේලාය. ඒ උත්තමයන් වහන්සේලාගේ යටිපතුලෙහිතැවරුණාවූ ධූලිල්ලකාට සමානකරන්ට පුළුවන්වූ පණ්ඩිතයෙක් දැනට ලෝකයේ නැත්තේය. එමන්සා උන්වහන්සේලා දැනට ලෝකයේ ජීවත්ව නැති නමුත් උන්වහන්සේලා විසින් කරපු පොත්පත් තවමතිබේ. එබැවින් ඒ පොත්වලින් කොයි ආගම සැබෑදැයි කියා පරීක්ෂාකිරීම යුතුය. පුරාණ ඉර්ෂිවරයන්වහන්සේ

ලා විසින් කරණලද වේද පුරාණ වෛද්‍ය නක්ෂත්‍රාදි නොයෙක් පොත් තිබේ එයින් හගවත් පුරාණය කියන පොත වේදව්‍යාස කියන උත්තම ඉර්ෂින් විසින් කරණලද පොතක්ය. ඒපොත දැනට මාලඟ තිබේ. ඒ පොත වන්න මේ පොතේ මෙලෙස කියාතිබේ.

“අථඃකලෞසංප්‍රවෘත්තෙ සම්මෝහාය සුරද්විෂාම්
බුද්ධෝනාම්නාජිනසුතඃ කීකටෙෂුභවිෂ්‍යති”

මේ පොත කරණලද ව්‍යාස ඉර්ෂින්වහන්සේ ජීවත්වහිටිලා තිබෙන්නේ මේ දැන් පවතින කලියුගයට ප්‍රථම තිබුනු ද්වාපරයුගයේ දීය. ඒ ද්වාපරයුගයේදී ජීවත්ව හිටිය ව්‍යාසඉර්ෂි විසින් කියන්නේනම් කලියුග වර්ෂය පැමිණිකල්හි ගයාසීර්ෂයෙහි බුදුකෙනෙක් පහළවන බවය් බුදුන් බුදුවෙන්ට බොහෝ අවුරුදු දහස්ගණනකට ප්‍රථම බුදුන් කියා ලෝකොත්තම කෙනෙක් පහළවෙන බව මෙබඳු උත්තම යන්පවා කියාතිබේ. මේ හගවත්පුරාණේ කියන මේ පොත බණ පොතක් නොවේය. මේ පොත ඉර්ෂිවාක්‍යයක්ය මෙබඳු උත්තම ඉර්ෂිවාක්‍යවලින් පවා බුදුකෙනෙක් ලෝකයේ පහළවූබව ඔප්පු වේය. “යෙහෝවඃ කියා මැවුන්කාර දෙවියෙක්” වත් “ක්‍රිස්තුස්කියා ගැලවුම්කාර දේවපුත්‍රයෙක්වත්” ලෝකයේ හිටින බවක් මෙබඳු ඍෂිවාක්‍යයකින් තබා පුරාණ මොනයම් පණ්ඩිතවාක්‍යයකින්වත් ඔප්පුකරන්ට බැරිය. ඔය දෙදෙනා ගැණ යමක් ඔප්පුකරණවානම් පුළුවන්කම තිබෙන්නේ මස්කඩවල තිබෙන හරක් එළුවන් මැරූ ගණන ලියාතිබෙන ගනන්පොතක්වැනි හරක් එළු බැටළු කොබෙයි පරෙයි ආදි සතුන් මැරීමේ ගණන ලිවීමෙන්ම පිරීතිබෙන බයිබල්කබල පමණය. මේ බයිබල්කබල “සැබෑ පොතක්ය” කියා දැන් හිටින එරෝපාකාර කොයියම් පණ්ඩිතයෙක්වත් ඒත්තුගන්නේ නැත. බයිබලය හොඳට බලාලා පුරුදු ඒරොපාකාර පණ්ඩිතයෝ පවා ඒත්තුනොගන්නාවූ ක්‍රිස්තියානි ආගම අපරට වාසීන්ට ඒත්තු ගන්ට තිබෙන යුතුකම මොකද? කිසිත් යුතුකමක් නැත්තේය. එමනිසා ක්‍රිස්තියානි ආගම දුරින්ම දුරුකටයුතු.

තවද වෛද්‍යශාස්ත්‍රය වනාහි ලොකයාට කරුණාවෙන් පුරාණ සිටිය ඍෂින් විසින් උපදවාපු ශාස්ත්‍රයක්ය. එම ශාස්ත්‍රයෙන්පවා බුද්ධාගමේ උතුම්කම ප්‍රකාශවේ. නෙකෙසේද—

“පිප්පලීවංශවිභීෂණකෞෂධං ධන්වයාසසහිතංත්‍රිතංපයඃ
භිනත්කාශම්මෙදඃමරංජයෙත් ජාතිදුක්ඛමිව සෞගතාගමං”

**යනාමේ ශ්ලෝකය භෛෂජ්ජ කල්පයෙහි ක්ෂයරෝගචිකිත්සාවේ තිබේ.**

මෙහි අභිප්‍රාය තිප්පිලි වංඇපල බුලු ඉඟුරු කසාකිලියා යන මෙසින් කකාරණලද කසායෙන් පිත්තකාශයද විෂමජ්වරද නැතික රත්නත් කෙසේද කීවොත් සංසාරදුක බුද්ධාගම ඇදහීමෙන් නැතික රත්නාක්මෙනි යනුයි. මෙආදි ශාස්ත්‍රපොත්වල පවා බුද්ධාගමේ උතුම්කම සඳහන්වේ මේ ඇර ජ්‍යොතිශ්ශාස්ත්‍රයද ප්‍රශස්ත ඍෂීන් විසින් කරණලද ශාස්ත්‍රයක්ය ඒ ශාස්ත්‍රයෙන්ද බුද්ධාගමේ සැබෑකම ඔප්පුවේ. කෙසේද—

**කේන්ද්‍රවල ග්‍රහයන් හිටින අන්දමින් පූර්වජාතියද ඒ ජාතියෙහි කලාවූ සුචරිත දුශ්චරිතදෙකද මෙහිදී කරණලද පින්පව්ද කියන්නට පුළුවන ඊට සාක්ෂි :—**

“පුත්‍රාදිත්‍යස්වලග්නජම්මායතෙ ආදිත්‍යභවනෙපඤ්ඤී
මාතෘඝාතපරාජීචොරකුතමුන් පාදෙවපුවේතිරෙ”

යනාදී කියමන්ය. මෙසින්ද ඔප්පුවෙන්නේ යමෙක් උපන් ලග්නයෙහි ශනිද සිංහරාශියෙහි රාහුද සිටියොත් ඔහු පූර්වජාතියේ හිදී මව්මරා අනුන්සතු වස්තුව සොරකම්කොට නරකාදියෙහි සිටි බවය, මෙහිදීද එසේම පව්කොට දෙවනුව රෞරව නරකාදියෙහි උපදින බවය, ඉතින් මේඅන්දමට ඍෂිවාක්‍යවලින්පවා පූර්වජාතියක් තිබුනු බව ඔප්පුවෙන හෙයින් පූර්වජාතියක්ඇතැයිකියන බුද්ධාගම සත්‍යාගමක් බවත් පූර්වජාතියක් නැතකියන ක්‍රිස්තියානි ආගම බොරු ආගමක් බවත් මේ සියල්ලන් විසින්ම දැනගණිත්වා.

තවද දශකුමාරචරිත කාව්‍යදර්ශාදි මහාග්‍රන්ථයන්කලාවූ දණ්ඩි නම් මහාකවිහු විසින් කරණලද කාව්‍යදර්ශයෙහි “සත්‍යමෙවාගුරුසුගතඃ සංස්කාරානචිනස්වරාං” යන්නෙන් සර්වඥයන්වහන්සේ සත්‍යයම වදාළ බව කියාතිබේ. එම ටීකාවෙහි “සර්වඥභගවාදීනාංසෞගතානාංමතෙ” යනාදියෙන් බුද්ධාගමේ ප්‍රශස්ත භාවයද කියනලදී. සර්වඥයන්වහන්සේගේ දේශනාවේ තිබෙන සත්‍යකම මේආදි අනන්ත කාරණාවලින් ඔප්පුවේ. එමනිසා බුද්ධාගම ඒකාන්ත සත්‍යවූ ආගමක් වන්නේය. එබැවින් ක්‍රිස්තියානි ආගම අත්හරින්නටත් සුබවූ ඒකාන්ත සත්‍යවූ බුද්ධාගම පිළිගන්නටත් මෙහි දැක්වූ කාරණා ඇතැයි කියා සිතමි.

තවද මේ පාදිලිතැන "නැව් යාත්‍රාකරන්නන්ට කිසිකලකවත් මහමෙර දකින්ට නොලැබුනු නිසා එබඳු පර්වතයක් නැතැ''යි කීවා මම් කාටත් ඇසෙන්ට ඇත දකින්ට නොලැබුනාදේ නැතැයි කීම පණ්ඩිතගෝචර කියමනක්නම් කිසිවෙක් කිසිකලක නුදුටු තහනම් ගහත් නැතැයි කීම යුතුය. බොහෝදුරට කාරණා සොයන ඉංග්‍රීසි කාරයෝවත් තහනම්ගහ තිබෙන තැන සොයාලා දැනගත්තාද? නැත්තේමය. එමනිසා මේ පාදිලිතැන මහමෙර නැතිබව ඔප්පු කරන්ට ගෙණහැරදැක්වූ කාරණා නිෂ්ඵල බව දෙවනුත් මේසියල්ලන් විසින් දැනගණිත්වා. මීට ඉහත මාවිසින් කලාවූ කථාවලදී "ආත්මය, ප්‍රාණය,'' කියා ව්‍යවහාරයක් කලානම් ඒ ව්‍යවහාරය දැනට පවතින සම්මතයට එකඟකොට කලබවත් මේ සියල්ලන් විසින්ම දැනගණිත්වා (කියා ඉත්පසු) යහපතක් දුටුතැන එය තදින් අල්ලාගැණීම නුවනැත්තන්ගේ චාරිත්‍රධර්මයක් නිසා සැබෑවූ බුද්ධාගම පිළිගෙණ සසරදුකින් මිදී උතුම්වූ නිර්වාණසම්පත් සිද්ධකරගැණීමට සියල්ලන් විසින් උත්සාහ කටයුතුය. (කියා මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේගේ අන්තිම පැයේ කථාව අන්තිමවන්ට යෙදුනාඇත) එකල එනි රැස්වසිටිය දසදහසක් පමණ සේනාවෙන් ටිකදෙනෙක් හැර බුද්ධපක්ෂයෙහිද ක්‍රිස්තියානි පක්ෂයෙහිද රැස්වසිටිය දෙසෙනග අතරෙන් මහත් ලොකු සාධුකාර ශබ්දයක් පැවැත්වූවාය. ඊට ක්‍රිස්තියානිකාර සමහරදෙනෙක් කෝපවූ බවද පෙණුනි. නමුත් ඒ ගැණ කිසිම කොලාහලයක් වුනේ නැත. ඒ කොලාහලය වේගණ යන අතර බුද්ධපක්ෂයට කථාකල මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේ විසින් ඒ සමූහයා දෙස බලා "සියල්ලම නිශ්ශබ්දවියයුතුය"යි කියනවා සමගම ඒ මහත් සමූහයාගේ චංචලභාවය නැතිවූනා සතකාකය. ඉත්පසු බුද්ධාගම්කාර සමූහයා මහත් ප්‍රීතියකින්ද ක්‍රිස්තියානිකාරයෝ මහත් දොම්නසකින්ද විසිරගියෝය.)

(නිමි.)